ධර්මදානය පිණිස යි.

## විස්තර සහිත

# අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය




කොළඹ දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිපතිව වැඩවිසූ

**ආචාර්ය අරංගල සිරිධම්ම**

ස්වාමීන්ද්‍රෝත්තමයාණන් වහන්සේගේ ශිෂ්‍යවූ

සොරණාතොට අභිධම්මාචරිය

**සද්ධම්මපාල රත්නායක දසසිල් උපාසක තැන**

විසින් සම්පාදිතයි.

විස්තර සහිත

# අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය.

කොළඹ දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිපතිව වැඩවිසූ
ආචාර්ය්‍ය අරංගල සිරිධම්ම
ස්වාමීන්ද්‍රතුමාණන් වහන්සේගේ ශිෂ්‍යවූ
සෝරණාතොට අභිධම්මාචරීය
සද්ධම්මපාල රත්නායක දසසිල් උපාසක තැන
විසින් සම්පාදිතයි

මැදවෙල ජිනජාතිකාරාමාධිපති සිරිසද්ධම්මවාචිස්සර
ගුණරතනාභිධාන
බදුල්ලේ ගුණානන්ද මහාස්ථවිරපාදයාණන්
වහන්සේ විසින්
සමාදරයෙන් ප්‍රතිගෘහිතයි.

සීමං සහිත පෙරමුණ යන්ත්‍රාලයයේ
මුද්‍රාපිතයි.

ශ්‍රී: බු: ව: 2493
ක්‍රි: ව: 1949

මිල රු. 2-00

නැවත සංරක්ෂණය : වප්/2559 ( 2015 ඔක්තෝබර් )

## සංරක්ෂණය සහ ධර්මදානය

පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත මහතා සහ උපේක්ෂා පියරංගිකා
මහත්මිය විසින් අභාවප්‍රාප්ත පියාණන් දෙපල වන
S. D. සෝමපාල මහතා සහ P. A. පියසේන මහතා ඇතුළු
ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් කල්‍යාණමිත්‍රයන්
වහන්සේලාට හා මෑණියන් දෙපලට සෙත් පැතීම පිණිස
මෙන් ම තමන්ට ධර්මාවබෝධය පිණිසත්
මෙම ධර්මදානය සිදු කරන ලදී.

සැ.යු.

සොරණාතොට අභිධම්මාචරිය සද්ධම්මපාල රත්නායක දසසිල් උපාසක මහතාණන් විසින් සම්පාදිත 'විස්තර සහිත අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය' නම් වූ මෙම ධර්මග්‍රන්ථයෙහි ඇති දුර්ලභ බව සහ වටිනාකම සලකමින් ධර්මදානය සඳහා පමණක් කතෘ අවසරය රහිත ව අප විසින් මෙය සංරක්ෂණය කරන්නට යෙදුණු අතර (පිටපත් 45) කතෘ වෙනුවෙන් යම්කිසි පාර්ශවයකට අලාභයක් සිදු වී ඇතිනම් මේ සඳහා අලාභ ගෙවීමට අප සූදානම් බව දන්වා සිටිමු.

පුණ්‍ය ශ්‍රී තුෂන්ත
ශ්‍රී සද්ධර්ම මන්දිරය
134/A, ගලගෙදර වත්ත,
වැල්හේන පාර, මාතම්මන,
මිනුවන්ගොඩ.
දුර. 071-4417813
වෙබ් අඩවිය :www.sadaham.net

# සංඥාපනය

සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ විසින් තව්තිසා දෙව්ලොව පණ්ඩුකම්බල ශෛලාසන මතුයෙහි වැඩහිඳ මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ දෙවියන්ට දේශනාකර වදාරණ ලද්දාවූ ධම්ම සඞ්ගණී ආදී සප්ත ප්‍රකරණයන්හි නානා නයින් විභාග කොට දක්වන ලද නාමරූප ධර්මයන් තික දුක මාතෘකා වශයෙන් රැගෙන දක්වන ලද දෙසිය සැට පදයෝ අභිධම්ම මාතිකා නම් වෙත්. ඒ මේ මාතිකා පදයන් සමග දම් සෙනෙවි ශැරියුත් මහා ස්ථවිර පාදයාණන් වහන්සේ විසින් තබනලද දෙසාළිස් දුකයන්ගේ සුවාසූ පද සඞ්ඛ්‍යාත සුත්තන්ත මාතිකා පදයන්වත් පදගතාර්ථ හා අභිධෙයාර්ථ දක්වමින් ඒ අභිධෙයාර්ථ සඞ්ඛ්‍යාත ස්වරූපාර්ථයන්ගේ ස්කන්ධ ආයතන ධාතු සත්‍ය භේද වෙන්කොට දක්වන මේ ග්‍රන්ථය අභිධම්ම මාතිකා පාළි ව්‍යාඛ්‍යාණ යන නමින් හඳුන්වනු ලැබේ.

ත්‍රිපිටක විභාග පවත්වන මේ කාලයේ මහා විහාර පරම්පරා-ගතව අවිච්ඡින්නව පැවත එන්නාවූ වාචනාමාර්ගය උල්ලඞ්ඝණය නොකොට සම්පාදිත මෙබඳු ප්‍රකරණයක් තිවරදි ලෙස මුද්‍රණය කොට නොමැති නිසා ආධුනික ආභිධම්මිකයින්ට මහත් පාඩුවක් වී තිබෙනු දැක මෙය සම්පාදනය කෙළෙමු.

මෙහි ප්‍රාරම්භය— තික මාතිකාවන්ගේ විස්තර බෙදීම හෙතුගොච්ඡක ආදි දුක මාතිකාවන්ගේ අර්ථ සහිත විස්තර විභාග, ඒ ඒ ගොච්ඡකාවසාන දුකයෙහි බොපනයන අතිකාර්ථ පදයෙන් ලැබිය හැකි සම්භව දුකයන්ගේ විස්තර විභාග, සුත්තන්ත මාතිකාව තැබීමට හේතුව සමග ඒ මාතිකා දුකයන්ගේ අර්ථ සහිත විස්තර විභාග හා ඒ සුත්තන්ත මාතිකා පදයන්ගේ නිර්වචන ඇතුළත් කොට අවසානයෙහි තික, දුක මාතිකාවන් පිළිබඳව අර්ථසාලිනී අර්ථකථා මූලටීකා අනුටීකාවන්හි දැක්වෙන සංක්ෂිප්ත ගණ්ඨි පද විවරණයක්ද ඇතුළත්කොට සම්පාදනය කෙළෙමු.

මෙසේ සම්පාදිත ග්‍රන්ථයක් පරිශීලනය කිරීමෙන් මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ පටන් මේ දක්වා වාචනාමාර්ගය නොඉක්මවා පරම්පරාගත ගුරු මුෂ්ටි සහිතව උගෙණීම පහසුවන බැවින් ද මෙසේ උගත් ආභිධම්මිකයෝ කල්‍යාණ පෘථජ්ජන භාවයට හා චූල සෝතාපන්න යන නම ලැබීමට හේතු වන බැවිනුත් ලිහිල් බසින් මෙසේ සකස් කරන්ට සිත් විය.

මෙලෙසින් සකස් කළ මේ ග්‍රන්ථය පුරුදු පුහුණු කිරීමෙන් යටකී පරිදි කල්‍යාණ ප්‍රථජ්ජන භාවය හා චූල සෝතාපන්න යන නාමය ලබනු පමණක් නොව අනාදිමත් සංසාරයෙහි චිරකාලයක් ගත නොකොට නිවන් නමැති මහා සමුද්‍රය කරා බැස යන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග සඞ්ඛ්‍යාත ශ්‍රොතයට බැස එකබීජ, කොලංකොල සත්තක්ඛත්තු පරම සඞ්ඛ්‍යාත ත්‍රිවිධ සෝවාන් පුද්ගලයන්ගේ සඞ්ඛ්‍යාවට ඇතුල්ව ආර්‍ය්‍ය ගොත්‍රය ලැබ සඋපදිසෙස නිර්වාණ ධාතුවෙන් අමාමහනිවන් සුව අත්පත් කරගැනීම පවා පුවසේ කළ හැක්කේය. එහෙයින් මන්දෝත්සාහී නොව මේ ග්‍රන්ථය උද්ග්‍රහණය ධාරණය කිරීමෙහි නොපසුබට වීර්‍ය්‍ය උපදවත්වා. එ පමණකුදු නොව මේ ග්‍රන්ථය හුගත් තැනැත්තවුන්ට ධාතු කථා ප්‍රකරණ ආදි සෙසු අභිධර්ම ප්‍රකරණයන් උගෙනීම නොකළ හැකි බැවින් ද මෙය උගෙනීමට උත්සාහ වඩත්වා.

මෙබඳු ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට ශක්තිය ලබා දුන් නොහොත් පරමාර්ථ ධර්ම ඥානය ඇතිකර ගැනීමට සිත පොළඹවනලද බඳුල්ලේ අළුත්වෙලගම සුමඞ්ගලාරාමාධිපතිව වැඩවිසූ දිවංගතවිවදුළු ධම්මාලංකාර ස්වාමිපාදයාණන් වහන්සේ ඇතුළු මයිලගස්තැන්නේ වලව්වේ විසූ නැසීගිය වික්ටෝරියා දිසානායක ජූලියානා වීරකෝන් යන මැතිණිවරුන් සමග සොපායා වීරකෝන් මැතිණියද අසමදුවාර්‍ය්‍ය ස්වාමීන්ද්‍රයාණන් වහන්සේට අප අදුන්වාදී භාර කළ යටකී වලව්වේ නිවැසි ඇස්. බී. දිසානායක වෙද මහතාද, මහා විශුද්ධාරාමයට පැමිණි තැන් පටන් පිඩුසිගා ගෙනැවිත් අප පොෂණය කරමින් අභිධර්මාර්ථ සංග්‍රහ මාතෘකා ධාතුකථා යමක ආදී අභිධර්ම ප්‍රකරණයන් සමග ශබ්ද ශාස්ත්‍රය සම්බන්ධී බාලාවතාර ආදි ප්‍රකරණයන් කට පාඩම් කරවූ මහා විශුද්ධාරාම නිවැසි ස්වාමිපාදයාණන් වහන්සේලාද කෘතඥතා වශයෙන් පිංදීමෙන් සිහිපත් කරම්හ. එසේම යථොක්ත ප්‍රකරණයන්හි ඇති ගැටළුතැන් මුදා හරිමින් සුබාවබෝධය ඇති කරවූ දිවංගතවී වදුල දෙමටගොඩ මහා විශුද්ධාරාමාධිපතීන් වහන්සේ ප්‍රමුඛ බුරුම රට මණ්ඩලේ නුවර මහා විශුද්ධාරාමාධිපතිව වැඩවිසූ පරියත්ති සාසනහිත ධම්මාචරිය අග්ග මහා පණ්ඩිත භදන්ත අග්ගධම්මාභිවංස නායක ස්වාමීන්ද්‍රෝත්තමයාණන් වහන්සේ, දැනට මහා විශුද්ධාරාම පරිවෙණාධිපති දෙවිනුවර ඤාණාවාස මහා ස්ථවිර පාදයාණන් වහන්සේ, පොකුණුවිට ශ්‍රී විණයාලංකාර පරිවෙණාධිපති රේරුකානේ චන්දවිමල මහාස්ථවිර පාදයාණන් වහන්සේ, පණ්ඩිත කුළුපණ ධම්මරතන පඬිතුමා, යන ආචාරීන් වහන්සේලාද දෙහොත් මුදුන් දී ගුණානුස්මරණයෙන් පුකතව ප්‍රාප්තිඥනය කරම්හ.

එසේම මෙ පොත ලියා දීමෙන් අපට උපසථම්භකවූ කොරණෑතොට වැලිහිඳ පුලිනතලාරාමවාසී කපිලගොඩ පඤ්ඤා-ලොක ස්වාමීන් වහන්සේ, කිතුල්වත්තේ ඈම්. ඈම්. පුංචිබණ්ඩාර මහතා, ආර්. ඈම්. විනීතා කුමරිය සහ තොලබෝවත්තේ රජයේ පාසැලේ උපාධ්‍යායිනී දෙපල යන සැදැහැති පින්වතුන්ද කළ ගුණ මෙනෙහි කිරීමෙන් ශුභකාමව පිංදීමෙන් දිගාසිරි පතම්හ.

පරියාප්ති ශාසනය ධරා සිටීම සඳහා අප විසින් ගන්නා ලද මේ ප්‍රයත්න සංඛ්‍යාත කාය වාක් මනෝමයවූ කුශලසකන්ධයන් යටකී පිංවතුන් සමග ජාති ආඥු විෂයක්‍ෂෙත්‍ර සඞ්ඛ්‍යාත ත්‍රිවිධ සක්වල වසන දෙවියන් සහිතවූ අපගේ මව් පිය ගුරුවර නෑ මිතුරු හිත අහිත සව්සතුන් වෙත ද සමාදරයෙන් අනුමෝදන් කරවන් නෙමු. සියල්ලෝම නිදුක්ව නිරෝගිව නිවන් සිරි විඳිනය කෙරෙත්වා.

**ග්‍රන්ථ හැඳින්වීම.**

වර්ෂ 1923 ක්වූ ජනවාරි මස 1 වෙනි දිනට පැමිණි ශ්‍රී: බු: ව: 2466 වැන්නෙහි දුරුතු මස පුර පසළොස්වකලත් අඟහරුවාද යටකී මහා විශුද්ධාරාමයේදී ලබන ලද උපාධි නාම සංදර්ශිත සතුති පූජිත සහතික පත්‍රය මෙහිලා පැවසීම වටනේයයි සලකා හෙද මෙහි ඇතුළත් කරම්හ.

> සිරිසඝබුද්ධවස්සෙ ඡස්සට්ඨිචතුස්සතාධිකද්විසහස්සමිතෙ
> ඵුස්සමාසස්ස සුක්කපක්ඛ පන්නරසියං අඞ්ගාරවාරෙ
> කොළම්බ නගරෙ දෙමටගොඩ මහා විශුද්ධාරාමෙ
> දීයතෙ සාහත්ථික ථුතිපණ්ණමිදන්ති.

උභවදිස්සායං "වියලුව" පපදෙසෙ කොරණ්ණතොට කිතුල්වත්ත ගාමජො ඇස්. බී රත්නායක නාමිකො දසසීලරක්ඛිත උපාසකො ඉතො කතිපය වස්සානමුපරි කොළම්බ නගරෙ දෙමට ගොඩ මහා විශුද්ධාරාමාධිපති ගණාචරිය සිරිධම්ම මහාථෙරපාදං නිස්සාය තස්ස න්තිකෙ යෙව සද්ධාසම්පන්න සහිතං අභිධම්මප්පකරණං සාධුකමුග්ගණ්හිත්වා කොළම්බ නගරෙ පරියත්ති ධම්මකිතසමිති මග්ගෙන අමෙහි උපපරික්ඛිත අජ්ඣයනපරික්ඛාය යඤ්ඤව සම්පන්නො හෝසි. අමෙහහිව තස්මිං නිවුඪකාලෙ අම්හාකම්පි සන්තිකා ධාතුකථං යමකාදිඅභිධම්මප්පකරණඤ්ච සාධුකමුග්ගණ්හි කොළම්බ වාසි නානඤ්ච සඞ්ඝාවතං තපස්සීසානං අභිධම්මුග්ගාහකානං උපාසකො පාසිකානං අමෙහි උපපරික්ඛිත අජ්ඣයනපරික්ඛාය සාධුකං සම්පන්නභාවෙනච දීඝො. සීලාචාර සම්පන්නො සද්ධො

පසාදවාචකොති තසමා තසස එවමාදි ගුණසමපනනසස “අභිධම්මාචරිය සද්ධම්මපාල රත්නායක” ඉති ගුණ නාමං සුසම්මතං සාසනවුඩ්ඪිකාමෙනාති.

දින්නමිදං ථුති පුබ්බක ගුණ නාමං

මයං මරම්මරට්ඨෙ මන්තලෙ නගරෙ මහාවිසුද්ධාරාම වාසිනා
පරියත්ති සාසනහිත ධම්මාචරිය භදන්ත
අග්ගධම්මාභිවංස ථෙරෙනාභිදයාබ්ධං.
අස්සන (බුරුම අකුරෙනි)

මෙබඳු බැරෑරුම් ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේදි සදොස් තැන් නැතැයි නො කියමු. දෙ ඇස් අඳුවූ අප කෙරෙහි අනුකම්පාවෙන් එබඳු තැන් පෙන්වා දුනහොත් නැවත මුද්‍රණය කරවීමේදී ඇතුළත් කරන බව පඬි උතුමන් වෙත ගෞරවයෙන් මතක් කරමින් ඌවේ මිරගවත්තේ පුෂ්පාරාමාධිපතිව වැඩවිසූ පරලෝසැපත් විමලසාර ස්වාමිපාදයාණන් වහන්සේගේ විස්තර සන්නය අපේ මේ ව්‍යාපාරයට මහෝපකාරීවූ බැව් ද සඳහන් කරම්හ. මෙය නැවත මුද්‍රණය කරවීමේ අයිතිවාසිකම අප වෙතම තබා ගනිමු.

මීට-සාසනසිද්ධිකාමී,

සොරණාතොට අභිධම්මාචරිය සද්ධම්මපාල
ඇස්. බී. රත්නායක දසසිල් උපාසක තැන

කිතුල්වත්ත,
සොරණාතොට-බදුල්ල.

28. 10. 49

# පිළිගැණීම

---

සොරණාතොට අභිධම්මාචරිය සද්ධම්මපාල රත්නායක දහසිල් උපාසක තැන විසින් සම්පාදිත මෙම අභිධර්ම මාතෘකා ව්‍යාඛ්‍යාණය අප විසිනුදු කියවා බැලුවෙමු.

එහි මහා විහාර පරම්පරාගතව අවිච්ඡින්නව පැවත එන වාචනා මාර්ගය උල්ලඞ්ඝණය නොකර තිබීම අපේ සන්තුෂ්ටියට හේතු ජනක බව නොමසුරුව ප්‍රකාශ කරන්ට බැලූ ප්‍රමාණයෙන් වැටහින. මෙය සර්වනිර්දෝෂයයි නොකියමු. නමුත් අර්ථරසයට හා ධර්මරසයට පාඩුවක් නැත. දෙ ඇස් අඳුවූ මේ උපාසක තැන විසින් වාචනා මාර්ගයම කටපාඩමින් උද්ග්‍රහණයකොට අනුන් ලවා ලියවමින් කියවමින් සම්පාදිත කෘතියක් බැවින් නොයෙක් තැන ලිඛිත දෝෂාදිය ඇතිවීම පුදුමයක්ද නොවේ. බුද්ධශාසන මහා ශූර සේනාපති යන රාජදත්තිය නාමොපලක්ෂිත ඇම්. ධර්මරත්න පඬිතුමන් වෙතින් අභිධර්මෝද්ග්‍රහණය කරණලද අපිදු මේ මාතෘකා පාළිය පිළිබඳ උද්ග්‍රහණය මෙලෙසින්ම කළ බැවි මෙහිලා පවසන්ටවීම අපගේ ආචාර්යෝත්තමයාණන් කෘතඥතා මුඛයෙන් අනුස්මරණය වන්නකි. මෙය මෙලෙසින් උද්ග්‍රහණය ධාරණය කරණ ආධුනිකයන් චූල සෝතාපන්න යන අන්වර්ථ නාමයට හිමිවන බැවි අභිධර්ම අටුවා වලින් දක්නට ලැබෙන බැවින් ආධුනික සියල්ලෝම මෙය පරිශීලනය කිරීමෙහි ප්‍රෝත්සාහි වෙත්වායි ආශිංසනාය කරම්හ.

මීට, මැදවෙල ජිනජෝතිකාරාමාධිපති
බඳුල්ලේ ගුණානන්ද මහාස්ථවිර වම්හ.

(අත්සන් කළේ) ඉංග්‍රීසි අකුරෙන්
බි. ගුණානන්ද මහා ථෙරො

29 9 49
ජිනජෝතිකාරාමය,
මැදවෙල.

# පටුන


| පිට | පෙළ | |
|---|---|---|
| 1 | | තිකමාතිකා පාළි |
| 2 | 35 | දුකමාතිකා පාළි |
| 9 | 9 | සුත්තන්තමාතිකා පාළි |
| 12 | 1 | ආරම්භ කථා |
| 14 | 11 | කුසල ත්‍රික විභාගසන්නය |
| 17 | 35 | වේදනා ත්‍රික විභාගසන්නය |
| 20 | 26 | විපාක ත්‍රික විභාගසන්නය |
| 23 | 15 | උපාදිණ්ණ ත්‍රික විභාගසන්නය |
| 26 | 35 | සඞ්කිලිට්ඨ ත්‍රික විභාගසන්නය |
| 28 | 18 | විතක්ක ත්‍රික විභාගසන්නය |
| 32 | 1 | ප්‍රීති ත්‍රික විභාගසන්නය |
| 33 | 6 | දස්සන ත්‍රික විභාගසන්නය |
| 34 | 31 | දස්සනහේතු ත්‍රික විභාගසන්නය |
| 35 | 32 | ආචයගාමි ත්‍රික විභාගසන්නය |
| 36 | 25 | සෙක්ඛ ත්‍රික විභාගසන්නය |
| 37 | 12 | පරිත්ත ත්‍රික විභාගසන්නය |
| 37 | 33 | පරිත්තාරම්මණ ත්‍රික විභාගසන්නය |
| 40 | 15 | හීන ත්‍රික විභාගසන්නය |
| 40 | 23 | මිච්ඡත්ත ත්‍රික විභාගසන්නය |
| 41 | 30 | මග්ගාරම්මණ ත්‍රික විභාගසන්නය |
| 44 | 30 | උප්පන්න ත්‍රික විභාගසන්නය |
| 45 | 21 | අතීත ත්‍රික විභාගසන්නය |
| 46 | 6 | අතීතාරම්මණ ත්‍රික විභාගසන්නය |
| 47 | 21 | අජ්ඣත්ත ත්‍රික විභාගසන්නය |
| 48 | 9 | අජ්ඣත්තාරම්මණ ත්‍රික විභාගසන්නය |
| 49 | 14 | සනිදස්සන ත්‍රික විභාගසන්නය |
| 50 | 7 | ත්‍රිකමාතිකාපකිණ්ණක විභාගය |
| 50 | 11 | දුකමාතිකා විභාගාරම්භය |
| 50 | 17 | හේතුගොච්ඡක විභාගසන්නය |
| 55 | 26 | චූලන්තරදුක විභාගසන්නය |
| 58 | 20 | ආසවගොච්ඡක විභාගසන්නය |
| 64 | 20 | සඤ්ඤොජනගොච්ඡක විභාගසන්නය |
| 69 | 16 | ගන්ථගොච්ඡක විභාගසන්නය |
| 73 | 9 | ඕඝගොච්ඡක විභාගසන්නය |
| 74 | 21 | යොගගොච්ඡක විභාගසන්නය |
| 75 | 11 | නීවරණගොච්ඡක විභාගසන්නය |
| 77 | 5 | පරාමාසගොච්ඡක විභාගසන්නය |
| 78 | 31 | මහන්තරදුක විභාගසන්නය |
| 81 | 27 | උපාදාන ගොච්ඡක විභාගසන්නය |
| 84 | 7 | කිලෙසගොච්ඡක විභාගසන්නය |
| 86 | 16 | පිට්ඨිදුක විභාගසන්නය |
| 91 | 29 | සුත්තන්තමාතිකා විභාගසන්නය |
| 104 | 1 | මාතිකා විවරණය |

# ශුද්ධි පත්‍රය

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 12 | 8 | සන්තිසිනෙනා | සන්තිසිතෙනං |
| 12 | 14 | සද්ධම්මටස්ස | සද්ධම්මංවස්ස |
| 12 | 19 | වැද | වැද |
| 14 | 28 | විඤ්ඤුක්ඛන්ධ | විඤ්ඤුනසක්ඛන්ධ |
| 15 | 24 | විසි | විසි |
| 16 | 19 | සතතතිරූප | සනතතිරූප |
| 16 | 24 | ඝාණා | ඝාණ |
| 16 | 33 | පඤ්ඤිචාරා | පඤ්ඤවචාරු |
| 17 | 2 | සන්තිති | සනනති |
| 17 | 26 | එලාවෙච | එලාවෙච |
| 18 | 11 | සතති | සනති |
| 18 | 13 | සතතී | සනතී |
| 18 | 15 | අභිද්‍යොධයාණී | අභිධෙයාංණී |
| 19 | 6 | දුඃකඛායා | දුකඛායා |
| 19 | 6 | පාදයාගේ | පදයාගේ |
| 19 | 17 | දුඃඛ | දුකඛ |
| 19 | 20 | දුඃඛ | දුකඛ |
| 19 | 23 | දුඃඛ | දුකඛ |
| 19 | 24 | දුඃඛ | දුකඛ |
| 19 | 26 | අදුඃඛ | අදුකඛ |
| 20 | 1 | මනායතන | මනායතන |
| 21 | 14 | මනායතන | මනායතන |
| 23 | 26 | සංවිජ්ජතති | සංවිජ්ජනති |
| 23 | 30 | – එම – | – එම – |
| 23 | 34 | – එම – | – එම – |
| 23 | 34 | උපදිංනනත්‍රික | උපාදිණණත්‍රික |
| 24 | 30 | වැදෑරුම් | වැදෑරුම් |
| 27 | 3 | පාදයාගේ | පදයාගේ |
| 27 | 33 | දෙතිස | දෙසිත |
| 39 | 32 | ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත් | ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත් |
| 39 | 38 | දුකඛසත්‍ය නම් | දුකඛසත්‍ය නම් |
| 42 | 11 | කුසලාභිඥමය | කුසලාභිඥවය |
| 42 | 18 | මාගීයට | මාගීයම |

| | | | |
|---|---|---|---|
| 49 | 26 | සඛ්‍යාත | සංඛ්‍යාත |
| 49 | 31 | යත් | යතන |
| 49 | 32 | සඛ්‍යාත | සංඛ්‍යාත |
| 50 | 13 | ගන්ථගොච්ඡකය | ගන්ථ ගොච්ඡකය |
| 50 | 18 | හෙතුසහෙකදුකය | හෙතුසහෙතුකදුකය |
| 51 | 37 | පුද්ගලධ්‍යාය | පුද්ගලධ්‍යාශය |
| 59 | 31 | හෙම | චෙඣ |
| 63 | 13 | සතවිසි | සත්තවිසි |
| 67 | 4 | සඞෙඛදුජන ං | සඞෙඛදුජනා |
| 69 | 26 | ග්‍රන්ථදුකයසි | ග්‍රන්ථදුකයසි |
| 72 | 12 | ගන්ථසම්පයුත්තා | ගන්ථසම්පයුත්තාපි |
| 73 | 3 | කුකකුච | කුකකුච්ච |
| 73 | 10 | යකයද | යද |
| 75 | 12 | දුකදින්ගේ | දුකාදින්ගේ |
| 78 | 1 | පරමාස | පරාමාස |
| 78 | 20 | පරාමසා | පරාමාසා |
| 82 | 22 | උපාදනා | උපාදාන |
| 85 | 3 | නොවි | නොව |
| 88 | 13 | විතක්කා | විතක්ක |
| 89 | 33 | අරූපාවචරු | අරූපාවචර |
| 93 | 2 | සුගයසි | සුගමසි |
| 93 | 5 | සන්ති | සනාති |
| 95 | 21 | පුබ්බනතානු | පුබ්බන්තානු |
| 96 | 7 | ධම්මයෙක් ද | ධර්මයෙක් ද |
| 96 | 14 | ඇලුම් | ඇළුම් |
| 96 | 15 | මූලුක | මූලික |
| 96 | 15 | සත්සම්ප්‍රයුක්ත | තත්සම්ප්‍රයුක්ත |
| 98 | 9 | මජ්ජවෝච | මජ්ජවෝච |
| 98 | 12 | දට්ඨිජ්ජුකතං | දිට්ඨිජ්ජුකතා |
| 98 | 27 | ඇත්තාහුතේ | ඇත්තාහුගේ |
| 100 | 34 | සමෘධිය | සමාධිය |
| 103 | 26 | කායුපපත්තා | කායූපපත්තා |
| 103 | 29 | ධම්මමනුත්තාර | ධම්මමනුත්තරං |
| 105 | 30 | ආසවාදි | ආසවාද |
| 106 | 15 | පණණස | පණ්ණ ස |
| 106 | 30 | දසසනත්වං | දසසනත්ථං |
| 107 | 15 | පදසමූහය | පදසමූහය |

| | | | |
|---|---|---|---|
| 108 | 34 | ධමමසඞග | ධමමසඞගණී |
| 113 | 25 | ධර්මයත් | ධර්මයන් |
| 114 | 27 | සෙත | සත |
| 119 | 27 | වදයන් | වංදයන් |
| 121 | 5 | නකංකාරය | නකාරය |
| 124 | 12 | භාඝීනො | භාගිනො |
| 124 | 39 | උපපවජ්ත | උපපජ්ජන |
| 125 | 15 | පාපමිත්තත්ා | පාපමිතතතා |
| 126 | 30 | සමතතනීා | සමතතානි |

# අභිධමමමාතිකා පාළි

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස**

1 කුසලා ධමමා
අකුසලා ධමමා
අව්‍යාකතා ධමමා
2 සුඛාය වෙදනාය සමපයුතතා ධමමා
දුකඛාය වෙදනාය සමපයුතතා ධමමා
අදුකඛමසුඛාය වෙදනාය සමපයුතතා ධමමා
3 විපාකා ධමමා
විපාක ධමම ධමමා
නෙව විපාක න විපාක ධමම ධමමා
4 උපාදිනනු'පාදානියා ධමමා
අනුපාදිනනු'පාදානියා ධමමා
අනුපාදිනන අනුපාදානියා ධමමා
5 සංකිලිට්ඨ සංකිලෙසිකා ධමමා
අසංකිලිට්ඨ සංකිලෙසිකා ධමමා
අසංකිලිට්ඨ අසංකිලෙසිකා ධමමා
6 සවිතකකසවිචාරා ධමමා
අවිතකක විචාරමතතා ධමමා
අවිතකක අවිචාරා ධමමා
7 පීතිසහගතා ධමමා
සුඛ සහගතා ධමමා
උපෙකඛා සහගතා ධමමා
8 දසසනෙන පහාතබබා ධමමා
භාවනාය පහාතබබා ධමමා
නෙව දසසනෙන න භාවනාය පහාතබබා ධමමා
9 දසසනෙන පහාතබබ හෙතුකා ධමමා
භාවනාය පහාතබබ හෙතුකා ධමමා
නෙව දසසනෙන න භාවනාය පහාතබබ හෙතුකා ධමමා
10 ආචයගාමිනො ධමමා
අපචයගාමිනො ධමමා
නෙවාචයගාමිනො න අපචයගාමිනො ධමමා
11 සෙකඛා ධමමා
අසෙකඛා ධමමා
නෙවසෙකඛා නාසෙකඛා ධමමා

12 පරිත්තා ධම්මා
මහග්ගතා ධම්මා
අප්පමාණා ධම්මා

13 පරිත්තාරම්මණා ධම්මා
මහග්ගතාරම්මණා ධම්මා
අප්පමාණාරම්මණා ධම්මා

14 හීනා ධම්මා
මජ්ඣිමා ධම්මා
පණීතා ධම්මා

15 මිච්ඡත්ත නියතා ධම්මා
සම්මත්ත නියතා ධම්මා
අනියතා ධම්මා

16 මග්ගාරම්මණා ධම්මා
මග්ග හෙතුකා ධම්මා
මග්ගාධිපතිනො ධම්මා

17 උප්පන්නා ධම්මා
අනුප්පන්නා ධම්මා
උප්පාදිනො ධම්මා

18 අතීතා ධම්මා
අනාගතා ධම්මා
පච්චුප්පන්නා ධම්මා

19 අතීතාරම්මණා ධම්මා
අනාගතාරම්මණා ධම්මා
පච්චුප්පන්නාරම්මණා ධම්මා

20 අජ්ඣත්තා ධම්මා
බහිද්ධා ධම්මා
අජ්ඣත්ත බහිද්ධා ධම්මා

21 අජ්ඣත්තාරම්මණා ධම්මා
බහිද්ධාරම්මණා ධම්මා
අජ්ඣත්ත බහිද්ධාරම්මණා ධම්මා

22 සනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන සප්පටිඝා ධම්මා
අනිදස්සන අප්පටිඝා ධම්මා

තිකමාතිකා නිට්ඨිතා.

1 හෙතු ධම්මා
නහෙතු ධම්මා

2 සහෙතුකා ධම්මා
අහෙතුකා ධම්මා

3 හෙතු සම්පයුත්තා ධම්මා
හෙතු විප්පයුත්තා ධම්මා

4 හෙතුචෙව ධම්මා– සහෙතුකාච
සහෙතුකාචෙව ධම්මා– නචහෙතු

5 හෙතුචෙව ධම්මා– හෙතු සම්පයුත්තාච
හෙතු සම්පයුත්තාචෙව ධම්මා– නචහෙතු

6 නහෙතුඛො පන ධම්මා– සහෙතුකාපි
,, – අහෙතුකාපි

## හෙතු ගොච්ඡකං

7 සප්පච්චයා ධම්මා
අප්පච්චයා ධම්මා

8 සඞ්ඛතා ධම්මා
අසඞ්ඛතා ධම්මා

9 සනිදස්සනා ධම්මා
අනිදස්සනා ධම්මා

10 සප්පටිඝා ධම්මා
අප්පටිඝා ධම්මා

11 රූපිනො ධම්මා
අරූපිනො ධම්මා

12 ලොකියා ධම්මා
ලොකුත්තරා ධම්මා

13 කෙනචිවිඤ්ඤෙය්‍යා ධම්මා
කෙනචිනවිඤ්ඤෙය්‍යා ධම්මා

## චූලන්තර දුකං

14 ආසවා ධම්මා
නොආසවා ධම්මා

15 සාසවා ධම්මා
අනාසවා ධම්මා

16 ආසව සම්පයුත්තා ධම්මා
ආසව විප්පයුත්තා ධම්මා

17 ආසවාචෙව ධම්මා – සාසවාච
සාසවාචෙව ධම්මා – නොච ආසවා

18 ආසවාචෙව ධම්මා – ආසව සම්පයුත්තාච
ආසව සම්පයුත්තාචෙව ධම්මා – නොච ආසවා

19 ආසව විප්පයුත්තා ඛොපන ධම්මා – සාසවාපි
,, – අනාසවාපි

### ආසවගොච්ඡකං

20 සඤ්ඤොජනා ධම්මා
නො සඤ්ඤොජනා ධම්මා
21 සඤ්ඤොජනියා ධම්මා
අසඤ්ඤොජනියා ධම්මා
22 සඤ්ඤොජනසම්පයුත්තා ධම්මා
සඤ්ඤොජනවිප්පයුත්තා ධම්මා
23 සඤ්ඤොජනා චෙව ධම්මා – සඤ්ඤොජනියා ච
සඤ්ඤොජනියා චෙව ධම්මා – නො ච සඤ්ඤොජනා
24 සඤ්ඤොජනා චෙව ධම්මා – සඤ්ඤොජන සම්පයුත්තා ච
සඤ්ඤොජන සම්පයුත්තා චෙව ධම්මා – නො ච සඤ්ඤොජනා
25 සඤ්ඤොජන විප්පයුත්තා ඛො පන ධම්මා – සඤ්ඤොජනියාපි
,, – අසඤ්ඤොජනියාපි

### සඤ්ඤොජන ගොච්ඡකං

26 ගන්ථා ධම්මා
නො ගන්ථා ධම්මා
27 ගන්ථනියා ධම්මා
අගන්ථනියා ධම්මා
28 ගන්ථසම්පයුත්තා ධම්මා
ගන්ථවිප්පයුත්තා ධම්මා
29 ගන්ථා චෙව ධම්මා – ගන්ථනියා ච
ගන්ථනියා චෙව ධම්මා – නො ච ගන්ථා
30 ගන්ථා චෙව ධම්මා – ගන්ථසම්පයුත්තා ච
ගන්ථසම්පයුත්තා චෙව ධම්මා – නො ච ගන්ථා
31 ගන්ථවිප්පයුත්තා ඛො පන ධම්මා – ගන්ථනියාපි
,, – අගන්ථනියාපි

### ගන්ථ ගොච්ඡකං.

32 ඔඝා ධම්මා
නො ඔඝා ධම්මා
33 ඔඝනියා ධම්මා
අනොඝනියා ධම්මා
ඔඝසම්පයුත්තා ධම්මා
ඔඝවිප්පයුත්තා ධම්මා
35 ඔඝා චෙව ධම්මා–ඔඝනියා ච
ඔඝනියා චෙව ධම්මා–නො ච ඔඝා

36 ඔඝාචෙව ධමමා-ඔඝසමපයුතතාච
ඔඝසමපයුතතාචෙව ධමමා-නොචඔඝා
37 ඔඝවිපපයුතතා ඛො පන ධමමා-ඔඝනීයාපි
,, - අනොඝනීයාපි

### ඔඝගොචඡකං

38 යොගා ධමමා
නො යොගා ධමමා
39 යොගනීයා ධමමා
අයොගනීයා ධමමා
40 යොග සමපයුතතා ධමමා
යොග විපපයුතතා ධමමා
41 යොගාචෙව ධමමා-යොගනීයාච
යොගනීයාචෙව ධමමා-නොච යොගා
42 යොගාචෙව ධමමා-යොග සමපයුතතාච
යොග සමපයුතතාචෙව ධමමා-නොචයොගා
43 යොගවිපපයුතතා ඛො පන ධමමා-යොගනීයාපි
,, - අයොගනීයාපි

### යොගගොචඡකං

44 නීවරණා ධමමා
නො නීවරණා ධමමා
45 නීවරණීයා ධමමා
අනීවරනීයා ධමමා
46 නීවරණ සමපයුතතා ධමමා
නීවරණ විපපයුතතා ධමමා
47 නීවරණ චෙව ධමමා-නීවරණීයාච
නීවරණීයා චෙව ධමමා-නොච නීවරණා
48 නීවරණා චෙව ධමමා-නීවරණ සමපයුතතාච
නීවරණ සමපයුතතා චෙව ධමමා-නොචනීවරණා
49 නීවරණ විපපයුතතා ඛො පන ධමමා-නීවරණීයාපි
,, - අනීවරණීයාපි

### නීවරණ ගොචඡකං

50 පරාමාසා ධමමා
නො පරාමාසා ධමමා
51 පරාමට්ඨා ධමමා
අපරාමට්ඨා ධමමා

52 පරාමාස සම්පයුත්තා ධම්මා
පරාමාස විප්පයුත්තා ධම්මා
53 පරාමාසා චෙව ධම්මා-පරාමට්ඨා ච
පරාමට්ඨා චෙව ධම්මා-නො ච පරාමාසා
54 පරාමාස විප්පයුත්තා ඛො පන ධම්මා-පරාමට්ඨාපි
,, - අපරාමට්ඨාපි

පරාමාස ගොච්ඡකං

55 සාරම්මණා ධම්මා
අනාරම්මණා ධම්මා
56 චිත්තා ධම්මා
නො චිත්තා ධම්මා
57 චෙතසිකා ධම්මා
අචෙතසිකා ධම්මා
58 චිත්තසම්පයුත්තා ධම්මා
චිත්තවිප්පයුත්තා ධම්මා
59 චිත්ත සංසට්ඨා ධම්මා
චිත්ත විසංසට්ඨා ධම්මා
60 චිත්ත සමුට්ඨානා ධම්මා
නො චිත්ත සමුට්ඨානා ධම්මා
61 චිත්ත සහභුනො ධම්මා
නො චිත්ත සහභුනො ධම්මා
62 චිත්තානු පරිවත්තිනො ධම්මා
නො චිත්තානු පරිවත්තිනො ධම්මා
63 චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානා ධම්මා
64 චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා
නො චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභුනො ධම්මා
65 චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්තිනො ධම්මා
නො චිත්ත සංසට්ඨ සමුට්ඨානානු පරිවත්තිනො ධම්මා
66 අජ්ඣත්තිකා ධම්මා
බාහිරා ධම්මා
67 උපාදා ධම්මා
නො උපාදා ධම්මා
68 උපාදින්නා ධම්මා
අනුපාදින්නා ධම්මා

මහන්තරදුකං.

69 උපාදානා ධම්මා
නො උපාදානා ධම්මා

70 උපාදානියා ධම්මා
අනුපාදානියා ධම්මා

71 උපාදාන සම්පයුත්තා ධම්මා
උපාදාන විප්පයුත්තා ධම්මා

72 උපාදානා චෙව ධම්මා–උපාදානියා ච
උපාදානියා චෙව ධම්මා–නො ච උපාදානා

73 උපාදානා චෙව ධම්මා–උපාදාන සම්පයුත්තා ච
උපාදාන සම්පයුත්තා චෙව ධම්මා–නො ච උපාදානා

74 උපාදාන විප්පයුත්තා ඛො පන ධම්මා–උපාදානියාපි
,, – අනුපාදානියාපි

## උපාදාන ගොච්ඡකං

75 කිලෙසා ධම්මා
නො කිලෙසා ධම්මා

76 සංකිලෙසිකා ධම්මා
අසංකිලෙසිකා ධම්මා

77 සංකිලිට්ඨා ධම්මා
අසංකිලිට්ඨා ධම්මා

78 කිලෙස සම්පයුත්තා ධම්මා
කිලෙස විප්පයුත්තා ධම්මා

79 කිලෙසා චෙව ධම්මා–සංකිලෙසිකා ච
සංකිලෙසිකා චෙව ධම්මා–නො ච කිලෙසා

80 කිලෙසා චෙව ධම්මා–සංකිලිට්ඨා ච
සංකිලිට්ඨා චෙව ධම්මා–නො ච කිලෙසා

81 කිලෙසා චෙව ධම්මා–කිලෙස සම්පයුත්තා ච
කිලෙස සම්පයුත්තා චෙව ධම්මා–නො ච කිලෙසා

82 කිලෙස විප්පයුත්තා ඛො පන ධම්මා–සංකිලෙසිකාපි
,, – අසංකිලෙසිකාපි

## කිලෙස ගොච්ඡකං

83 දස්සනෙන පහාතබ්බා ධම්මා
න දස්සනෙන පහාතබ්බා ධම්මා

84 භාවනාය පහාතබ්බා ධම්මා
න භාවනාය පහාතබ්බා ධම්මා

85 දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා
න දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා

86 භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා
න භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා

87 සවිතක්කා ධම්මා
අවිතක්කා ධම්මා

88 සවිචාරා ධම්මා
අවිචාරා ධම්මා

89 සප්පීතිකා ධම්මා
අප්පීතිකා ධම්මා

90 පීතිසහගතා ධම්මා
න පීතිසහගතා ධම්මා

91 සුඛ සහගතා ධම්මා
න සුඛ සහගතා ධම්මා

92 උපෙක්ඛා සහගතා ධම්මා
න උපෙක්ඛා සහගතා ධම්මා

93 කාමාවචරා ධම්මා
න කාමාවචරා ධම්මා

94 රූපාවචරා ධම්මා
න රූපාවචරා ධම්මා

95 අරූපාවචරා ධම්මා
න අරූපාවචරා ධම්මා

96 පරියාපන්නා ධම්මා
අපරියාපන්නා ධම්මා

97 නිය්‍යානිකා ධම්මා
අනිය්‍යානිකා ධම්මා

98 නියතා ධම්මා
අනියතා ධම්මා

99 ස උත්තරා ධම්මා
අනුත්තරා ධම්මා

100 සරණා ධම්මා
අරණා ධම්මා

පිට්ඨි දුකං

## දුකමාතිකා නිට්ඨිතා
## අභිධම්මමාතිකාච නිට්ඨිතා

මෙහි හෙතුගොච්ඡකාදි ගොච්ඡකයන්ගේ අවසාන දුකයන්හි බොපන යන අභිඥාණී වචනයෙන් ලැබිය යුතු සම්භව දුකයන්ගේ අර්ථ වර්ණනාව (විස්තර විභාග) දැක්වූ ඒ ඒ ස්ථාන යන්හි දැක්වීමු. මෙතැන් පටන් ධම්මසේනාපති සාරිපුත්‍ර අගසව්වන් වහන්සේ විසින් තබන ලද සූත්‍රාන්ත පාළිය දක්වනු ලැබේ.

### සුත්තන්තමාතිකා පාළි

1 විජ්ජාභාගිනො ධම්මා,
අවිජ්ජාභාගිනො ධම්මා෴

2 විජ්ජූපමා ධම්මා,
වජිරූපමා ධම්මා෴

3 බාලා ධම්මා,
පණ්ඩිතා ධම්මා෴

4 කණ්හා ධම්මා,
සුක්කා ධම්මා෴

5 තපනීයා ධම්මා,
අතපනීයා ධම්මා෴

6 අධිවචනා ධම්මා,
අධිවචනපථා ධම්මා,

7 නිරුත්ති ධම්මා,
නිරුත්තිපථා ධම්මා෴

8 පඤ්ඤත්ති ධම්මා,
පඤ්ඤත්තිපථා ධම්මා෴

9 නාමඤ්ච,
රූපඤ්ච෴

10 අවිජ්ජා ච,
භවතණ්හා ච෴

11 භවදිට්ඨි ච,
විභවදිට්ඨි ච෴

12 සස්සතදිට්ඨි ච,
උච්ඡෙදදිට්ඨි ච෴

13 අන්තවාදිට්ඨි ච,
අනන්තවාදිට්ඨි ච෴

14 පුබ්බන්තානු දිට්ඨිච,
අපරන්තානු දිට්ඨිච෴

15 අහිරිකඤ්ච,
අනොත්තප්පඤ්ච෴

16 හිරිච,
ඔත්තප්පඤ්ච෴

17 දොවචස්සතාච,
පාපමිත්තතාච෴

18 සොවචස්සතාච,
කල්‍යාණ මිත්තතාච෴

19 ආපත්තිකුසලතාච,
ආපත්තිඋට්ඨාන කුසලතාච෴

20 සමාපත්ති කුසලතාච,
සමාපත්ති උට්ඨානකුසලතාච෴

21 ධාතුකුසලතාච,
මනසිකාර කුසලතාච෴

22 ආයතන කුසලතාච,
පටිච්චසමුප්පාද කුසලතාච෴

23 ඨානකුසලතාච,
අට්ඨාන කුසලතාච෴

24 අජ්ජවොච,
මද්දවොච෴

25 ඛන්තීච,
සොරච්චඤ්ච෴

26 සාඛල්‍යඤ්ච,
පටිසන්ථාරොච෴

27 ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාච,
භොජනෙ අමත්තඤ්ඤුතාච෴

28 ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාච,
භොජනෙ මත්තඤ්ඤුතාච෴

29 මුට්ඨස්සච්චඤ්ච,
අසම්පජඤ්ඤඤ්ච෴

30 සතිච,
සම්පජඤ්ඤඤ්ච෴

31 පටිසඞ්ඛානබලඤ්ච
භාවනාබලඤ්ච෴

32 සමථොච,
විපස්සනාච.

33 සමථ නිමිත්තඤ්ච,
පග්ගහ නිමිත්තඤ්ච.

34 පග්ගහොච,
අවික්ඛෙපොච.

35 සීලවිපත්තිච,
දිට්ඨිවිපත්තිච.

36 සීලසම්පදාච,
දිට්ඨිසම්පදාච.

37 සීලවිසුද්ධිච,
දිට්ඨිවිසුද්ධිච.

38 දිට්ඨිවිසුද්ධි ඛොපන,
යථාදිට්ඨිස්සච පධානං.

39 සංවෙගොච සංවෙජනීයෙසු ඨානෙසු,
සංවිග්ගස්සච යොනිසොපධානං.

40 අසන්තුට්ඨිතාච කුසලෙසු ධම්මෙසු,
අප්පටිවාණිතාච පධානස්මිං.

41 විජ්ජාච,
විමුත්තිච.

42 ඛයෙ ඤාණං,
අනුප්පාදෙ ඤාණන්ති.

සුත්තන්ත මාතිකා පාළි නිට්ඨිතා.

අභිධම්ම සුත්තන්ත උභයමාතිකා පාළිච නිට්ඨිතා.

සර්වඥ ප්‍රභව වූ අභිධර්ම මාතෘකා පාළිය හා ශාරිපුත්‍ර ප්‍රභව වූ සූත්‍රාන්ත මාතෘකා පාළිය ද සර්වප්‍රකාරයෙන් නිමියේයි.

යම් භික්ෂුවක් තෙමේ මේ මාතෘකා පාළිය වාචෝද්ගතකොට ධරන්නේ වී නම් ඒ භික්ෂුතෙමේ සර්වඥ භාෂිත වූ අභිධර්ම පිටකය ධරන්නාවූ නැනැත්තේ යයි කිය යුතුවේ. එබැවින් දුර්ලභ වූ මේ මාතෘකා පාළිය හා අර්ථ ඉගෙණගත යුතුමැයි.

සිද්ධිරස්තු.

# අභිධම්ම මාතිකා පාළි සන්නය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

කරුණාවිය සත්තෙසු පඤ්ඤායයස්ස මහෙසිනො,
ඤෙය්‍ය ධම්මෙසු සබ්බෙසු පවත්තිත්ථ යථා රුචි.

දයාය තාය සත්තෙසු සමුස්සාහිත මානසො,
පාටිහීරව සානම්හි වසන්තො තිදසාලයෙ.

පාරිච්ඡත්තක මූලම්හි පණ්ඩුකම්බල නාමකෙ,
සිලාසනෙ සන්නිසින්නො ආදිච්චොව යුගන්ධරෙ.

චක්කවාළ සහස්සෙහි දසහාගම්ම සබ්බසො,
සන්නිසින්නෙන දෙවානං ගණෙන පරිවාරිතො.
මාතරං පමුඛං කත්වා තස්සා පඤ්ඤාය තෙජසා,
අභිධම්ම කථා මග්ගං දෙවානං සම්පවත්තයි.
තස්ස පාදෙ නමස්සිත්වා සම්බුද්ධස්ස සිරීමතො,
සද්ධම්මඤ්චස්ස පූජෙත්වා කත්වා සංඝස්ස චඤ්ජලිං.

— යනු අටුවා බැවින් —

මේ මහාභද්‍රකල්පයෙන් සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් යට අප මහබෝසතාණන් වහන්සේ සුමේධ නම් බ්‍රාහ්මණ මහාසාලව උපිද මව්පියන් විසින් නිධන්ගතකොට තැබූ අසූකෙළක් ධනය යාචකාදීන් විෂයෙහි දන්දී හිමාල වනයට වැද ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා අහසින් යනුයේ රඹගම් නුවරට වඩනා ලක්ෂයක් රහතුන් පිරිවර කොට ඇති ලොක ශිවඞ්කර දීපඞ්කර භාග්‍යවතුන් වහන්සේගේ පාදමූලයට පැමිණ සතරපද ගාථාවක් ඇසූ පමණින් සතරමග සතර ඵලයට පැමිණ උතුම්වූ අමාමහ නිවන් සැප ලැබිය හැකි වුවද, මා වැනි වීර පුරුෂයෙක් තනිවම නිවන්සුව විඳීම තරම් නොවේ. සව්තෝදත් ලොව්තුරා බුදුබවට පැමිණ දෙව් බඹුන් සහිත ලොක සත්වයන් සසර සයුරෙන් ගොඩ ලන්නෙමැයි සිතා දෘඪතර වීර්‍ය්‍යයෙන් දානාදී සමතිස් පෙරුම් පුරා සියලු බුදුකුරු දහමුන් කුළුගන්වා වෙසතුරු අත් බැවින් චුතව තුසීපුර උපිද මිනිස් ගණනින් සත්පණස්කෙළ සැට ලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි දිවසිරි වළඳා දසදහසක් සක්වල දෙව් බඹුන්ගේ අයදුමෙන් පස්මහ බැලුම් බලා කලියුග වර්ෂයෙන් දෙදහස් සිව්සිය සත්සැත්තෑවැන්නෙහි ඇසළ මස පුර පසළොස්වක් ලත් ගුරුදින උතුරුසළ නැකතින් සුදෙවුන් මහරජුන් නිසා මහාමායා බිසව කුස පිළිසිඳගෙන දසමස් ඇවෑමෙන් වෙසක් මස

පුර පසළොස්වක් ලත් කිවිදින මව් කුසින් බිහිව එතැන් පටන් පිළිවෙළින් වැඩෙමින් එකුන් තිස්විය පැමිණ ඇසළමස පුර පස පසළොස්වක් ලත් සඳුදින මහබිනික්මන් කොට එතැන් පටන් සාවුරුද්දක් මුළුල්ලෙහි දුෂ්කර ක්‍රියාකොට වෙසක් මස පුර පසළොස්වක් ලත් බුදදින බුදුබවට පැමිණ ඇසළ මස පුර පසළොස්වක් ලත් ශනිදින බරණැස ඉසිපතනාරාමයෙහි පස්වග මහණුන් ප්‍රධාන අවශෙෂ අටළොස් කෙළක් දෙව් බඹුන්ට දම්සක් පවත්වා වදාළසේක. මෙසේ ලොව්තුරා බුදුබවට පැමිණ පවත්වන ලද දම්සක් ඇති අසමවූ අසමසමවූ අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දහම්වැසි වස්වමින් සත්වන අවුරුද්දෙහි ගණ්ඩ නම් උයන් ගොව්වා විසින් රෝපනය කරණ ලද අඹ වෙනෙහි දී තීර්ථකමානා මර්දනය පිණිස යමාමහ පෙළහර දක්වා ත්‍රිපද වික්‍රමයෙන් තව්තිසා දෙව්ලොවට වැඩ පරසතු මදුරා රුක්මුල පණවන ලද පඬු ඇඹුල් සලස්න මතුයෙහි වැඩහිඳ මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛකොට ඇති දසදහසක් සක්වළින් රැස්වූ දෙව් බඹුන්ට පඤ්ච මහා නිධානයකින් හා පඤ්චමහා පරිත්‍යාගයකින්ද ත්‍රිවිධ චර්‍යාවකින්ද සමලඞ්කෘතවූ සර්වඥතාඥාණ තේජසින් විනිවිද අවබෝධ කළාවූ අභිධර්ම දේශනා වස්තුන්මස මුළුල්ලෙහි දේශනා කරණ ලද්දේය. ඒ මේ අභිධර්ම දේශනා තොමෝ විස්තාරනය සංක්‍ෂෙපනය නාති විස්තාර නාතිසංක්‍ෂෙපනය වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් වස්තුන්මස මුළුල්ලෙහි තව්තිසා දෙව්ලොවදී වදාළ දේශනා තොමෝ විස්තාරනය නම් වේ. එසමයෙහි අනවතප්ත විල සමීපයෙහි සුපිහිටි සඳුන් වෙනෙහි දිවා විහරණය පිණිස වඩනා බුදුරජාණන්වහන්සේට උවටැන් කරණුවස් එළඹි ශාරීපුත්‍ර තෙරණුවන්ට දේශනා කළ දේශනා තොමෝ සංක්‍ෂෙපනය නම් වන්නේය. බුදුරදුන් වෙතින් උගත් අභිධර්ම දේශනාව තම සද්ධිවිහාරික භික්ෂූන් පන්සියයට විස්තරකොට දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන්වහන්සේ විසින් දේශනාකරණ ලද දේශනාව නාති විස්තාර නාතිසංක්‍ෂෙපනය නම් වන්නේය. ඒ තෙවැදෑරුම් නය ක්‍රමයක් ඇති අභිධර්ම දේශනා තොමෝ ධම්මසඞ්ගණී, විභඞ්ග, ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථාවත්‍ථු, යමක, පට්ඨාන යන සප්තප්‍රකරණයකින් සමන්විත වන්නේය. ඔවුනතුරෙන් ධම්මසඞ්ගණී ප්‍රකරණය පළමුකොට වදාළ සේක. ඒ ධම්මසඞ්ගණී ප්‍රකරණයද චිත්තුප්පාද කාණ්ඩය, රූප කාණ්ඩය, නික්ෂෙප කාණ්ඩය, අට්ඨකථා කාණ්ඩයයි සිව්වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් චිත්තුප්පාද කාණ්ඩය පළමුකොට වදාළසේක. ඒ චිත්තුප්පාද කාණ්ඩයද මාතෘකා පදභාජන වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් මාතෘකාව පළමුකොට වදාළසේක. ඒ මාතෘකාවද

තිකමාතෘකා දුකමාතෘකා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් තිකමාතෘකාව පළමුකොට වදාළසේක. ඒ තිකමාතෘකාවද කුසල ත්‍රිකය වේදනා ත්‍රිකාදීන්ගේ වශයෙන් දෙවිසි වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් කුසල ත්‍රිකය පළමුකොට වදාළසේක. හෙද ප්‍රථමපදය දුතියපදය තෘතිය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථමපදය පළමුකොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? කුසලා ධම්මා යනුවෙනි. තදනන්තරව දුතියපදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? අකුසලා ධම්මා යනුවෙනි. තදනන්තරව තෘතියපදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? අබ්‍යාකතා ධම්මා යනුවෙනි.

කුසලා අනවද්‍ය ඉෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තාවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව ස්වභාව ධර්ම කෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමාන වෙත්.

අකුසලා සාවද්‍ය අනිෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තාවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව ස්වභාව ධර්ම කෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමාන වෙත්.

අබ්‍යාකතා කුසලාකුසල වශයෙන් නොවදුරා අන්‍ය භාවයකින් වදුරණ ලද්දූවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව ස්වභාව ධර්ම කෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමාන වෙත්.

මෙහි කුසලා ධම්මා යන ප්‍රථම පාදයාගේ අභිධෙයාර්ථයෝ (ස්ව රූපාර්ථයෝ) නම් එක් විසි කුසල චිත්තය හා සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙ වැදෑරුම්. ධාතු වශයෙන් දෙ වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙ වැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම්වේද යත්? අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනා ස්කන්ධ නම්. සංඥා චෛතසිකය සංඥා ස්කන්ධ නම්. අතිරික්ත සතිස් චෛතසිකයෝ සංස්කාර ස්කන්ධ නම්. එක්විසි කුසල චිත්තය විඥාන ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්.

ආයතන වශයෙන් කෙසේ දෙ වැදෑරුම්වේද යත්? එක් විසි කුසල චිත්තය මනායතන නම්. අටතිස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතනවශයෙන් දෙවැදෑරුම්. ධාතුවශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? එක්විසි කුසල චිත්තය මනො විඥාන ධාතු නම්. අටතිස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙ වැදෑරුම්වේද යත්? ලෞකික කුසල් සතළොස හා සම්ප්‍රයුක්ත චෛතසික අටතිස දුක්ඛ සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි

සම්මා සංකප්ප සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව සම්මා වායාම සම්මා සති සම්මා සමාධි යන ශ්‍රෝතාපත්ති මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් (සම්මා සංකප්පවජ්ජිත) සත්දෙන සතර වරක් සකෘදගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් අනාගාමි මාර්ගාඞ්ගයෝ අට දෙන එක් වරක් සත්දෙන සතරවරක් අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් යන මෙතෙක් ධර්මයෝ මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ එකුන් තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

අකුසලා ධම්මා යන දුතියපදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල චිත්තය හා තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ තුමූ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙ වැදෑරුම් ස්කන්ධ වශයෙන් කෙසේ සිව්වැදෑරුම්වේද යත්? සත්විසි චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනා ස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤා ස්කන්ධ නම්. අතිරික්ත පස්විසි චෛතසිකයෝ සංස්කාර ස්කන්ධ නම්. දොළොස් අකුසල චිත්තය විඥාන ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්.

ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? දොළොස් අකුසල චිත්තය මනායතන නම්. සත්විසි චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්.

ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? දොළොස් අකුසල චිත්තය මනොවිඥාන ධාතු නම්. සත්විසි චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්.

සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? දොළොස් අකුසල චිත්තය ලොභ වජ්ජිත සවිසි චෛතසිකය දුක්ඛ සත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

අබ්‍යාකතා ධම්මා යන තෘතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සතිස් විපාක චිත්තය විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය, අටවිසි රූපය, නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ පස්වැදෑරුම්වේද යත්?

අටවිසි රූපය රූපස්කන්ධ නම්. අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනා ස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤා ස්කන්ධ නම්. අතිරික්ත සතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. සතිස් විපාක චිත්තය, විසි ක්‍රියා චිත්තය විඤ්ඤාන ස්කන්ධ නම්. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වේ. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්.

ආයතන වශයෙන් කෙසේ දෙළොස් වැදෑරුම්වේද යත්? අටවිසි රූපයන් අතුරෙන් චක්ඛුප්‍රසාද රූපය චක්ඛායතන නම්. ශොත්‍රප්‍රසාද රූපය ශොත්‍රායතන නම් ඝ්‍රාණප්‍රසාද රූපය ඝ්‍රාණායතන නම්. ජිව්හාප්‍රසාද රූපය ජිව්හායතන නම්. කාය ප්‍රසාද රූපය කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. ශබ්ද අරමුණ ශබ්දායතන නම්. ගන්ධ අරමුණ ගන්ධායතන නම්. රස අරමුණ රසායතන නම්. පෘථිවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බායතන නම්. සතිස් විපාක චිත්තය හා විසි ක්‍රියා චිත්තයෝ මනායතන නම්. අටතිස් චෛතසිකය ආපොධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප පරිච්ඡේද රූප කාය විඤ්ඤත්ති රූප වචී විඤ්ඤත්තිරූප ලහුතාරූප මුදුතාරූප කම්මඤ්ඤතාරූප උපචය රූප සන්තතිරූප ජරතාරූප අනිච්චතාරූප සංඛ්‍යාත සොළොස් සුඛුම රූප හා නිර්වාණය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්.

ධාතු වශයෙන් කෙසේ "අටළොස් වැදෑරුම්වේද යත්?" අටවිසි රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු ධාතු නම්. ශොත්‍ර ප්‍රසාද රූපය සොත ධාතු නම්. ඝ්‍රාණ ප්‍රසාද රූපය ඝ්‍රාණ ධාතු නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හා ධාතු නම්. කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්. රූප අරමුණ රූප ධාතු නම්. ශබ්ද අරමුණ ශබ්ද ධාතු නම්. ඝන්ධ අරමුණ ඝන්ධ ධාතු නම්. රස අරමුණ රස ධාතු නම්. පඨවි, තෙජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ අරමුණ පොට්ඨබ්බ ධාතු නම්. චක්ඛු විඤ්ඤාණද්වය චක්ඛු විඤ්ඤාණ ධාතු නම්. සොත විඤ්ඤාණද්වය සොත විඤ්ඤාණ ධාතු නම්. ඝාණ විඤ්ඤාණද්වය ඝාණ විඤ්ඤාණ ධාතු නම්. ජිව්හා විඤ්ඤාණද්වය ජිව්හා විඤ්ඤාණ ධාතු නම්. කාය විඤ්ඤාණද්වය කාය විඤ්ඤාණ ධාතු නම්. පඤ්චද්වාරා වජ්ජනය හා සම්පටිච්ඡනද්වය මනො ධාතු නම්. අතිරික්ත සූවිසි විපාක චිත්තය එකුන්විසි ක්‍රියා චිත්තය මනො විඤ්ඤාණ ධාතු නම්. අටතිස් චෛතසිකය ආපො ධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප පරිච්ඡේද රූප කාය විඤ්ඤත්ති රූප වචී

විඤ්ඤත්ති රූප ලහුතා රූප මුදුතා රූප කම්මඤ්ඤතා රූප උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප සංඛ්‍යාත සොළොස් සුඛුම රූප හා නිර්වාණය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්.

සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත පංතිස් චෛතසිකය අටවිසි රූපය දුක්ඛ සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. ඵල චිත්තෝත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්ත වෙති. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

මේ ශබ්දවලීතොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වෙයි. ආදී ලබ්ධ නාම සජී ලබ්ධ නාම ත්‍රිකයන් අතුරෙන් කුසලා ධම්මා යන මුල් පදෙන් ලබන ලද (කුසල ත්‍රික යන) නාමය ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වෙයි. සප්පදෙස නිප්පදෙස ත්‍රිකයන් අතුරෙන් සියළු පරමාර්ථ ධර්මයන් මෙහිලා වදාළ බැවින් නිප්පදෙස ත්‍රික නම් වෙයි. (මෙතෙකින් කුසල ත්‍රිකය පිළිබඳ වාචොත්ගත කළ යුතු කොටස නිමියේය.)

මෙහි රූප ස්කන්ධය භාජනයක් වැනිය. වේදනා ස්කන්ධය භෝජනයක් වැනිය. සංඥා ස්කන්ධය ව්‍යඤ්ජනයක් වැනිය. සංස්කාර ස්කන්ධය බෙදන්නෙකු වැනිය. විඤ්ඤාණ ස්කන්ධය වලඳන්නෙකු වැනිය. චක්ෂුරාදී ආධ්‍යාත්මික ආයතනයෝ සදෙන පාළු ගෙවල් මෙන්ද බාහිර ආයතනයෝ සදෙන ගම් පහරණ සොරුන් මෙන්ද චක්ෂුරාදී ධාතු සය බෙර ඇස් මෙන්ද රූපාදි ධාතු සය කඩිප්පු මෙන්ද විඤ්ඤාණ ධාතුහු එයින් නැගි ශබ්ද මෙන්ද උපමාන, උපමෙය්‍ය, උපමා සංසන්දනය කොට දත යුත්තේය. තවද "මග්ගයුත්තා ඵලාචෙව, චතුසච්ච විනිස්සටා" යි කී හෙයින් මාර්ග ඵල සම්ප්‍රයුක්ත ධර්මයෝ ආර්‍ය්‍ය සත්‍යයන්ට ඇතුළත් නො කරණ ලද්දහ. ධ්‍යානාංගයෝග ක්‍රමයෙන් ප්‍රථමධ්‍යාන මාර්ග සිත් සතරෙහි මාර්ගාංගයෝ අටදෙනම ලැබෙන හෙයින් අටදෙන එක්වරක් යයි ද දෙවන තුන්වන සතරවන පස්වන ධ්‍යාන සිත් වල විතර්කය නො ලැබෙන බැවින් සත්දෙන සතරවරක් යයි ද ප්‍රකාශ කෙළෙමු. මෙහි නය ක්‍රමයෝ මතු දැක්වෙන සියළු ත්‍රික දුකයන්හිම සාධාරණයහ.

## කුසල ත්‍රිකයයි

2. කුසල ත්‍රිකයට අනතුරුව වේදනා ත්‍රිකය වදාළසේක. ඒ වේදනා ත්‍රිකයද ප්‍රථම පදය දුතිය පදය තෘතිය පදයාගේ වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු

කොට වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? "සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා" යනුවෙනි. තදනන්තරව දුතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? "දුක්ඛාය වේදනාය සම්පයුත්තා ධම්මා" යනුවෙනි. තදනන්තරව තෘතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? "අදුක්ඛ මසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා" යනුවෙනි.

සුඛාය වේදනාය සැප වූ වේදනාව හා සම්පයුත්තා එකොත්පාදදි භාවයෙන් මිශ්‍රවූ ධම්මා තිස්සත්ත තිජ්ජීව සභාව ධර්ම කෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමාන වෙත්. දුක්ඛාය වේදනාය, දුක්වූ වේදනාව හා සම්පයුත්තා...පෙ...ධම්මා...පෙ... සන්ති...පෙ...අදුක්ඛ මසුඛාය වේදනාය සැපත් නොවූ දුකත් නොවූ මධ්‍යස්ථ වේදනාව හා සම්පයුත්තා...පෙ...ධම්මා...පෙ... සන්ති...පෙ...විද්‍යමාන වෙත්.

සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා, යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්. සුඛ සහගත තෙසැට චිත්තය හා තත් සම්ප්‍රයුක්ත වේදනා, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා, වර්ජිත සසාළිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් තුන්වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ තුන්වැදෑරුම්වේද යත් සසාළිස් චෛතසිකයන් අතුරෙන් සංඥා චෛතසිකය සංඥා ස්කන්ධ නම්. අතිරික්ත පන්සාළිස් චෛතසිකයෝ සංස්කාර ස්කන්ධ නම්. සුඛ සහගත තෙසැට චිත්තය විඥාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙ වැදෑරුම් වේද යත්? සුඛ සහගත තෙසැට චිත්තය මනායතන නම්. සසාළිස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ තෙවැදෑරුම්වේද යත්? සුඛ සහගත කාය විඥාණය කාය විඥාණ ධාතු නම්. අතිරික්ත සුඛ සහගත චිත්තයෝ දෙසැට මනො විඥාණ ධාතු නම්. සසාළිස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තුන් වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ තුන්වැදෑරුම් වේද යත්? ලෞකික සුඛ සහගත චිත්තයෝ එක්තිස හා තත් සම්ප්‍රයුක්ත ලොභ වර්ජිත පන්සාළිස් චෛතසිකයෝ දුක්ඛ සත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සුඛ සහගත චිත්තයන් සමග යෙදුනාවූ සම්මා දිට්ඨි ආදී සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන තුන්වරක් සකෘද ගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන තුන්වරක්

අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන තුන්වරක් අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන තුන්වරක් මාර්ග සත්‍ය නම්. අතිරික්ත සුඛ සහගත මාර්ග චිත්තෝත්පාදයෝ අට විසිදෙන හා ඵල චිත්තොත්පාදයෝ (වේදනා වර්ජිත) සතිස්දෙන සත්‍ය විනිර්මුක්තවෙති.

"දුඃඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා යන දුතිය පාදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්. දුඃඛ සහගත චිත්තයෝ තිදෙන හා තත් සම්ප්‍රයුක්ත වේදනා ප්‍රීති ලෝභ මාන දිට්ඨි විචිකිච්ඡා වර්ජිත එක්විසි චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුන් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවදෑරුම්. ධාතු වශයෙන් තුන් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් කෙසේ තෙවැදෑරුම් වේදයත්? එක්විසි චෛතසිකයන් අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධ නම්. අතිරික්ත සම විසි චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. දුඃඛ සහගත චිත්තයෝ තිදෙන විඥානස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙ වැදෑරුම් වේද යත්? දුඃඛ සහගත චිත්තයෝ තිදෙන මනායතන නම්. එක්විසි චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ තුන් වැදෑරුම්වේද යත්? දුඃඛ සහගත කාය විඥාණය, කාය විඥාණ ධාතු නම්. දෙම්නස් දෙසිත, මනෝවිඥාණ ධාතු නම්. එක්විසි චෛතසිකය, ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ එක් වැදෑරුම් වේද යත්? දුඃඛ සහගත චිත්තයෝ තිදෙන හා එක්විසි චෛතසිකයෝ දුඃඛසත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් එකවැදෑරුම්. අදුඃඛ මසුඛාය, වේදනාය, සම්ප්‍රයුත්තා ධම්මායන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උපෙක්ෂා සහගත පන් පණස් චිත්තය තත් සම්ප්‍රයුක්ත ප්‍රීති වේදනා දෝස,ඉස්සාමච්ඡරිය කුක්කුච්ච වර්ජිත සසාළිස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් තුන් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් සත් වැදෑරුම්. සත්‍ය වශයෙන් තුන් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් කෙසේ තෙවැදෑරුම්වේදයත්? සසාළිස් චෛතසිකයන් අතුරෙන් සංඥා චෛතසිකය සංඥාස්කන්ධ නම්. අතිරික්ත පංසාළිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. පන් පණස් උපේක්ෂා සහගත චිත්තයෝ විඥාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් තෙවැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේදයත්? පන් පණස් උපේක්ෂා සහගත චිත්තයෝ

මනායතන නම්. සසාළිස් චෛතසිකයෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ සත්වැදෑරුම්වේදයත්? චක්ඛුවිඤ්ඤාණද්වය චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්. සෝතවිඤ්ඤාණද්වය සෝතවිඤ්ඤාණ ධාතු නම්. ඝාණ විඤ්ඤාණද්වය ඝාණවිඤ්ඤාණ ධාතු නම්. ජීව්හාවිඤ්ඤාණද්වය ජිව්හාවිඤ්ඤාණ ධාතු නම්. පඤ්චද්වාර වජ්ජනය හා සම්පටිච්ඡනද්වය මනෝ ධාතු නම්. අතිරිත්ත උපේක්ෂා සහගත චිත්තයෝ සිව්සාළිස මනෝවිඤ්ඤාණ ධාතු නම්. සසාළිස් චෛතසිකය ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් සත්වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ තුන්වැදෑරුම්වේදයත්? ලෞකික උපේක්ෂා සහගත චිත්තයෝ සත්සාළිස තත් සම්ප්‍රයුක්ත ලෝභ වර්ජිත පන්සාළිස් චෛතසිකය දුක්ඛසත්‍ය නම්. ලොභය සමුදය සත්‍ය නම්. සතරමාර්ගී උපේක්ෂා සහගත චිත්තයන් සමග යෙදුනාවූ සම්මාදිට්ඨි සම්මාවාචා...පෙ...සම්මාසමාධි යන සෝවාන් මාර්ගාඞ්ගයෝ සත්දෙන සකෘදාගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙන අනාගාමි මාර්ගාඞ්ගයෝ සත්දෙන අර්හත් මාර්ගාඞ්ගයෝ සත්දෙන මාර්ගසත්‍ය නම්. අතිරිත්ත මාර්ග චිත්තොත්පාදයෝ සත්විසිදෙන හා ඵල චිත්තොත්පාදයෝ සූතිස්දෙන සත්‍ය විනිර්මුක්තවේ.

†මේ ශබ්දවලීතොමෝ පරමාර්ථධර්මයන් පදතුනක්කොට වදාළහෙයින් ත්‍රික නම්. පද තුනෙන් ලබනලද නම් ඇති හෙයින් සම්ලබ්ධනාම ත්‍රිකනම්වෙයි. සුඛ වේදනාවෝ තෙසැටදෙනය. දුක්ඛ වේදනාවෝ තුන්දෙනය. උපේක්ෂා වේදනාවෝ පස් පණසය. අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ වේදනා ත්‍රිකයට ඇතුළත් නොවූ බැවින් සපපදේස ත්‍රික නම්වෙයි.

## වේදනා ත්‍රිකයයි

3. වේදනා ත්‍රිකයට අනතුරුව විපාක ත්‍රිකය වදාළසේක. ඒ විපාක ත්‍රිකයද ප්‍රථම පදය දුතිය පදය තෘතිය පදයාගේ වශයෙන් තෙවැදෑරුම්වේ. එයින් ප්‍රථම පදය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළසේක්දයත්? විපාකා ධම්මා යනුවෙනි. තදනන්තරව දුතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? විපාක ධම්ම ධම්මා යනුවෙනි. තදනනතරව තෘතිය පදය වදාළ සේක. කෙසේ වදාළ සේක්දයත්? නෙව විපාක න විපාක ධම්ම ධම්මා යනුවෙනි. විපාකා අන්‍යොන්‍ය විරුද්ධවූ කුසලාකුසලයන්ගේ විපාකවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාව ධර්මකෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමානවෙත්. විපාක ධම්ම විපාක උපදවන සවභාව

†මෙසේ ආර්‍ය සත්‍ය වශයෙන් තුන් වැදෑරුම්.

ඇත්තාවූ ධම්මා නිස්සත්ත෴පෙ෴කෙනෙක් සත්ති෴පෙ෴විද්‍යමානවෙත්. නෙවවිපාක, අන්‍යෝන්‍ය විරුඬවූ කුසලා කුසලයන්ගේ විපාකත් නොවූ නවිපාක ධම්ම විපාක උපදවන සවභාවත් නැත්තාවූ ධම්මා෴පෙ෴කෙනෙක් සත්ති෴පෙ෴වෙත්.

මෙහි ප්‍රථම පාදයාගේ අභිධෙයාර්ථයෝ නම් සතිස් විපාක චිත්තය අටතිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම් ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව්වැදෑරුම්වේදයත්? අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධ නම්. අතිරික්ත සතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. සතිස් විපාක චිත්තය විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේදයත්? සතිස් විපාක චිත්තය මනායතන නම්. අටතිස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ අටවැදෑරුම්වේදයත්? චක්ඛුවිඤ්ඤාණදෙසිත චක්ඛුවිඤ්ඤාණ ධාතු නම්. සෝත විඤ්ඤාණදෙසිත, සොතවිඤ්ඤාණ ධාතු නම්. ඝාණවිඤ්ඤාණ දෙසිත, ඝාණවිඤ්ඤාණ ධාතු නම්. ජිව්හාවිඤ්ඤාණදෙසිත, ජිව්හා විඤ්ඤාණ ධාතු නම්. කායවිඤ්ඤාණදෙසිත, කායවිඤ්ඤාණ ධාතු නම්. සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතු නම්. අතිරික්ත සූවිසි විපාක චිත්තය මනෝවිඤ්ඤාණ ධාතු නම්. අටතිස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අටවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ එක්වැදෑරුම්වේදයත්? ලෞකික විපාක දෙතිස තත් සම්ප්‍රයුක්ත පංතිස් චෛතසිකය දුක්ඛසත්‍ය නම්. ඵල චිත්තෝත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්‍ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

විපාක ධම්ම ධම්මායන දුතිය පාදයාගේ අභිධෙයාර්ථයෝ නම්. දොළොස් අකුසල චිත්තය, එක්විසි කුසල චිත්තය, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් තුන් වැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම්වේදයත්? දෙපණස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධ නම්. සංඥා චෛතසිකය, සංඥාස්කන්ධ නම්. අතිරික්ත සම පණස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. දොළොස් අකුසල චිත්තය හා එක්විසි කුසල චිත්තය විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම්

වේදයත්? දෙලොස් අකුසල චිත්තය හා එක්විසි කුසල චිත්තය මනායතන නම්. දෙපණස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේදයත්? දෙලොස් අකුසල චිත්තය හා එක්විසි කුසල චිත්තය මනෝවිඤ්ඤාණ ධාතු නම්. දෙපණස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ තෙවැදෑරුම්වේදයත්? දෙලොස් අකුසල චිත්තය ලෞකික කුසල් සතලොස තත් සම්ප්‍රයුක්ත ලෝභවර්ජිත චෛතසික එක් පණස දුඃඛසත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදයසත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ...පෙ... සම්මා සමාධි යන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් සකෘදාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් අනාගාමි මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් යන මෙතෙක් ධර්මයෝ මාර්ගසත්‍ය නම් අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ එකුන්තිස සත්‍යවිනිර්මුක්තවේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

නෙව විපාක නවිපාක ධම්ම ධම්මා යන තෘතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්? විසික්‍රියා චිත්තය, තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය, අටවිසි රූපය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙලොස්වැදෑරුම්. ධාතු වශයෙන් තෙළෙස් වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ පස් වැදෑරුම්වේදයත්? අටවිසි රූපය රූපස්කන්ධ නම්. පන්තිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධ නම්. සංඥා චෛතසිකය සංඥාස්කන්ධ නම්. අතිරික්ත තෙතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. විසික්‍රියා චිත්තය විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙලොස්වැදෑරුම්වේදයත්? චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම් ...පෙ... කායප්‍රසාදරූප කායායතන නම්. රූප අරමුණ රූපායතන නම් ...පෙ... පඨවි, තේජෝ, වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බායතන නම්. විසික්‍රියා චිත්තය මනායතන නම්. පන්තිස් චෛතසිකය ආපෝ ධාතු ...පෙ... අනිච්චතාරූප සංඛ්‍යාත සොළොස් සුඛුම රූප හා නිර්වාණය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙලොස් වැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ තෙළෙස් වැදෑරුම්වේදයත්? අටවිසි රූපයන් අතුරෙන් චක්ඛුප්‍රසාද රූපය චක්ඛුධාතු නම්. ...පෙ... කායප්‍රසාද රූපය කායධාතු නම්. රූප අරමුණ රූපධාතු

නාම් ...පෙ... පඨවී තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බ ධාතු නාම්. පංචද්වාරා වර්ජිත චිත්තය මනෝ ධාතු නාම්. අතිරික්ත එකුන්විසි ක්‍රියා චිත්තය මනෝවිඤ්ඤාණ ධාතු නාම්. පන්තිස් චෛතසිකය ආපෝධාතු ...පෙ... අනිවජ්ජිතා රූප සංඛ්‍යාත සොළොස් සුඛුම රූපය හා නිර්වාණය ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙළෙස් වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේදයත්? විසික්‍රියා චිත්තය පන්තිස් චෛතසිකය හා අටවිසි රූපය දුඃඛසත්‍ය නම්. නිර්වාණය නිරෝධසත්‍ය නම්. මෙසේ ආයසී සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම්වෙයි. මුල් පෙදින් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්දනාම ත්‍රික නම්වෙයි සියළු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදාළ හෙයින් නිප්පදේසත්‍රික නම්වෙයි.

## විපාක ත්‍රිකයයි

4. විපාක ත්‍රිකයට අනතුරුව උපාදිණ්ණ ත්‍රිකය වදාළසේක, හෙද ප්‍රථම පදය දුතිය පදය තෘතිය පදයාගේ වශයෙන් තෙවැදෑරුම්. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? උපාදිණ්ණු පාදනියා ධම්මා යනුවෙනි. තදනන්තරව දුතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? අනුපාදිණ්ණු පාදනීයා ධම්මා යනුවෙනි. තදනන්තරව තෘතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? අනුපාදිණ්ණ අනුපාදනියා ධම්මා යනුවෙනි. උපාදිණ්ණ අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටින්ගෙන් යුක්තව කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් ලන්කොට ගන්නාලද උපාදනීයා උපාදනයන්ට හිතවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාව ධර්මකෙනෙක් (සන්ති) සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්. අනුපාදිණ්ණ උපාදනීයා අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටින්ගෙන් යුක්තව කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් ලන්කොට නොගන්නා ලද්දවූ උදක් උපාදනයන්ට හිතවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාව ධර්මකෙනෙක් (සන්ති) සංවිජ්ජන්ති විද්‍යමානවෙත්. අනුපාදිණ්ණ අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටින්ගෙන් යුක්තව කර්මය විසින් තමාගේ ඵල භාවයෙන් ලන්කොට නොගන්නා ලද්දවූ අනුපාදනීයා උපාදනයන්ට හිත නොවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාව ධර්මකෙනෙක් (සන්ති) සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්. උපාදිණ්ණ ත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්? ලෞකික විපාක දෙතිස තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය විසිකර්මජ

රූපය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් සතළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

ස්කන්ධ වශයෙන් කෙසේ පස් වැදෑරුම්වේද යත්? විසිකර්මජ රූපය රූපස්කන්ධ නම්. පංතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනා ස්කන්ධ නම්. සඥා චෛතසිකය සඥා ස්කන්ධ නම්. අතිරික්ත තෙතිස් චෛතසික සංස්කාරස්කන්ධ නම් ලෞකික විපාක දෙතිස විඥානස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්.

ආයතන වශයෙන් කෙසේ එකොළොස් වැදෑරුම් වේද යත්? විසිකර්මජ රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්. ශෞතප්‍රසාද රූපය සොතායතන නම්. ඝාණ ප්‍රසාද රූපය ඝාණායතන නම්. ජිව්හා ප්‍රසාද රූපය ජිව්හායතන නාවි. කාය ප්‍රසාද රූපය කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. ගන්ධ අරමුණ ගන්ධායතන නම්. රස අරමුණ රසායතන නම්. පඨවි තෙජෝ වායො යන භූතත්‍රය සංඛ්‍යාත පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බායතන නම්. ලෞකික විපාක දෙතිස මනායතන නම්. පංතිස් චෛතසිකය ආපො ධාතු ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය හදය රූප ජීවිත රූප ආහාර රූප පරිච්ඡේද රූප උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප සංඛ්‍යාත එකොළොස් සුඛුම රූප ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් එකොළොස් වැදෑරුම්.

ධාතු වශයෙන් කෙසේ සතළොස් වැදෑරුම් වේද යත්? විසිකර්මජ රූපයන් අතුරෙන් චක්ඛුප්‍රසාද රූපය චක්ඛු ධාතු නම්. …පෙ… කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්. රූප අරමුණ රූපධාතු නම්. ගන්ධ අරමුණ ගන්ධ ධාතු නම්. …පෙ… පඨවි තෙජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බ ධාතු නම්. චක්ඛු විඥානද්වය චක්ඛු විඥාන ධාතු නම්. …පෙ… කාය විඥාන ද්වය කාය විඥාන ධාතු නම්. සම්පටිච්ඡනද්වය මනො ධාතු නම්. අතිරික්ත ලෞකික විපාක විස්ස මනො විඥාන ධාතු නම්. පංතිස් චෛතසිකය ආපො ධාතු …පෙ… උපච්ඡේද රූප උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප සංඛ්‍යාත එකොළොස් සුඛුම රූප ධම්ම ධාතු නම්.

මෙසේ ධාතු වශයෙන් සතළොස් වැදෑරුම් සත්‍ය වශයෙන් කෙසේ එක් වැදෑරුම්වේද යත්? ලෞකික විපාක දෙතිස පංතිස් චෛතසිකය විසිකර්මජරූප දුක්ඛ සත්‍ය නම්. මෙසේ ආර්‍ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

අනුපාදින්නුපාදනීයා ධම්මා යන ද්විතීය පදයාගේ අභි-ධෙයාර්ථයෝ නම් දෙළොස් අකුසල චිත්තය ලෞකික කුසල් සතළොස විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙපණස චිත්තජ රූප පසළොස ඍතුජ රූප තෙළෙස ආහාරජ රූප දෙළොස ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් සත් වැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ පස්වැදෑරුම් වේද යත්? තිජ රූපයෝ රූපස්කන්ධ නම්. දෙපණස් චෛතසික යන් අතුරෙන් වෙදනා චෛතසිකය වෙදනා ස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤා ස්කන්ධ නම්. අතිරික්ත සමපණස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. දෙළොස් අකුසල චිත්තය ලෞකික කුසල් සතළොස විසික්‍රියා චිත්තය විඤ්ඤාණස්කන්ධ නම් මෙසේ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ සත් වැදෑරුම් වේද යත්? තිජ රූපයන් අතුරෙන් රූප අරමුණ රූපායතන නම්. ...පෙ... පොට්ඨබ්බායතන නම්. දෙළොස් අකුසල්ය – ලෞකික කුසල් සතළොස විසික්‍රියා චිත්තය මනායතන නම්. දෙපණස් චෛතසිකය ආපොධාතු ආහාර රූප පරිච්ඡෙද රූප කාය විඤ්ඤත්ති රූප වචී විඤ්ඤත්ති රූප ලහුතා රූප මුදුතා රූප කම්මඤ්ඤතා රූප උපචය රූප සන්තති රූප ජරතා රූප අනිච්චතා රූප සංඛ්‍යාත සුඛුම රූප දෙළොස ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් සත් වැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ අට වැදෑරුම් වේද යත්?

තිජ රූපයන් අතුරෙන් රූප අරමුණ රූප ධාතු නම් ...පෙ... පොට්ඨබ්බ ධාතු නම්. පංචද්වාර වජ්ජන චිත්තය මනො ධාතු නම්. දෙළොස් අකුසල්ය. ලෞකික කුසල් සතළොස එකුන් විසි ක්‍රියා චිත්තය මනො විඤ්ඤාණ ධාතු නම්. දෙපණස් චෛතසිකය හා ආපොධාතු ආහාර රූ ...පෙ... අනිච්චතා රූප සංඛ්‍යාත සුඛුම රූප දෙළොස ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම්.

සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? දෙළොස් අකුසල්ය. ලෞකික කුසල් සතළොස විසික්‍රියා චිත්තය ලොභ වර්ජිත එක් පණස් චෛතසිකය තිජරූප පසළොස දුක්ඛ සත්‍ය නම් ලොභ චෛතසිකය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්

අනුපාදින්නඅනුපාදනීයා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර සිත් අටයි. තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේද යත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධ නම්. අතිරික්ත සූතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. ලොකොත්තර සිත් අට විඤ්ඤාණස්කන්ධ නම්. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්තවේ. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම් වේ.

ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? ලොකොත්තර සිත් අට මනායතන නම්. සතිස් චෛතසිකය හා නිර්වාණය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්? ලොකොත්තර සිත් අට මනො විඤ්ඤාණ ධාතු නම්. සතිස් චෛතසිකය හා නිර්වාණය ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේද යත්?

නිර්වාණය නිරොධ සත්‍ය නම්. සතරමාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි ...පෙ... සම්මා සමාධි යන සොවාන් මාර්ගාඞ්ගයෝ අට දෙන එක්වරක් සත්දෙන සතරවරක් ...පෙ... අර්හත් මාර්ගාඞ්ගයෝ අට දෙන එක්වරක් සත්දෙන සතරවරක් යන මොහු මාර්ගසත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ එකුන් තිස ඵල චිත්තොත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්තවේ.

මේ ශබ්දවලි තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම් වෙයි. මූල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාමා ත්‍රික නම් වෙයි. සියළු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදාළ බැවින් නිප්පදෙස ත්‍රික නම් වෙයි. උපාදිණ්ණ ත්‍රිකයයි.

5. උපාදිණ්ණ ත්‍රිකයට අනතුරුව සඞ්කිලිට්ඨ ත්‍රිකය වදාළ සේක. එහි ප්‍රථම පදය ද්විතීය පදය තෘතීය පදයාගේ වශයෙන් තෙව දෑරුම්. එයින් ප්‍රථම පදය පළමු කොට වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? සඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා යනුවෙති. අනතුරුව ද්විතීය පදය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? අසඞ්කිලිට්ඨ සඞ්කිලෙසිකා ධම්මා යනුවෙති. තදනන්තරව තෘතීය පදය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසිකා ධම්මා යනුවෙති. සඞ්කිට්ඨ කෙලෙසුන් විසින් කෙලෙසන ලද්දවූ ද සඞ්කිලෙසිකා කෙලෙසුන්ට හිතවූ ද (ධම්මා ...පෙ... සනාති ...පෙ... වෙත්) අසඞ්කිලිට්ඨ කෙලෙසුන් විසින් නො කෙලෙසන ලද්දවූ ද සඞ්කිලෙසිකා කෙලෙසුන්ට හිතවූ ද (ධම්මා

…පෙ… සනාති …පෙ… වෙත්.) අසඞ්කිලිට්ඨ කෙලෙසුන් විසින් නො කෙලෙසන ලද්දවූ ද අසඞ්කිලෙසිකා කෙලෙසුන්ට හිත නොවූ ද (ධම්මා …පෙ… සනාති …පෙ… විද්‍යමාන වෙත්.)

සඞ්කිලිට්ඨ ත්‍රික ප්‍රථම පාදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල චිත්තය හා සත් විසි චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (ඔවුන්ගේ බෙදීම කුසල ත්‍රික දුතිය පදය හා සමානයි.)

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික කුසල් සතළොස ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ පස් වැදෑරුම්වේද යත්? අටවිසි රූපය රූපස්කන්ධ නම්. අටතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය වේදනාස්කන්ධ නම්. සඤ්ඤා චෛතසිකය සඤ්ඤාස්කන්ධ නම්. අතිරික්ත සතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. ලෞකික කුසල් සතළොස ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දොළොස් වැදෑරුම්වේද යත්? අට විසි රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛායතන නම්. …පෙ… කාය ප්‍රසාද රූපය කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. …පෙ… පඨවි තෙජෝ වායො යන භූතත්‍රය සඞ්ඛ්‍යාත පොට්ඨබ්බ අරමුණ පොට්ඨබ්බායතන නම්. ලෞකික කුසල් සතළොස ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය මනායතන නම් අටතිස් චෛතසිකය ආපො ධාතු …පෙ… අතිච්ඡතා රූප සඞ්ඛ්‍යාත සොළොස් සූක්ෂ්ම රූප ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ අටළොස් වැදෑරුම් වේද යත්? අට විසි රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු ධාතු නම්. …පෙ… කාය ප්‍රසාද රූපය කාය ධාතු නම්. රූප අරමුණ රූප ධාතු නම්. …පෙ… පඨවි තෙජෝ වායො යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශ අරමුණ පොට්ඨබ්බ ධාතු නම්. චක්ඛු විඤ්ඤාණද්වය චක්ඛු විඤ්ඤාණ ධාතු නම්. …පෙ… පඤ්චද්වාරාවජ්ජනය හා සම්පටිච්ඡන දෙතිස මනො ධාතු නම්. අතිරික්ත ලෞකික කුසල් සතළොස ලෞකික විපාක විස්ස එකුන් විසි ක්‍රියා චිත්තය මනො විඤ්ඤාණ ධාතු නම්.

අටතිස් චෛතසිකයහ ආපෝ ධාතු ... පෙ ... අභිඥ්ඣා රූප සංඛ්‍යාත සොළොස් සුඛුම රූප ධම්ම ධාතු නමි. මෙසේ ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ එක් වැදෑරුම් වේද යත්? ලෞකික කුසල් සතළොස ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය අටවිසි රූපය යන මේ ධර්මයෝ දුක්ඛ සත්‍ය නමි. මෙසේ ආයෂ් සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

අසඞ්කිලිට්ඨ අසඞ්කිලෙසිකා ධම්මා යන තෘතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකෝත්තර සිත් අට සත් සමප්‍රයුක්ත සතිස් චෛතසිකය හා නිර්වානය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (ඔවුන්ගේ බෙදීම උපාදින්න ත්‍රික තුන්වන පදය හා සමානයි.) මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම් වෙයි. මුල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම් වෙයි. සියළු පරමාර්ථ ධර්මයන් ඇතුළත් කොට වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම් වෙයි.

සඞ්කිලිට්ඨ ත්‍රිකයයි.

6. සඞ්කිලිට්ඨ ත්‍රිකයට අනතුරුව විතර්ක ත්‍රිකය වදළසේක. හෙද ප්‍රථම පදය ද්‍විතීය පදය තෘතිය පදයාගේ වශයෙන් තෙවැදෑරුම්. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමු කොට වදළසේක. කෙසේ වදළසේක්ද යත්? සවිතක්කා සවිචාරා ධම්මා යනුවෙනි. තදනන්තරව ද්‍විතීය පදය වදළසේක. කෙසේ වදළසේක්ද යත්? අවිතක්කා විචාර මත්තා ධම්මා යනුවෙනි. තදනන්තරව තෘතිය පදය වදළසේක. කෙසේ වදළසේක්ද යත්? අවිතක්කා අවිචාරා ධම්මා යනු වෙනි.

සවිතක්කා සවිචාරා විතර්ක විචාර සහිතවූ ධම්මා නිසත්ත නිජ්ජීව සවභාව ධර්ම කෙනෙක් (සන්ති සංවිජ්ජන්ති) විද්‍යමාන වෙත්. අවිතක්කා විතර්ක රහිතවූ විචාර මත්තා විචාරමාත්‍රයක් ඇත්තාවූ ධම්මා ... පෙ ... සන්ති ... පෙ ... වෙත්. අවිතක්කා අවිචාරා විතර්ක විචාර රහිතවූ ධම්මා ... පෙ ... සන්ති ... පෙ ... විද්‍යමාන වෙත්.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් විතක්ක විචාර සහිතවූ පස් පණස් චිත්තය සත් සමප්‍රයුක්ත (විතර්ක විචාර වර්ජිත) සම පණස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් තෙවැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේද යත්? සම පණස් චෛතසිකයන්

අතුරෙන් වේදනා තොමෝ වේදනා ස්කන්ධ නම්. සඤ්ඤා තොමෝ සංඥා ස්කන්ධ නම්. අතිරික්ත අට සාලිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. සවිතක්ක සවිචාර සිත් පස් පණස විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? පස් පණස් චිත්තය මනායතන නම්. සම පණස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ තෙවැදෑරුම් වේද යත්? පඤ්චද්වාරාවජ්ජන චිත්තය හා සම්පටිච්ඡනද්වය මනෝ ධාතු නම්. අතිරික්ත දෙපණස් චිත්තය මනෝ විඤ්ඤාණ ධාතු නම්. සම පණස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් තෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ තෙවැදෑරුම් වේද යත්? ලෞකික සවිතක්ක සවිචාර සිත් සත් සාලිස ලෝභ වර්ජිත තත් සම්ප්‍රයුක්ත චෛතසික එකුන් පණස දුක්ඛසත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි සම්මා වාචා …පෙ… සම්මා සමාධි යන සෝවාන් මාර්ගාඞ්ගයෝ සත් දෙන සකෘදාගාමි මාර්ගාඞ්ගයෝ සත් දෙන අනාගාමි මාර්ගාඞ්ගයෝ සත් දෙන අර්හත් මාර්ගාඞ්ගයෝ සත් දෙන මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තෝත්පාදයෝ අටවිසිදෙන ඵල චිත්තෝත්පාදයෝ පන්තිස් දෙන සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම්.

අවිතක්ක විචාර මත්තා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ද්විතීය ධ්‍යාන සිත් එකොළොස තත් සම්ප්‍රයුක්ත විතක්ක විචාර වර්ජිත සතිස් චෛතසිකය සවිතක්ක සවිචාර සිත්හි යෙදුනාවූ පස් පණස් විතර්කයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධවශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේ ද යත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ …පෙ… සඤ්ඤාස්කන්ධ නම්. අතිරික්ත සූතිස් චෛතසිකයෝ සහ පස් පණස් විතර්කයෝ …පෙ… ද්විතීය ධ්‍යාන සිත් එකොළොස විඤ්ඤාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? ද්විතීයධ්‍යාන සිත් එකොළොස මනායතන නම්. සතිස් චෛතසික හා පස් පණස් විතර්කයෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? ද්විතීයධ්‍යාන සිත් එකොළොස මනෝ විඤ්ඤාණ ධාතු නම්. සතිස්

චෛතසික හා පස් පණස් විතර්කයෝ ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? ලෞකික ද්විතීයධ්‍යාන සිත් තුන තත් සම්ප්‍රයුක්ත විචාර වර්ජිත තෙතිස් චෛතසික හා විතර්කයෝ සත් සාළිස දුක්ඛ සත්‍ය නම්. සතර මාර්ග ද්විතීයධ්‍යානයන් සමග යෙදුනාවූ (සම්මා සඞ්කප්ප වර්ජිත) සෝවාන් මාර්ගාඞ්ගයෝ සත් දෙන --පෙ-- අර්හත් මාර්ගාඞ්ගයෝ සත් දෙන හා ප්‍රථමධ්‍යාන සම්මා සංකප්පයෝ සිව් දෙන මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ අට විසි දෙන ඵල චිත්තොත්පාදයෝ පන් තිස් දෙන හා ප්‍රථමධ්‍යාන විතර්කයෝ සිව් දෙන සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

අවිතක්ක අවිචාරා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අවිතර්ක අවිචාර සිත් පස් පණසය තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ද්විතීයධ්‍යාන සිත් එකොළොසෙහි යෙදුනාවූ විචාරයෝ එකොළොස් දෙනාය අට විසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් සතළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ පස් වැදෑරුම් වේද යත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ වේදනාස්කන්ධ නම්. සංඥා තොමෝ සංඥාස්කන්ධ නම්. අතිරික්ත සූතිස් චෛතසික හා විචාර චෛතසිකයෝ එකොළොස සංස්කාරස්කන්ධ නම්. අවිතර්ක අවිචාර සිත් පස් පණස විඥානස්කන්ධ නම්. නිර්වාණය ස්කන්ධ විනිර්මුක්ත වේ. මෙසේ ස්කන්ධ වශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දොළොස් වැදෑරුම් වේද යත්? අට විසි රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛාවායතන නම්. --පෙ--කායායතන නම්. රූප අරමුණ රූපායතන නම්. --පෙ-- පෘථිවි තේජෝ වායෝ යන භූත ත්‍රය සංඛ්‍යාත ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බායතන නම්. අවිතර්ක අවිචාර සිත් පස් පණස මනායතන නම්. සතිස් චෛතසිකය විචාර චෛතසික එකොළොස ආපෝ ධාතු--පෙ--අනිච්චතා රූප සංඛ්‍යාත සොළොස් සූක්ෂම රූප හා නිර්වාණය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ සතළොස් වැදෑරුම් වේද යත්? අට විසි රූපයන් අතුරෙන් චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු ධාතු නම්. --පෙ--කාය ධාතු නම්. රූප අරමුණ රූප ධාතු නම්. --පෙ-- පෘථිවි තේජෝ වායෝ යන භූත ත්‍රය සංඛ්‍යාත ඵොට්ඨබ්බ අරමුණ ඵොට්ඨබ්බ ධාතු නම්;

චක්ඛු විඤ්ඤාණමෙව චක්ඛු විඤ්ඤාණ ධාතු නම්. ...පෙ... කාය විඤ්ඤාණ ධාතු නම්. අතිරිත්ත අවිතර්ක අවිචාර සිත් පන් සාළිස මනො විඤ්ඤාණ ධාතු නම්. සතිස් චෛතසිකය ද්විතීයධ්‍යාන විචාර චෛතසික එකොළොස ආපො ධාතු ...පෙ... අතිවර්ජිත රූප සංඛ්‍යාත සූක්ෂ්ම රූප සොළස හා නිර්වාණය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් සතළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ තෙවැදෑරුම් වේද යත්? ලෞකික අවිතර්ක අවිචාර සිත් එක් තිස තත් සම්ප්‍රයුක්ත චෛතසික සතිස ලෞකික ද්විතීයධ්‍යාන විචාර චෛතසික තිදෙන අට විසි රූපය දුක්ඛ සත්‍ය නම්. නිර්වාණය නිරොධ සත්‍ය නම්. සතර මාර්ග අවිතර්ක අවිචාර සිත් සමග යෙදුනාවූ (සම්මා සඞ්කප්ප වජ්ජිත) සම්මා දිට්ඨි ...පෙ... සම්මා සමාධි යන සොවාන් මාර්ගාඞ්ගයෝ සත් දෙන ...පෙ... අර්හත් මාර්ගාඞ්ගයෝ සත් දෙන මාර්ග සත්‍ය නම්. අතිරිත්ත මාර්ග චිත්තොත්පාදයෝ අට විසි දෙන ඵල චිත්තොත්පාදයෝ පන් තිස් දෙන ලොකොත්තර ද්විතීයධ්‍යාන සමග යෙදුනු විචාරයෝ අට දෙන සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. මේ ශබ්දාවලි තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම්. මුල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදි ලබ්ධ නාම ත්‍රික නම්. සවිතර්ක සවිචාර සිත් පස් පණස සමග යෙදුනාවූ විචාර චෛතසික පස් පණස ඇතුළත් කොට නො වදාළ හෙයින් සප්පදෙස ත්‍රික නම්.

### විතර්ක ත්‍රිකයයි.

(මේ ත්‍රික හයේ ස්කන්ධ ආදිය භේද වෙන්කිරීම මෙලෙසින් කට පාඩම් කොට පාඩම් කීම කළහොත් මතු දක්වෙන ත්‍රික දුක යන්ගේ බෙදීම ඉතා පහසුවන බව සියල්ලවුන් විසින් සැලකිය යුත්තේය.)

මේ ත්‍රිකයෙහි සවිතක්ක යන්නෙන් විතර්කය සමග යෙදුනාවූ චිත්ත චෛතසික ලැබෙතත් සවිචාර යන පදය එක්වූ කල්හි විචාරය වර්ජිතවේ. මෙලෙසින් ප්‍රථම පදයෙහි විතර්ක විචාරයෝ වර්ජිත වූහ. ද්වන පෙදෙහි සවිතර්ක සිත් පස් පණසෙහි ඇති විතර්කයන් සමග විචාරය ඇතද අන් විතර්ක කෙනෙක් නොමැති හෙයින් අවිතක්ක විචාරමත්තා යන පදයට ඒ විතර්කයෝ ඇතුළත් වූහයි දතයුතු. ද්විතීයධ්‍යාන සිත් එකොළොසෙහි යෙදුනාවූ විචාරයන් සමග අන් විචාර කෙනෙක් නොමැත. එහෙයින් ඔව්හු අවිචාරද වූහ. භාවනා බලයෙන් පහවූ විතර්ක ඇති හෙයින් අවිතර්කද වූහ.

මින් මතු පහසු තැන්හි ස්කන්ධාදිය භේද නො දක්වනු ලැබේ.

7. විතර්ක ත්‍රිකයට අනතුරුව ප්‍රීති ත්‍රිකය වදාළසේක. හෙද෴පෙ෴පළමුකොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? පීතිසහගතා ධම්මා යනුවෙනි. තදනන්තරව දුතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? සුඛසහගතාධම්මා යනුවෙනි. තදනන්තරව තෘතීය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? උපෙක්ඛාසහගතා ධම්මා යනුවෙනි.

(මෙතැන් සිට දැක්වෙන සියළුම ත්‍රික දුක මාතෘකාවසාන යන්හි කියනලද නයින් පූර්වාපර අනුසන්ධි ගළපා කිය යුත්තේය.)

පීතිසහගතා ප්‍රීතිය හා සමග එකොත්පාදාදිභාවයෙන් මිශ්‍රවූ ධම්මා, තිස්සත්ත෴පෙ෴විද්‍යමාන වෙත්. සුඛසහගතා මානුසික සුඛවෙදනාව හා එකොත්පාදාදි භාවයෙන් මිශ්‍රවූ ධම්මා෴පෙ෴ විද්‍යමාන වෙත්. උපෙක්ඛාසහගතා මධ්‍යස්ථානුභවනලක්ෂණ උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදාදිභාවයෙන් මිශ්‍රවූ ධම්මා෴පෙ෴ විද්‍යමාන වෙත්.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ප්‍රීති සහගත එක්පණස් චිත්තය ප්‍රීති දොස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත සසාළිස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. (ස්කන්ධ ආයතන ධාතූන්ගේ බෙදීම සුගමයි.) සත්‍ය වශයෙන් කෙසේ තෙවැදෑරුම්වේදයත්? ලෞකික ප්‍රීතිසහගත චිත්තයෝ සත් විසිදෙන තත් සම්ප්‍රයුක්ත ලොභ වර්ජිත පන්සාළිස් චෛතසිකය දුක්ඛසත්‍ය නම්. ලොභය සමුදය සත්‍ය නම්. සතර මාර්ග ප්‍රීති සහගත චිත්තයන් සමග යෙදුනාවූ සම්මාදිට්ඨි෴පෙ෴සම්මාසමාධි යන ශ්‍රොතාපත්ති මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන දෙවරක් ෴පෙ෴අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන දෙවරක් යන මෙතෙක් ධර්මයෝ මාර්ගසත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ අටවිසිදෙන ප්‍රීතිසහගත ඵල චිත්තොත්පාදයෝ සතිස් දෙන සත්‍ය විනිර්මුක්තයි.

සුඛසහගතාධම්මා යන දුතිය පදයාගේ අභිධෙයාර්ථ හා ඔවුන්ගේ බෙදීම වේදනා ත්‍රික ප්‍රථම පදයට සමානයි. උපෙක්ඛාසහගතාධම්මා යන තෘතීය පදයාගේ සියළුම විභාග වේදනා ත්‍රික තුන්වන පදයට කියන ලද විස්තර විභාගමැයි. මේ ශබ්දාවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළහෙයින් ත්‍රික නමි. මුල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම්. ද්වෙෂ මූල දෙසිත දුක්ඛ සහගත කාය විඤ්ඤාණය

තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය ප්‍රීති චෛතසික එක්පණස සුඛවේදනා තෙසැට උපෙක්ෂාවේදනා පස්පණස අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයට ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස ත්‍රික නම්.

## ප්‍රීති ත්‍රිකයයි

8. ප්‍රීති ත්‍රිකයට අනතුරුව දස්සන ත්‍රිකය වදාළසේක. (සෙසු අනුසන්ධිය පෙරකීනයැමැයි.) 1. දස්සනෙන පහාතබ්බා ධම්මා 2. භාවනාය පහාතබ්බා ධම්මා 3. නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා දස්සනෙන සෝවාන් මගින් පහාතබ්බා ප්‍රහාණය කටයුතුවූ ධම්මා...පෙ...සනාති...පෙ...භාවනාය මතු මාර්ගත්‍රයෙන් පහාතබ්බා ප්‍රහාණය කටයුතුවූ ධම්මා...පෙ...සනාති ...පෙ...දස්සනෙන සෝවාන් මගින් නෙව පහාතබ්බා ප්‍රහාණය නොකටයුතුවූද භාවනාය මතුමාර්ගත්‍රයෙන් න පහාතබ්බා ප්‍රහාණය නොකටයුතුවූද ධම්මා...පෙ...සනාති...පෙ...දස්සන ත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෝවාන් මගින් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නාවූ දිට්ඨිගත සම්පයුත්ත සිත් සතරය විචිකිච්ඡා සහගත චිත්තය තත් සම්ප්‍රයුක්ත මාන දොස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච වර්ජිත දෙවිසි චෛතසිකය සෝවාන් මගින් තුනී කටයුතුවූ අපායගාමිණී ශක්තියෙන් යුත් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය, ද්වේෂ මූල දෙසිතය, දිට්ඨි විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව්වැදෑරුම් වේදයත්? සත්විසි චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ වේදනාස්කන්ධ නම්...පෙ...අකුසල සිත් එකොළොස විඤ්ඤාණ ස්කන්ධ නම් ...පෙ...සත්විසි චෛතසිකය ධම්ම ධාතු නම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම්වේදයත්? අකුසල සිත් එකොළොස ලෝභ වර්ජිත සවිසි චෛතසිකය දුක්ඛසත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදයසත්‍ය නම්. මෙසේ ආයසී සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

භාවනාය පහාතබ්බා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, සකෘදාගාමි මාර්ගයෙන් තුනීකිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතුවූ ඖදාරික දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය ඖදාරික ද්වේෂ මූල දෙසිතය, අනාගාමි මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතුවූ කාමරාගයෙන් යුක්තවූ දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරය, ද්වේෂමූල දෙසිතය, අර්හත් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කටයුතුවූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාවන් සමග යෙදුනාවූ දිට්ඨිගත විප්පයුත්ත සිත්

සතරය, උද්ධච්ච සහගත චිත්තය දිට්ඨි විචිකිච්ඡා වජ්ජිත පස්විසි චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව්වැදෑරුම්වේද යත්? පස්විසි චෛතසිකයන් අතුරෙන් වේදනාතොමෝ—පෙ— අකුසල සිත් සත විඤ්ඤාණස්කන්ධ නම්—පෙ—අකුශල් සිත් සත ලෝභ වජ්ජිත සූවිසි චෛතසිකය දුක්ඛ සත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එක්විසි කුසල් සිත්ය. සතිස් විපාක සිත්ය, විසි ක්‍රියා සිත්ය, තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය, අටවිසි රූපය, නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. (මෙහි ස්කන්ධ ආයතන ධාතූන් බෙදා දැක්වීම යට කියනලද නයින් දතයුතුයි.)

සත්‍ය වශයෙන් කෙසේ තෙවැදෑරුම්වේදයත්? ලෞකික කුසල් සතළොස ලෞකික විපාක දෙතිස විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසිරූපය දුක්ඛ සත්‍ය නම්. නිර්වාණය නිරෝධ සත්‍ය නම්. සතරමාර්ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි —පෙ—සම්මාසමාධි යන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතරවරක්—පෙ—අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් යන මෙතෙක් ධර්මයෝ මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ එකුන් තිස ඵල චිත්තොත්පාදයෝ සත් තිස සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. මේ ශබ්දවලී තොමෝ—පෙ—ත්‍රික නම්. මුල් පෙදින් ලබනලද නම් ඇති හෙයින් ආදිලබ්ධනාම ත්‍රික නම්. සියළු—පෙ—වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම්.

දස්සන ත්‍රිකයයි

9. දස්සන ත්‍රිකයට අනතුරුව දස්සන හේතු ත්‍රිකය වදාළසේක. (සෙස්සයට මෙහි) 1. දස්සනෙන පහාතබ්බ හෙතුකා ධම්මා 2. භාවනාය පහාතබ්බ හේතුකා ධම්මා 3. නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බ හෙතුකා ධම්මා දස්සනෙන සෝවාන් මඟින් පහාතබ්බ හෙතුකා ප්‍රහාණය කටයුතු හේතු ඇති—ධම්මා— සන්ති—පෙ—භාවනාය මතු මාර්ගත්‍රයෙන් පහාතබ්බ හෙතුකා

ප්‍රහාණය කටයුතු හේතු ඇති ධම්මා-පෙ-සන්ති-පෙ-දස්ස නෙන සෝවාන් මගින් නෙව පහාතබ්බ හෙතුකා ප්‍රහාණය කටයුතු හේතු නැත්තාවූද භාවනාය මතු මාර්ගත්‍රයෙන් හ පහා තබ්බ හෙතුකා ප්‍රහාණය කටයුතු හේතු නැත්තාවූද ධම්මා—පෙ—සන්ති—පෙ—මෙකි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෝවාන් මගින් නිරවශෙෂ වශයෙන් ප්‍රහාණය කටයුතු දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරය විචිකිච්ඡා සහගත චිත්තය මාන දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා සහගත සිතෙහි යෙදුනාවූ මෝහය වර්ජිතකොට ඇති දෙවිසි චෛතසිකය සෝවාන් මගින් තුනී කටයුතුවූ අපාය ගාමිණී ශක්ති ඇති දිට්ඨිගත විප්පයුක්ත සිත් සතරය ද්වෙෂ මූල දෙසිතය දිට්ඨි විචිකිච්ඡා වජ්ජිත පස් විසි චෛතසිකය ලැබෙති. (සෙස්ස දස්සන ත්‍රික ප්‍රථම පදය හා සමානයි.) ද්‍රිතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සකෘදගාමි මාර්ගයෙන් තුනීකිරීම් වශයෙන් ප්‍රහාණය කටයුතුවූ ඖදාරික දිට්ඨිගත විප්පයුක්ත සිත් සතරය ද්වෙෂ මූල දෙසිතය අනාගාමි මාර්ගයෙන් නිරවශෙෂ වශයෙන් ප්‍රහාණය කටයුතුවූ කාමරාගයෙන් යුත් දිට්ඨිගත විප්පයුක්ත සිත් සතර හා ද්වෙෂ මූල දෙසිතය අර්හත් මාර්ගයෙන් නිරවශෙෂ වශයෙන් ප්‍රහාණය කටයුතුවූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාවන් සමග යෙදුනාවූ දිට්ඨිගත විප්පයුක්ත සිත් සතර හා උද්ධච්ච සහගත චිත්තය දිට්ඨි විචිකිච්ඡා උද්ධච්ච සහගත සිතෙහි ඇති මෝහය වර්ජිතකොට ඇති පස් විසි චෛතසිකය ලැබෙති. (සෙස්ස දස්සන ත්‍රික ද්‍රිතිය පදය හා සමානයි) තුන්වන පදයාගේ අභිධෙයාර්ථ හා ස්කන්ධාදීන්ගේ බෙදීම් දස්සන ත්‍රික තුන්වන පදය හා සමානයි. (මේ ත්‍රිකයෙහි ප්‍රථම පදයෙන් විචිකිච්ඡා සහගත චිත්තයෙහි යෙදුනාවූ මෝහය හා ද්‍රිතිය පදයෙන් උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදුනාවූ මෝහය වර්ජිත කරණ ලද්දේ තමා සමග යෙදුනාවූ අන් හේතු ධර්මයක් නොමැති බැවිනි. එහෙයින් ඒ මෝහයෝ දෙදෙන ත්‍රික මුක්තවූහ.) මේ ත්‍රිකය ඇඳි ලබධ නාම ත්‍රික නම්. මෝහ මූල ද්විත්වයෙහි මෝහය බැහැරකොට වදල හෙයින් සප්පදෙස ත්‍රික නම්.

## දස්සන හෙතු ත්‍රිකයයි

10. දස්සන හෙතු ත්‍රිකයට අනතුරුව ආචයගාමි ත්‍රිකය වදලසේක. හෙද—පෙ—යනුවෙති. ආචයගාමිනො කම්මකෙලශ යන් විසින් රැස්කරණු ලබන්නාවූ (හෙවත්) ච්‍යුතිප්‍රතිසන්ධිය එලවිය හැකිවූ ධම්මා—පෙ—(සන්ති—පෙ—) අපචයගාමිනො නිර්වාණය එලවිය හැකිවූ ධම්මා—පෙ—(සන්ති—පෙ—) නෙවාචය ගාමිනො ච්‍යුතිප්‍රතිසන්ධි එලවිය නොහැකිවූද න අපචයගාමිනො

නිර්‍වාණය එළඹීම නොහැකිවූද ධම්මා—පෙ—(සන්ති—පෙ—) මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම් දෙළොස් අකුසල්ය. ලෞකික කුසල් සතළොසය තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය ලැබෙති ඒ ධර්‍මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (බෙද වෙන්කිරීම සුගමයි.)

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම් සතරමාර්‍ග චිත්තය තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්‍මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක්වැදෑරුම්. (ස්කන්ධාදිය බෙදීම සුගමයි.) සතරමාර්‍ග සම්ප්‍රයුක්ත සම්මාදිට්ඨි—පෙ—සම්මා සමාධි යන ශ්‍රොතාපත්ති මාර්‍ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක්—පෙ—අර්‍හත් මාර්‍ගාඞ්ගයෝ අටදෙන එක්වරක් සත්දෙන සතරවරක් යන මෙතෙක් ධර්‍මයෝ මාර්‍ග සත්‍ය නම්. අතිරික්ත මාර්‍ග චිත්තොත්පාදයෝ එකුන් තිස සත්‍ය විනිර්මුක්තයි. මෙසේ ආරිය සත්‍ය වශයෙන් එක්වැදෑරුම්. තෘතීය පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම් සතිස් විපාක චිත්තය විසි ක්‍රියා චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසිරූපය නිර්‍වාණය යන මෙතෙක් ධර්‍මයෝ ලැබෙති. ඒ ධර්‍මයෝ ස්කන්ධ වශයෙන් පස් වැදෑරම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (බෙද වෙන් කිරීම සුගමයි) මේ ශබ්දවලී තොමෝ—පෙ—ත්‍රික නම්—පෙ—ආදිලබ්ධනාමත්‍රික නම්—පෙ—තිපපදෙස ත්‍රික නම්.

## ආචය ගාමි ත්‍රිකයයි

11. ආචයගාමිත්‍රිකයට අනතුරුව සෙක්ඛත්‍රිකය වදළසේක. භෙද—පෙ—යතුවෙති. සෙක්ඛා ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන්නාවූ සප්තවිධ ශෛක්‍ෂයින්ට අයත්වූ ධම්මා—පෙ—(සන්ති—පෙ—) නෙවසෙක්ඛා ශෛක්‍ෂයින්ට අයත් නොවූද නාසෙක්ඛා අශෛක්‍ෂයින්ට අයත් නො වූ ද ධම්මා—පෙ—(සන්ති—පෙ—)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම් අර්‍හත් ඵල වර්‍ජිත ලොකොත්තර සිත් සතය තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්‍මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්. (බෙද වෙන්කිරීම සුගමයි)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අභීත් එල චිත්තය හා තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ—පෙ—4 ආයතන—පෙ—2 ධාතු—පෙ—2 සත්‍ය විනිර් මුක්තයි. (බෙදීම සුගමයි)

තෘතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ—පෙ—5 ආයතන—පෙ—12 ධාතු—පෙ—18 සත්‍ය—පෙ—3 (බෙද වෙන්කිරීම යටකී නයානුසාරයෙන් දතයුතු) මේ ශබ්දවලී තොමෝ—පෙ—ආදිලබ්ධනාම ත්‍රික නම්—පෙ—තිප්පදෙස ත්‍රික නාම්.

## සෙකඛ ත්‍රිකයයි

12. සෙකඛ ත්‍රිකයට අනතුරුව පරිත්ත ත්‍රිකය වදාළසේක. හෙද—පෙ—යනුවෙති. පරිත්තා අල්ප ආනුභාව ඇත්තාවූ ධම්මා—පෙ—(සනාති—පෙ—) මහග්ගතා මහත් බවට පැමිණි හෙයින් ධ්‍යානලාභීන්ට අයත්වූ ධම්මා—පෙ—(සනාති—පෙ ) අප්පමාණා රාගාදි කෙලෙසුන්ට විරුද්ධ හෙයින් ප්‍රමාණ නොකළහැකිවූ ධම්මා—පෙ—(සනාති—පෙ—) මෙහි ප්‍රථම පදයාගේ අභිධෙ-යාර්ථයෝ නම් සිව්පණස් කාමාවචර චිත්තය තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ—පෙ—5 ආයතන—පෙ—12 ධාතු—පෙ—18 සත්‍ය—පෙ—දෙවැදෑරුම්. (බෙද වෙන්කිරීම යටකී නයානුසාරයෙන් කළ යුතු)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සත්විසි මහග්ගත චිත්තය තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය ලැබෙති. ඒ ස්කන්ධ—පෙ—4 ආයතන—පෙ—2 ධාතු—පෙ—2 සත්‍ය වශයෙන් දුක්ඛසත්‍ය නම්. (සෙස්ස සුගමයි)

තෘතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝකෝත්තර සිත් අටය තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙසස උපදිණ්ණත්‍රික තුන්වන පදය හා සමානයි) මේ ශබ්දවලී තොමෝ—පෙ—ආදිලබ්ධනාම ත්‍රික නම්. —පෙ—තිප්පදෙස ත්‍රික නම්.

## පරිත්ත ත්‍රිකයයි

13. පරිත්ත ත්‍රිකයට අනතුරුව පරිත්තාරම්මණ ත්‍රිකය වදාළසේක. හෙද—පෙ—අප්පමාණාරම්මණා ධම්මා යනුවෙති. පරිත්තාරම්මණා කාමාවචර ධර්මයන් අරමුණුකොට ඇත්තාවූ

ධම්මා—පෙ—(සන්ති—පෙ—) මහග්ගතාරම්මණා මහග්ගත ධර්මයන් අරමුණුකොට ඇත්තාවූ ධම්මා—පෙ—(සන්ති—පෙ—) අප්පමාණාරම්මණා නිර්වාණය අරමුණුකොට ඇත්තාවූ හෝහොත් අප්‍රමාණ ධර්මයන්ම අරමුණුකොට ඇත්තාවූ ධම්මා—පෙ—(සන්ති සංවිජ්ජන්ති) විද්‍යමාණ වෙත්.

පරිත්තා රම්මණ ත්‍රිකා ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් කාම ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ තෙවිසි කාමවිපාක චිත්තය පඤ්චද්වාරා වජ්ජන චිත්තය හසිතුප්පාද චිත්තය තත්සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකය කාමධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ හසිතුප්පාද වර්ජිත අටවිසි කාමජවනය මනෝද්වාර වජ්ජනය අභිඥකෘත්‍යවත් පඤ්චම ධ්‍යාන දෙසිත තත්සම්ප්‍රයුක්ත අප්‍රමණ්‍ය වර්ජිත සම් පණස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේදයත්? සම් පණස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ-පෙ-සංස්කාර ස්කන්ධ නම් පරිත්තා රම්මණික සපණස් චිත්තය විඥානස්කන්ධ නම් මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? පරිත්තා රම්මණික සපණස් චිත්තය මනායතන නම්. සමපණස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ අටවැදෑරුම් වේද යත්? සපණස් චිත්තයන් අතුරෙන් චක්ඛු විඥානද්වය—පෙ—කාය විඥාන ධාතු නම්. පඤ්චද්වාරා වජ්ජනය හා සම්පටිච්ඡනද්වය මනෝධාතු නම්. අතිරික්ත තෙසාලිස් චිත්තය මනෝ විඥාන ධාතු නම්. සමපණස් චෛතසිකය ධම්ම ධාතු නාම්. මෙසේ ධාතු වශයෙන් අට වැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්, සපණස් චිත්තය ලෝභ වර්ජිත එකුන්පණස් චෛතසිකය දුක්ඛ සත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

මහග්ගතා රම්මණා ධම්මායන ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්. මහග්ගත ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ විඥානඤ්චායතන නේවසඤ්ඤා නාසඤ්ඤායතන චිත්තයෝ සදෙන තත් සම්ප්‍රයුක්ත සමතිස් චෛතසිකය මහග්ගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ හසිතුප්පාද වර්ජිත අටවිසිකාම ජවන මනෝද්වාර වජ්ජන චිත්තය අභිඥදෙසිත

තත්සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාළිස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍යවශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේදයත්? සත් සාළිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ —පෙ— සංස්කාරස්කන්ධ නම්. මහග්ගතා රම්මණික සත්තිස් චිත්තය විඥානස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත් මහග්ගතා රම්මණික සත්තිස් චිත්තය මනායතන නම්. සත්සාළිස් චෛතසිකය ධම්මායතන නම්. ධාතු වශයෙන්—පෙ—ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? මහග්ගතා රම්මණික සත්තිස් චිත්තය ලෝභ වර්ජිත සසාළිස් චෛතසිකය දුක්ඛ සත්‍ය නම්. ලෝභ චෛතසිකය සමුදය සත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

අප්පමාණා රම්මණා ධම්මායතන තෘතිය පදයාගේ අභිධේයාර්ථයෝ නම්. අප්‍රමාණ ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ ලෝකොත්තර සිත් අටය තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය ලෝකොත්තර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මහා කුශල මහා ක්‍රියා ඥාණසම්ප්‍රයුක්ත සිත් අටය මනොද්වාර වර්ජන චිත්තය අභිඥා දෙසිතය තත්සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත සතිස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේදයත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ වේදනා ස්කන්ධ නම්. සඥා තොමෝ සඥා ස්කන්ධ නම්. අතිරික්ත සූතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. අප්‍රමාණා රම්මණික එකුන් විසි චිත්තයෝ විඥානස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? එකුන් විසි චිත්තයෝ මනායතන නම්. සතිස් චෛතසිකයෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? එකුන් විසි චිත්තයෝ මනෝ විඥාන ධාතු නම්. සතිස් චෛතසිකයෝ ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? අප්‍රමාණා රම්මණික ලෞකික චිත්තයෝ එකොළොස් දෙන තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය දුක්ඛ සත්‍ය නම් සතර මාර්ග සම්ප්‍රයුක්ත සම්මා දිට්ඨි—පෙ—සම්මා සමාධි

යන සෝවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් —පෙ—අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් යන මෙතෙක් ධර්මයෝ මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ එකුන්තිස ඵල චිත්තොත්පාදයෝ සත්තිස සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් දෙවැදෑරුම්.

මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදළ හෙයින් ත්‍රික නම්. මුල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධනාම ත්‍රික නම්. ප්‍රඥප්ති ධර්මයන් අරමුණු කරන්නාවූ රූපාරූප එක්විසි චිත්තයන් හා තත් සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයට ඇතුළත් කොට නොවදළ හෙයින් ශපපදෙස ත්‍රික නම්.

### පරිත්තා රම්මණ ත්‍රිකයයි.

14 පරිත්තා රම්මණ ත්‍රිකයට අනතුරුව හීනත්‍රිකය වදළ සේක. හෙද, ප්‍රථම පදය–පෙ–තෙවැදෑරුම් වේ, —පෙ— පණීතා ධම්ම යනුවෙන් හීනා ලාමකවූ ධම්මා—පෙ—සන්ති—පෙ—වෙත් මජ්ඣිමා මධ්‍යම වූ ධම්මා—පෙ—සන්ති--පෙ--වෙත්. පණීතා ප්‍රණීතවූ හෙවත් උතුම් වූ ධම්මා--පෙ--සන්ති--පෙ--විද්‍යමාන වෙත්. මේ හීනත්‍රිකයෙහි අභිධෙයාර්ථ හා ස්කන්ධාදිය බෙද වෙන් කිරීම සඞ්කිලිට්ඨ ත්‍රිකයට සමානය.

### හීන ත්‍රිකයයි

15. හීන ත්‍රිකයට අනතුරුව මිච්ඡත්ත ත්‍රිකය වදළසේක. හෙද, ප්‍රථම--පෙ—තෙවැදෑරුම්. ඔවුනතුරෙන්—පෙ- මිච්ඡත්ත නියතා ධම්මා යනුවෙති. තදනන්තරව ද්විතීය--පෙ--සම්මත්ත නියතා ධම්මා යනුවෙති. තදනන්තරව--පෙ--අනියතා ධම්මා යනුවෙති.

මිච්ඡත්ත නියතා, විපරීත සවභාව ඇති බැවින් චුතියට අනතුරුව විපාක දීම නියත කොට ඇත්තාවූ ධම්මා--පෙ--සන්ති--පෙ--සම්මත්ත නියතා අවිපරීත සවභාව ඇති හෙයින් තමාගේ පැවත්මට අනතුරුව විපාක දීම ඒකාන්ත කොට ඇත්තාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—අනියතා, විපරීත සවභාව යෙන් හෝ අවිපරීත සවභාවයෙන් අනෛකාන්තවූ ධම්මා--පෙ—සන්ති—පෙ—මිච්ඡත්තත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, නියත මිථ්‍යාදෘෂ්ටිකර්ම වශයෙන් හටගන්නාවූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්තවීථි සතරෙහි සත්වන ජවනයෝය. මාන දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත තත්සම්ප්‍රයුක්ත එක්විසි චෛතසිකයෝය. මාතුඝාතකාදි ආනන්තරිය කර්ම

වශයෙන් පවත්නාවූ දෙසමූලික චිත්තවීථිවලයෙහි සත්වන ජවනයෝය. පීති ලෝභ දිට්ඨි මාන විචිකිච්ඡා වර්ජිත තත්සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකයෝය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව්වැදෑරුම් වේද යත්? මාන විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ වේදනාස්කන්ධ නම්. ...පෙ... අකුසල් සිත් සය විඤ්ඤාණ ස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. (සෙස්ස සුගමයි.)

සම්මත්ත නියතා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සතර මාර්ග චිත්තයෝය. තත්සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයෝය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක්වැදෑරුම්. (බෙද වෙන් කිරීම යට කී නයින් කල යුතු )

අනියතා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් නියත මිථ්‍යාදෘෂ්ටි වශයෙන් පැවැත්තාවූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්ත සතරෙහි සත්තම ජවන්හුය පඤ්චානන්තරිය කර්ම වශයෙන් පැවැති දෝමනස්සසහගත වීථිවලයෙහි සත්තම ජවන්හුය සතර මාර්ග චිත්තයෝය යන මොවුන් වර්ජිත කොට ඇති පස් අසූ චිත්තය තත්සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තුන් වැදෑරුම්. (බෙද වෙන් කිරීම සුගමයි.)

මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම්. ...පෙ... නිප්පදෙශ ත්‍රික නම්.

## මිච්ඡත්ත ත්‍රිකයයි

16 මිච්ඡත්ත ත්‍රිකයට අනතුරුව මග්ගාරම්මණ ත්‍රිකය වදාළසේක. හෙද ප්‍රථම පදය ද්විතීය පදය තෘතීය පදයාගේ වශයෙන් තෙවැදෑරුම්. එයින් ප්‍රථම පදය පළමු කොට වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? මග්ගාරම්මණා ධම්මා යනු වෙති. තදනන්තරව ද්විතීය පදය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? මග්ගහෙතුකා ධම්මා යනුවෙති. තදනන්තරව තෘතීය පදය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? මග්ගාධි

පකිනො ධම්මා යනුවෙති. මග්ගාරම්මණා, මාර්ගයම අරමුණු කොට ඇත්තාවූ ධම්මා--පෙ--සජාති--පෙ--වෙත්. මග්ගහෙතුකා මාර්ගයම හේතුකොට ඇත්තාවූ නොහොත් මාර්ග නම් ලත් හේතු ඇත්තාවූ නොහොත් මාර්ගයෙහි පිහිටි හේතු ඇත්තාවූ ධම්මා --පෙ--සජාති--පෙ--" වෙත්. මග්ගාධිපතිනො මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍යය කොට ඇත්තාවූ නොහොත් මාර්ගයෙහි පිහිටි සහජාතාධිපති ප්‍රත්‍යය ඇත්තාවූ නොහොත් මාර්ගයම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තාවූ ධම්මා--පෙ--සජාති--පෙ--මග්ගාරම්මණ ත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෝවාන් මාර්ගය අරමුණු කොට ඇත්තාවූ, සෝවාන් පුද්ගලයාගේ මනොද්වාරාවර්ජනය ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සතරය කුසලාභිඥාවය සෝවාන් සකෘදාගාමි මාර්ගද්වය අරමුණු කරන්නාවූ සකෘදාගාමි පුද්ගලයාගේ මනොද්වාරාවර්ජනය ඥාණසම්ප්‍රයුක්ත මහා කුසල් සතරය කුසලාභිඥා සිතය සෝවාන් සකෘදාගාමි අනාගාමි යන මාර්ගත්‍රය අරමුණු කරන්නාවූ අනාගාමීන් වහන්සේගේ මනොද්වාරාවර්ජනය ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සතරය කුසලාභිඥා සිතය සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ගයට අරමුණු කරන්නාවූ රහතුන්වහන්සේගේ මනොද්වාරාවර්ජනය ඥාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සතරය ක්‍රියාභිඥා සිතය විරති අප්‍රමාණ වර්ජිත තත් සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකයෝය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්. ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේදයත්? තෙතිස් චෛතසිකයන් අතුරෙන් වෙදනා තොමෝ වෙදනා ස්කන්ධ නම්. සංඥා තොමෝ සංඥා ස්කන්ධ නම්. අතිරික්ත එක්තිස් චෛතසිකයෝ සංස්කාර ස්කන්ධ නම්. මග්ගාරම්මණික චිත්තයෝ එකොළොස් දෙන විඥාණස්කන්ධ නම්. මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? මග්ගාරම්මණික චිත්තයෝ එකොළොස් දෙන මනායතන නම්. තෙතිස් චෛතසිකයෝ ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? මග්ගාරම්මණික චිත්තයෝ එකොළොස් දෙන මනොවිඥාණ ධාතු නම්. තෙතිස් චෛතසිකයෝ ධම්මධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් මග්ගාරම්මණික චිත්තයෝ එකොළොස් දෙන හා තත්සම්ප්‍රයුක්ත තෙතිස් චෛතසිකයෝ දුක්ඛසත්‍ය නම්. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම්.

මග්ග හේතුකා ධම්මායන දුතිය පදයාගේ ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබියයුතු අභිධෙය්‍යාර්ථයෝ නම්, මාර්ග සිත් සතරය මාර්ගාංග වර්ජිත තත් සම්ප්‍රයුක්ත අටවිසි චෛතසිකයෝ ලැබෙති. දුතිය අර්ථ විකල්පයෙන් මාර්ග සිත් සතර හා තත් සම්ප්‍රයුක්ත අමෝහ වර්ජිත පන්තිස් චෛතසිකය ලැබෙති. තෘතිය අර්ථය විකල්පයෙන් සතර මාර්ග චිත්තය හා තත් සම්ප්‍රයුක්ත අලෝභ අද්වේෂ වර්ජිත සුතිස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් එක් වැදෑරුම්, ස්කන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේදයත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ-පෙ- සතර මාර්ග චිත්තය විඤ්ඤාණ ස්කන්ධ නම්, ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? සතර මාර්ග චිත්තය මනායතන නම්, සතිස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්, ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? සතර මාර්ග චිත්තය මනොවිඤ්ඤාණ ධාතු නම්, සතිස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් කෙසේ එක් වැදෑරුම් වේදයත්? සතර මාර්ග චිත්තයන් සමග යෙදුනාවූ සම්මා දිට්ඨි ආදි සෝවාන් මාර්ගාංගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක්-පෙ- අර්හත් මාර්ගාංගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් මාර්ග සත්‍ය නමී. අතිරික්ත මාර්ගචිත්තොත්පාදයෝ එකුන් තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ ආර්‍ය්‍ය සත්‍ය වශයෙන් එක් වැදෑරුම් වේ.

මග්ගාධිපතිනො ධම්මා යන තෘතිය පාදයාගේ ප්‍රථම අර්ථ විකල්පයෙන් ලැබිය යුතු අභිධෙය්‍යාර්ථයෝ නම් සෝවාන් මාර්ගය අධිපති කොට අරමුණු කරන්නාවූ සෝවාන් පුද්ගලයාගේ මහා කුසල ඤාණ සම්ප්‍රයුක්ත සිත්සතරය සෝවාන් සකෘදගාමි මාර්ගද්වය අධිපති කොට අරමුණු කරන්නාවූ සකෘදගාමි පුද්ගලයාගේ ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරය සෝවාන් සකෘදගාමි අනාගාමි මාර්ගයන් අධිපතිකොට අරමුණු කරන්නාවූ අනාගාමින් වහන්සේගේ ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරය සතර මාර්ගය අධිපති කොට අරමුණු කරන්නාවූ රහතන් වහන්සේගේ මහා ක්‍රියා සිත් සතරය තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකය ලැබෙති. දුතිය අර්ථ විකල්පයෙන් විරියාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි විරිය වර්ජිත පන්තිස් චෛතසිකයද වීමංසාධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි වීමංස වර්ජිත පන්තිස් චෛතසිකයද ලැබෙති. තුන්වන අර්ථ විකල්පයෙන් විරිය වීමංසයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්.

ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්, සත්‍ය වශයෙන් දෙවැදෑරුම්, සකන්ධ වශයෙන් කෙසේ සිව් වැදෑරුම් වේද යත්? සතිස් චෛතසිකයන් අතුරෙන් වේදනා තොමෝ වේදනා ස්කන්ධ නම්. සඤ්ඤ තොමෝ සඤ්ඤ ස්කන්ධ නම්. අතිරික්ත සූතිස් චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම්. මහා කුසල ක්‍රියා ඤාණ සම්ප්‍රයුක්ත සිත් අට හා සතර මාර්ග චිත්තය විඤ්ඤාණ ස්කන්ධ නම් මෙසේ ස්කන්ධ වශයෙන් සිව් වැදෑරුම්. ආයතන වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේද යත්? මග්ගාරම්මණික සිත් දොළොස මනායතන නම්. සතිස් චෛතසිකය ධම්මායතන නම්. මෙසේ ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? යථෝක්ත දොළොස් චිත්තය මනෝ විඤ්ඤාණ ධාතු නම්. සතිස් චෛතසිකය ධම්ම ධාතු නම්. මෙසේ ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් කෙසේ දෙවැදෑරුම් වේදයත්? ලෞකික මාර්ග රම්මණික චිත්තයෝ අටදෙන හා තෙතිස් චෛතසිකය දුක්ඛ සත්‍ය නම්. සතර මාර්ග සම්ප්‍රයුක්ත සොවාන් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් -පෙ- අර්හත් මාර්ගාඞ්ගයෝ අටදෙන එක් වරක් සත්දෙන සතර වරක් මාර්ග සත්‍ය නම්. අතිරික්ත මාර්ග චිත්තොත්පාදයෝ එකුන් තිස සත්‍ය විනිර්මුක්ත වේ. මෙසේ අංශයී සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන් පද තුනක් කොට වදාළ හෙයින් ත්‍රික නම්. මූල් පෙදින් ලබන ලද නම් ඇති හෙයින් ආදිලබ්ධ නාම ත්‍රික නම්. මාර්ගය අරමුණු නොකරන්නාවූ දොළොස් අකුසල්ය. මනොද්වාරාවජ්ජන වර්ජිත සතළොස් අහෙතුක සිත්ය ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා වර්ජිත කාම ශෝභණ සිත් සොළොසය අභිඥ දෙසිත වර්ජිත මහග්ගත සිත් සත් විස්සය. ඵල සිත් සතරය තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මේතෙක් ධර්මයන් මේ ත්‍රිකයෙන් බැහැර කොට වදාළ හෙයින් සප්පදෙස ත්‍රික නම්.

### මග්ගාරම්මණ ත්‍රිකයයි

17 මග්ගාරම්මණ ත්‍රිකයට අනතුරුව උප්පන්නත්‍රිකය වදාළසේක. එහෙද ප්‍රථම පදය-පෙ-උප්පාදිනො ධම්මා යනුවෙති.

උප්පන්නා උප්පාද ඨිති භංගයන ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නාවූ ධම්මා-පෙ-සනාති-පෙ-අනුප්පන්නා උප්පාද ස්ථිති භංග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයට නොපැමිණියාවූද, ඒ ක්ෂණත්‍රයට පැමිණෙමින් නොපවත්නාවූද ධම්මා-පෙ-සනාති-පෙ-උප්පාදිනෝ උප්පාද ස්ථිති භංග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයට පැමිණීම ස්වභාව කොට ඇත්තාවූ ධම්මා-පෙ-සනාති-පෙ-

උප්පන්නත්‍රික ප්‍රථමපදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උත්පාදස්ථිති භංග සංඛ්‍යාත ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නා ප්‍රත්‍යුත්පන්න කාලික එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍යවශයෙන් තෙවැදෑරුම්. (බෙද වෙන්කිරීම සුගමයි).

අනුප්පන්නා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෙළොස් අකුසල්ය විසි ක්‍රියා සිතය, තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය චිත්තජ රූප සතළොසය ඍතුජරූප පසළොසය ආහාරජ රූප තුදුසය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (ඔවුන්ගේ ස්කන්ධ ආදිය බෙදීම උපාදිණ්ණත්‍රික ද්විතීය පදයට සමාණයි.)

උප්පාදිනො ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සතිස් විපාක චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය විසිකර්මජ රූපය ලැබෙති. (ඒ ධර්මයන්ගේ ස්කන්ධාදිය බෙද වෙන් කිරීම උපාදින්නත්‍රික ප්‍රථම පදය හා සමාණයි.) මේ ශබ්දවලී තොමෝ පරමාර්ථ ධර්මයන්-පෙ-ත්‍රික නම්. මුල් පෙදින් ලබන ලද-පෙ-ආදිලබ්ධ නාම ත්‍රික නම්. නිර්වාණ පරමාර්ථ ධර්මය මේ ත්‍රිකයෙන් බැහැර කොට වදළ හෙයින් සප්පදෙසත්‍රික නම්.

## උප්පන්න ත්‍රිකයයි

18 උප්පන්න ත්‍රිකයට අනතුරුව අතීත ත්‍රිකය වදළසේක. හෙද ප්‍රථම පදය-පෙ-පච්චුප්පන්නා ධම්මා යනුවෙති.

අතීතා උත්පාදදි ක්ෂණත්‍රයට පැමිණ ඉක්ම ගියාවූ ධම්මා -පෙ-සන්ති-පෙ-අනාගතා උත්පාදදී ක්ෂණත්‍රයට නොපැමිණි යාවූ මත්තෙහි පැමිණෙනු ලබන්නාවූ(ධම්මා සන්ති)පච්චුප්පන්නා (ප්‍රත්‍යයක් ඇතිවූ කල්හි) උත්පාදදී ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නාවූ ධම්මා-පෙ-සන්ති-පෙ-අතීතත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ඉපිද නිරුද්ධවූ එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. (ඔවුන්ගේ ස්කන්ධාදිය බෙදීම සුගමයි.)

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් මතු උපදිනු ලබන්නාවූ එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. (ස්කන්ධාදිය බෙද වෙන් කිරීම සුගමයි

පච්චුප්පන්නා ධම්මා තෘතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උත්පාදදි ක්ෂණත්‍රයට පැමිණෙමින් පවත්නාවූ එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. (ඔවුන්ගේ

ස්කන්ධ ආදිය බෙදා වෙන් කිරීමද සුගමයි.) මේ ශබ්දවලි තොමෝ -පෙ- ත්‍රික නම්. මූල් පෙදින් -පෙ- ආදිලබ්ධනාම ත්‍රික නම්. නිර්වාන පරමාර්ථ ධර්මය මේ ත්‍රිකයට ඇතුලත්කොට නොවදාළ බැවින් සප්පදෙස ත්‍රික නම්.

### අතීත ත්‍රිකයයි

19 අතීතත්‍රිකයට අනතුරුව අතීතාරම්මණත්‍රිකය වදාළසේක. එහෙද ප්‍රථම පදය -පෙ- පච්චුප්පන්නාරම්මණා ධම්මා යනුවෙති.

අතීතාරම්මණා ඉපිද නිරුද්ධවූ ධර්මයන් අරමුණු කොට පවත්නා ධම්මා -පෙ- සන්ති -පෙ- අනාගතාරම්මණා අනාගත කාලික ධර්මයන් අරමුණු කොට පවත්නා ධම්මා -පෙ- සන්ති -පෙ- පච්චුප්පන්නාරම්මණා ප්‍රත්‍යුත්පන්න කාලික ධර්මයන් අරමුණු කොට පවත්නා ධම්මා -පෙ- සන්ති -පෙ-

අතීතාරම්මණා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, අතීත ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සය හා සම්ප්‍රයුක්ත සමතිස් චෛතසිකය අතීත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ කාමජවන එකුන්තිස මනොද්වාර වජ්ජන චිත්තය තදාරම්මණ එකොළොසය අභිඤ්ඤා දෙසිත හා සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත සත්සාළිස් චෛතසිකය ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් දෙවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (බෙදා වෙන්කිරීම සුගමයි.)

අනාගතාරම්මණා ධම්මා යන ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, අනාගත ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මනොද්වාර වර්ජනය කාමජවන එකුන් තිස තදාරම්මණ එකොළොස අභිඤ්ඤාදෙසිත හා සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත සම්පණ්ණස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (ඔවුන් බෙදා වෙන්කිරීමද ප්‍රථම පදය මෙනි.)

පච්චුප්පන්නාරම්මණා ධම්මා යන තෘතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්? ප්‍රත්‍යුත්පන්න ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ දෙපස්විඤ්ඤාණය මනොධාතු ත්‍රිකය හා සම්ප්‍රයුක්ත ඡන්ද, පීති, විරිය, වර්ජිත, අණ්‍යසමාන චෛතසික දසය ප්‍රත්‍යුත්පන්න ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ මනොද්වාර වර්ජනය කාමජවන එකුන්තිස තදාරම්මණ එකොළොස අභිඤ්ඤාදෙසිත හා සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය

වර්ජිත සමපණස් චෛතසිකයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සිව්වැදෑරුම්. ආයතන වශයෙන් දෙවැදෑරුම්. ධාතු වශයෙන් අටවැදෑරුම්. සත්‍ය වශයෙන් දෙවැදෑරුම්. (බෙද වෙන් කිරීම සුගමයි.)

මේ ශබ්දවලි තොමෝ—පෙ—ත්‍රිකනම්. මූල් පෙදින්—පෙ—ආදිලබ්ධනාම ත්‍රික නම්. ප්‍රඥප්ති ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ අභිඥමය වර්ජිත රූපාවචර සිත් පසළොසය ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සිත් සදෙනය තත් සම්ප්‍රයුක්ත විරතිවර්ජිත පන්තිස් චෛතසිකය ප්‍රඥප්ති ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ හසිතුප්පාද වර්ජිත කාමජවන අටවිස්සය, මනොද්වාර වර්ජනය හා අභිඥදෙසිත විරති වර්ජිත එකුන්පණස් චෛතසිකය, අප්‍රමාණ ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ ලොකොත්තර සිත් අටය, තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ ඥණසම්ප්‍රයුක්ත මහා කුසල් මහා ක්‍රියා චිත්තයෝ අටදෙනය. මනොද්වාර වර්ජනය, අභිඥදෙසිතය තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයෙන් බැහැර කොට වදාළ හෙයින් සප්පදෙස ත්‍රික නම්.

## අතීතා රම්මණ ත්‍රිකයයි.

20 අතීතා රම්මණත්‍රිකයට අනතුරුව අජ්ඣත්තත්‍රිකය වදාළසේක. හෙද ප්‍රථම පදය—පෙ—අජ්ඣත්ත බහිද්ධාධම්මා යනුවෙති. අජ්ඣත්තා තම සන්තානයෙහි පවත්නාවූ හෙවත් අධ්‍යාත්ම සන්තානයෙහි පවත්නාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

බහිද්ධා බාහ්‍ය සන්තානයෙහි පවත්නා වූ ධම්මා—පෙ—සන්ති—පෙ—

අජ්ඣත්තබහිද්ධා අධ්‍යාත්මිකවූද බාහිරවූද සන්තානයෙහි පවත්නාවූ ධම්මා—පෙ—සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමානවෙත්.

අජ්ඣත්තාධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් අධ්‍යාත්මික සන්තානයෙහි හටගන්නාවූ එකුන් අනූචිත්තය දෙපණස් චෛතසිකය අට විසි රූපය යන මේ ධර්මයෝ ලැබෙති. (මෙහි ස්කන්ධ ආයතන ධාතු සත්‍යයෙන් විභාග කොට දැක්වීම සුගමයි.) ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනම් බාහිර සන්තානයෙහි හටගන්නාවූ එකුන් අනූචිත්තය දෙපණස් චෛතසිකය අට විසි රූපය නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. (ඔවුන් බෙදවෙන් කිරීමද සුගමයි.)

තෘතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අධ්‍යාත්මිකවූද බාහ්‍යවූද සන්තානයෙහි හටගන්නාවූ එකුන් අනූචිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. (ඔවුන් බෙදා වෙන්කිරීමද පෙර සේ මැයි.) මේ ශබ්දවලිතොමෝ පරමාර්ථ ධර්මයන් …පෙ… ත්‍රික නම්. මූල් පෙදින් …පෙ… ආදී ලබ්ධනාම ත්‍රික නම්. සියලු පරමාර්ථ ධර්මයන් මේ ත්‍රිකයෙහි ඇතුලත් කොට වදළ හෙයින් නිප්පදෙස ත්‍රික නම්.

**අජ්ඣත්තත්‍රිකයයි.**

21 අජ්ඣත්තත්‍රිකයට අනතුරුව අජ්ඣත්තාරම්මණත්‍රිකය වදළසේක. හෙද ප්‍රථම පදය …පෙ… අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා යනුවෙති.

අජ්ඣත්තාරම්මණා අධ්‍යාත්මික ධර්මයන් අරමුණුකොට පවත්නාවූ ධම්මා …පෙ… සන්ති …පෙ…

බාහිද්ධාරම්මණා බාහිර ධර්මයන් අරමුණු කොට පවත්නාවූ ධම්මා …පෙ… සන්ති …පෙ… අජ්ඣත්තබහිද්ධාරම්මණා අධ්‍යාත්මික වූද බාහිර වූද ධර්මයක් අරමුණුකොට පවත්නාවූ ධම්මා …පෙ… සන්ති …පෙ…

මෙහි ප්‍රථම පාදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්, අධ්‍යාත්මික ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤා නාසඤ්ඤායතන යන චිත්තයෝ සදෙනය තත් සම්ප්‍රයුක්ත සමතිස් චෛතසිකය අනෛකාන්තයෙන් අරමුණුකරන්නාවූ සිව් පනස් කාමාවචර චිත්තය අභිඥ දෙසිතය තත්සම්ප්‍රයුක්ත ඊර්ෂ්‍යා අප්‍රමණ්‍ය වර්ජිත එකුන් පණස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි.)

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් බාහිර ධර්මයන් ඒකාන්තයෙන් අරමුණු කරන්නාවූ ආකාශානඤ්චායතන සිත්තුණය අභිඥ ද්වය වර්ජිත රූපාවචර සිත් පසළොසය ලෝකෝත්තර සිත් අටය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය බාහිර ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ කාමසිත් සිව් පණසය අභිඥ දෙසිතය තත් සම්ප්‍රයුක්ත මාත්සර්‍ය වර්ජිත එක්පණස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි )

තෘතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්, අධ්‍යාත්මිකවූද බාහ්‍යවූද ධර්මයන් අනේකාන්ත වශයෙන් අරමුණු කරන්නාවූ සිව්පණස්

කාමාවචර චිත්තය අභිඥදෙසිතය ඉස්සා මච්ඡරිය අප්පමඤ්ඤ වජ්ජිත අටසාලිස් චෛතසිකය යන ධර්මයෝ ලැබෙති. (බෙදා වෙන්කිරීම සුගමැයි.)

මේ ශබ්දවලී නොමෝ—පෙ—ත්‍රිකනම්. මූල් පෙදින්—පෙ—ආදි ලබ්ධනාමත්‍රිකනම්. ආකිඤ්චඤ්ඤායතන චිත්තයෝ තිදෙනය. තත්සම්ප්‍රයුක්ත සමතිස් චෛතසිකය ඔවුන්ට අරමුණු වන නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණුකරන්නාවූ දෙළොස් අකුසල්ය. මහා කුසල මහා ක්‍රියාචිත්තයෝ සොළසය මනොද්වාරාවර්ජනය අභිඥ දෙසිතය විරති අප්‍රමණ්‍ය ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය වර්ජිත පන්සාලිස් චෛතසිකය අට විසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් මේ ත්‍රිකයෙන් බැහැරකොට වදාලහෙයින් සප්පදෙශ ත්‍රිකනම්.

### අජ්ඣත්තාරම්මණ ත්‍රිකයයි.

22 අජ්ඣත්තාරම්මණ ත්‍රිකයට අනතුරුව සනිදස්සනත්‍රිකය වදාලසේක. හෙද ප්‍රථම පදය—පෙ—අනිදස්සන අප්පටිඝා ධම්මා යනුවෙති.

සනිදස්සනසප්පටිඝා දැකීම් සහිතවූ හැපීම් සහිතවූ නොහොත් දකින ලද්දවූ ගැටෙනු ලද්දවූ නොහොත් දැකීම් සහිතව පැවත්තාවූ හැපීම් සහිතව පැවත්තාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—අනිදස්සනසප්පටිඝා දැකීම් රහිතව හැපීම් සහිතව පැවත්තාවූ නොහොත් නොදක්නා ලදුව ගැටෙනු ලැබුවාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

අනිදස්සන අප්පටිඝා දැකීම් රහිතවූ ගැටීම් රහිතවූ නොහොත් දැකීමක් හෝ හැපීමක් නැත්තාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් වර්ණායතන සඞ්ඛ්‍යාත රූප අරමුණ ලැබේ. (එය රූපස්කන්ධනම් රූපායතන නම්. රූප ධාතු නම්. දුක්ඛසත්‍ය නම්.)

ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් රූපායතන වර්ජිත එකළොස් ඖලාරික රූපයෝ ලැබෙති. (ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් රූප ස්කන්ධ නම්. ආයතන වශයෙන් චක්ඛායතන—පෙ—කාය යතන සඞ්ඛ්‍යාත්න — පෙ — පොට්ඨබ්බායත්න සඛ්‍යාත නවවිධ ආයතනයක් ඇත්තේ එසේම ධාතු වශයෙනුදු නව වැදූරුම්. එකම දුක්ඛ සත්‍යයයි.)

තෘතිය පදයාගේ අභිධෙයාර්ථයෝනම් එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය සූක්ෂ්ම රූප සොළස නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඔව්හු ස්කන්ධ වශයෙන් පස් වැදූරුම්

ආයතන වශයෙන් දෙවදෑරුම්. සප්ත විඤ්ඤාණ ධාතු ධම්ම ධාතුවශයෙන් අටවැදෑරුම්. ආර්‍යසත්‍යවශයෙන් සිව් වැදෑරුම්. (බෙද වෙන්කිරීම සුගමැයි.) මේ ශබ්දවලීතොමෝ—පෙ—ත්‍රිකනම් මූල් පෙදින්—පෙ—ආදි ලබ්ධනාම ත්‍රිකනම්. සියලු පරමාර්ථ ධර්මයන් මෙහිලා වදාළහෙයින් නිප්පදෙශ ත්‍රිකනම්.

සනිදස්සන ත්‍රිකයයි.

මෙතෙකින් ත්‍රික මාතෘකාසන්නය නිමියේය. මේ ත්‍රික මාතෘකාවෙහි වේදනා, විතර්ක පරිත්තා, රම්මණ, මග්ගාරම්මණ, උප්පන්න, අතීත, අතීතාරම්මණ, අජ්ඣත්තාරම්මණ යන ත්‍රිකයෝ නවදෙන සප්පදෙස ත්‍රිකයෝයි.

---

ත්‍රිකමාතෘකාවට අනතුරුව දුකමාතෘකාව වදාළසේක. ඒ දුකමාතෘකාවද හෙතු ගොච්ඡකය, චූලන්තරදුකය, ආසවගො-ච්ඡකය, සඤ්ඤෝජනගොච්ඡකය, ගන්ථගොච්ඡකය, ඔඝගොච්ඡකය, යොගගොච්ඡකය, නීවරණගොච්ඡකය, පරාමාසගොච්ඡකය, මහන්තරදුකය, උපාදානගොච්ඡකය, කිලෙසගොච්ඡකය, පිට්ඨි දුකය, යන මොවුන්ගේ වශයෙන් තෙළෙස් වැදෑරුම්. ඔවුනතුරෙන් හෙතුගොච්ඡකය පළමුකොට වදාළසේක. හෙද හේතුදුකය, සහෙතුකදුකය, හෙතුසම්පයුත්තදුකය, හෙතුසහෙතුකදුකය, හෙතුහෙතු සම්පයුත්තදුකය, නහෙතුසහෙතුකදුකය, යන මොවුන්ගේ වශයෙන් සවැදෑරුම්වේ. ඔවුන්තුරෙන් හෙතුදුකය පළමුකොට වදාළසේක. හෙද ප්‍රථම පදය දුතියපදයාගේ වශයෙන් දෙවැදෑරුම්. ඔවුනතුරෙන් ප්‍රථම පදය පළමුකොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? හෙතුධම්මා යනුවෙනි තදනන්තරව දුතිය පදය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? න හෙතුධම්මා යනුවෙනි.

හෙතු හෙතුනම්වූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාවධර්ම කෙනෙක් සන්ති සංවිජ්ජන්ති විද්‍යමානවෙත්.

න හෙතු හෙතුනම් නොවන්නාවූ ධම්මා නිස්සත්ත නිජ්ජීව සවභාව ධර්මකෙනෙක් සන්ති (සංවිජ්ජන්ති) විද්‍යමානවෙත්.

හෙතුධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝභ ද්වේෂ මෝහ අලෝභ අද්වේෂ අමෝහ යන චෛතසිකයෝ සදෙන ලැබෙත්. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් සංස්කාර ස්කන්ධ නම්. ආයතන වශයෙන් ධම්මායතන නම්. ධාතු වශයෙන් ධම්ම ධාතු නම්. සත්‍යවශයෙන් චනාහි තෙවැදෑරුම්. ලෞකික සහෙතුක චිත්තයන් සමග යෙදුනාවූ ලොභ වර්ජිත හේතූහු පස්දෙන දුක්ඛසත්‍යනම්. ලෝභය සමුදය සත්‍ය නම් සතර මාර්ග සම්ප්‍රයුක්ත අමොහයෝ සතරදෙන මාර්ගසත්‍යනම්. සතරමාර්ග සම්ප්‍රයුක්ත අලොභ අද්වේෂ දෙදෙන හා ඵල සම්ප්‍රයුක්ත අලොභ අද්වේෂ අමොහයෝ සත්‍ය විනිර්මුක්තවේ. මෙසේ ආර්‍ය සත්‍යවශයෙන් තෙවැදෑරුම්.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝනම් එකුන් අනූවිත්තය හේතූන් වර්ජිත සසාලිස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධ වශයෙන් පස්වැදෑරුම්. ආයතන වශයෙන් දෙළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටළොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් තෙවැදෑරුම්. (බෙදා වෙන්කිරීම යටකී නයින් දතයුතු) මේ ශබ්දවලිතොමො පරමාර්ථ ධර්මයන් පදදෙකක් කොට වදළහෙයින් දුකනම්. මූල් පෙළින් ලබනලද නම් ඇති හෙයින් ආදි ලබ්ධනාම දුකනම්. සියළු පරමාර්ථ ධර්මයන් මෙහිලා වදළහෙයින් නිප්පදෙස දුකනම්.

## හෙතු දුකයයි.

2. හෙතු දුකයට අනතුරුව සහෙතුක දුකය වදළසේක. හෙද෴පෙ෴දෙවැදෑරුම්෴පෙ෴අහෙතුකා ධම්මා යනුවෙනි. සහෙතුකා සම්ප්‍රයුක්ත හෙතු ඇත්තාවූ ධම්මා෴පෙ෴සන්ති ෴පෙ෴වෙත්.

අහෙතුකා සම්ප්‍රයොග හෙතු නැත්තාවූ ධම්මා෴පෙ෴සන්ති ෴පෙ෴වෙත්.

සහෙතුකා ධම්මා යන ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්: සහෙතුක සිත් එක්සැත්තෑව මොහමූලවයෙහි මෝහය වර්ජිත කොට ඇති දෙපණස් චෛතසිකයෝ ලැබෙති. (ඒ ධර්මයන්ගේ ස්කන්ධාදිය බෙදා වෙන්කිරීම යටකී නයින් කළයුත්තේය.)

අහෙතුකා ධම්මා යන ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්: අටළොස් අහෙතුක චිත්තය තත් සම්ප්‍රයුක්ත ඡන්ද වර්ජිත අන්‍ය සමාන දෙළොස් චෛතසිකය මෝහමූලවචයෙහි යෙදුනාවූ මොහය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඔවුන්ගේ ස්කන්ධාදිය බෙදා වෙන්කිරීම යටකී නයින් කළයුතු. මේ ශබ්දවලී තොමෝ෴පෙ෴දුක නම්. මූල් පෙළින්෴පෙ෴ ආදිලබ්ධ නාම දුක නම්෴පෙ෴නිප්පදෙස දුක නම්.

## සහෙතුක දුකයයි.

3. සහෙතුක දුකයට අනතුරුව හෙතු සම්ප්‍රයුක්ත දුකය වදළසේක෴පෙ෴කෙසේ වදළසේක්දයත්? 1 හෙතු සම්පයුක්තා ධම්මා 2 හෙතු විප්පයුත්තා ධම්මා යනුවෙනි. හෙතු සම්පයුත්තා හේතූන් සමග එකොත්පාදදි භාවයෙන් මිශ්‍ර වූ ධම්මා෴පෙ෴ සන්ති෴පෙ෴හෙතු විප්පයුත්තා හෙතුන් සමග෴පෙ෴මිශ්‍ර නොවූ ධම්මා෴පෙ෴මෙහි අභිධෙයාර්ථ හා ස්කන්ධාදිය බෙදා වෙන්කිරීම සහෙතුක දුකය හා සමානයි. සහෙතුක දුකයට සමාන වූ මේ දුකය කුමක් පිණිස වදළසේක්දයත්? දෙසනා විලාසය නිසාද පුද්ගලාධ්‍යාශය වසයෙන්ද වදළසේකැයි දතයුතු;

හෙතු සම්ප්‍රයුත්ත දුකයට අනතුරුව හෙතු සහෙතුක දුකය වදාළසේක. හෙද...පෙ...දවැදූරුම්. ඔවුනාගුරෙන්...පෙ... වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? 1 හෙතු චෙවධම්මං සහෙතුකා ච සහෙතුකාචෙව 2 ධම්මා න ච හෙතු යනුවෙනි.

1. හෙතු චෙව හෙතුනම්වූද සහෙතුකා සහෙතුකනම්වූද ධම්මා...පෙ...සනාති...පෙ...සහෙතුකා චෙව සහෙතුකනම්වූද නව හෙතු හෙතුනම් නොවන්නාවූද ධම්මා...පෙ...සනාති...පෙ...

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්: මෝහමූලචයෙහි මොහය වර්ජිත කොට ඇති හෙතු ධර්මයෝ සඳෙන ලැබෙති. ඔවුන්ගේ ස්කන්ධාදිය බෙදීම හේතු දුක ප්‍රථම පදයට සමානයි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්: සහෙතුක සිත් එක් සැත්තෑව හෙතුන් සඳෙන වර්ජිතකොට ඇති තත් සම්ප්‍රයුක්ත සසාලිස් චෛතසිකයෝ ලැබෙති. (ඔවුන්ගේ ස්කන්ධාදිය බෙද වෙන්කිරීම යටකී නයින් සුගමයි.)

ආදිලබ්ධනාම දුකයයි අහෙතුක සිත් අටලොස තත් සම්ප්‍රයුක්ත චෛතසික දෙලොස මොහමූලචයෙහි මෝහය අටවිසි රූපය නිර්වාණය යන මේතෙක් ධර්මයන් දුකමුක්තකොට වදාළ හෙයින් සපඤදෙසදුකනම්.

හෙතු සහෙතුක දුකයයි.

5. හෙතු සහෙතුක දුකයට අනතුරුව හෙතු හෙතු සම්ප්‍රයුක්ත දුකය වදාළසේක...පෙ...කෙසේ වදාළසේක්දයත්? හෙතුචෙව ධම්මා හෙතු සම්පයුත්තා ච 2 හෙතු සම්පයුත්තචෙව ධම්මා නචහෙතු යනුවෙනි.

හෙතුචෙව හෙතු නම්වූද හෙතු සම්පයුත්තා ච හෙතුසම්ප්‍රයුක්ත වූද ධම්මා—පෙ—සනාති—පෙ—2 හෙතුසම්පයුත්තාචෙව හෙතුන් සමඟ සම්ප්‍රයුක්තවූද නවහෙතු හෙතු නම් නොවන්නාවූද ධම්මා —පෙ—සනාති—පෙ—මේ දුකය සතරවන හෙතු සහෙතුක දුකයට කියනලද සියළු අර්ථ විභාග හා සමානයි.

හෙතු හෙතු සම්ප්‍රයුක්ත දුකයයි.

6. හෙතු හෙතු සම්ප්‍රයුක්ත දුකයට අනතුරුව නහෙතු සහෙතුක දුකය වදාළසේක. හෙද—පෙ—වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? නහෙතු ඛොපන ධම්මා. සහෙතුකාපි, අහෙතුකාපි යනුවෙනි.

න හෙතු ඛොපන හෙතුනම් නොවන්නාවූද සහෙතුකාපි සහෙතුක නම්වූද ධම්මා—පෙ—සනාති—පෙ—

න හෙතු බොපන හෙතු නම් නොවන්නාවූද අහෙතුකාපි අහෙතුකනම්වූද ධම්මා—පෙ—සනති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්: සහෙතුක සිත් එක්සැත්තෑව සව්හෙතුන් වර්ජිත සසාලිස් චෛතසිකය ලැබෙති. (ඔවුන් බෙද වෙන්කිරීම සුගමයි)

ද්‍විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්: අටළොස් අහෙතුක චිත්තය තත් සම්ප්‍රයුක්ත දොළොස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (ඔවුන් බෙද වෙන් කිරීමද යටකී නයින් දතයුතු)

න හෙතු බොපන ධම්මා සහෙතුකාපි අහෙතුකාපි යනුවෙන් පරමාර්ථ ධර්මයන් දෙකොටසක් කොට වදාළ හෙයින් ද්‍රක නම්. දෙපදයෙන් ලබනලද නම් ඇති හෙයින් සම්ලබ්ධ නාම ද්‍රක නම්. හෙතු ධර්මයෝ සඳෙන මිට ඇතුලත් කොට නොවදාල බැවින් සප්පදෙස ද්‍රක නම්.

න හෙතු සහෙතු ද්‍රකයයි.

අටුවාගත වශයෙන් "හෙතුචෙව ධම්මා සහෙතුකාච සහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යන මේ චතුර්ථ ද්‍රකය හටගත් තාක් මෙන් ප්‍රථම ද්‍රකයෙහි දෙවෙනි ද්‍රකයාගේ දෙවෙනි පදය බඟා "හෙතුචෙව ධම්මා අහෙතුකාච අහෙතුකාචෙව ධම්මා න ච හෙතු" යන ද්‍රකයක්ද වියයුත්තේයි. ඒ ද්‍රකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්, මොහමූලික දෙසිතෙහි මොහචෛතසිකය ලැබේ.

අහෙතුකාචෙව ධම්මා න ච හෙතු යන ද්‍විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්: අහෙතුක සිත් අටළොසය ඡන්දවර්ජිතවූ අන්‍යසමාන දොළොස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මොවුහුයි. (බෙද වෙන්කිරීම සුගමයි) මේ ද්‍රකයෙහි සහෙතුක සිත් එක්සැත්තෑවය මොහමූලික දෙසිතෙහි මොහය හැර දෙපණස් චෛතසිකය යන මොවුන් මේ ද්‍රකයෙන් බැහරවූ හෙයින් සප්පදෙස ද්‍රක නම්.

පළමුවෙනි ද්‍රකයාගේ හා තුන්වෙනි ද්‍රකයාගේ ප්‍රථම පදය බඟා "හෙතුචෙව ධම්මා හෙතු සම්පයුත්තාච හෙතුසම්පයුත්තාචෙව ධම්මා න ච හෙතු" යන පස්වෙනි ද්‍රකය හටගන්නාක්මෙන් ප්‍රථම ද්‍රකයෙහි තුන්වන ද්‍රකයාගේ දෙවෙනි පදය බඟා "හෙතුචෙව ධම්මා හෙතුවිප්පයුත්තාච හෙතුවිප්පයුත්තාචෙව ධම්මා න ච හෙතු" යන ද්‍රකයක්ද වියයුත්තේයි. ඒ ද්‍රකයෙහි පදාර්ථයන්ගේ විභාගය හෙතුචෙව ධම්මා අහෙතුකාච අහෙතුකාචෙව ධම්මා න ච හෙතු යන ද්‍රකයට සමානයි.

න හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි. යනුවෙන් වදාළ යුත්තේ නමුදු සද්දාධික අත්ථාධිකො හොති යන පරිභාෂාක්‍රමයට අනතුරුව ඛොපන යන ශබ්දයන් අධික කොට දෙශනා කළ බැවින් ඒ ඛොපන යන ශබ්දය කරණකොටගෙන දක්නාලද්දවූද අතිරෙක දුක සමූහයා අතුරෙන් අට්ඨකථානය වශයෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා න හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි යන සවැනි දුකය වන්නාක් මෙන් තුන් වෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා න හෙතු ධම්මා හෙතු සම්පයුත්තාපි හෙතු විප්පයුත්තාපි යන දුකයක්ද විය යුත්තේයි.

ඒ දුකයාගේ පදාර්ථයෝ හා සියලු විභාගය න හෙතු ධම්මා සහෙතුකාපි යන දුකයට සමානයි.

දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි යන දුකයක්ද විය යුත්තේයි. ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, මොහමූලික දෙසිතෙහි මොහය හැර ෂට්හෙතුහුයි. එම දුකයෙහි ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් මොහමූලික දෙසිතෙහි මොහයයි. (සකන්ධාදිය බෙදීම සුගමයි.)

මේ දුකයෙහි එකුන්අනූවක් චිත්තය ෂට් හෙතූන් වර්ජිත කොට ඇත්තාවූ සසාලිස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

මූලටීකානය වශයෙන් තුන්වෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා "හෙතු ධම්මා හෙතු සම්පයුත්තාපි හෙතු විප්ප යුත්තාපි යන දුකයක්ද විය යුත්තේයි. ඒ දුකයෙහි සියලු අර්ථ විභාගය හෙතු ධම්මා සහෙතුකාපි අහෙතුකාපි" යන දුකයට සමානයි.

අනුටීකානය වශයෙන් ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා "සහෙතුකා ධම්මා හෙතූපි න හෙතූපි" යන දුකයක්ද විය යුත්තේයි. ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, මොහමූලික දෙසිතෙහි මොහය හැර අවශෙෂ ෂට්හෙතුහුයි.

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, සහෙතුක එක් සැත්තෑවක් චිත්තය ෂට්හෙතූන් වර්ජිත කොට ඇත්තාවූ සසාලිස් චෛතසිකය යන මොව්හුයි. ස්කන්ධායතන ධාතු සත්‍ය වශයෙන් බෙදීම යටකී නයින් දතයුතු.

මේ දුකය චනාඃගි මුල් පෙදින් නම් ලත් හෙයින් ආදිලබ්ධනාමේ දුක නම්. අටලොස් අහෙතුක චිත්තය හත් සම්ප්‍රයුක්ත දෙළොස් චෛතසිකය මොහමූලික දෙසිතෙහි මොහය අටවිසිරූපය නිර්‍වාණය යන මෙතෙක් ධර්‍මයන් ඇතුළත් නොවූ බැවින් සප්පදෙශ දුක නම් වෙයි.

ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ දෙවෙනි පදය ඛතා "අහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි" යන දුකයක්ද විය යුත්තේය.

ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම්, මොහ මූලික දෙසිතෙහි මොහයයි. ද්‍විතිය පදයාගේ අභිධෙයාර්‍ථයෝ නම්, අටලොස් අහෙතුක චිත්තය හත් සම්ප්‍රයුක්ත දෙළොස් චෛතසිකය අටවිසිරූපය නිර්‍වාණය යන මෙතෙක් ධර්‍මයෝයි. (ඔවුන්ගේ ස්කන්ධාදිය බෙදීම් යටකී නයමැයි.)

මූල් පෙදින් නම් ලත් හෙයින් ආදිලබ්ධනාම දුක නම්. සහෙතුක සිත් එක්සැත්තෑව මොහමූලවයෙහි මොහය වර්ජිත දෙපණස් චෛතසිකය මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

ප්‍රථම දුකයෙහි තුන්වෙනි දුකයාගේ ප්‍රථම පදය ඛතා "හෙතු සම්පයුත්තා ධම්මා හෙතුපි න හෙතුපි" යන දුකයක්ද විය යුතුයි.

ඒ දුකයෙහි සියලු අර්‍ථ විභාග සහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි යන දුකයට සමානයි.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ද්‍විතිය පදය ඛතා හෙතුවිප්පයුත්තා ධම්මා හෙතුපි න හෙතුපි යන දුකයද විය යුතුයි. ඒ දුකයාගේ සියලු අර්‍ථ විභාගය අහෙතුකා ධම්මා හෙතුපි න හෙතුපි යන දුකයට සමානයි.

හෙතු ගොච්ඡක අර්‍ථ වර්‍ණනාව නිමියේයි.

හෙතු ගොච්ඡකයට අනතුරුව චූලන්තර දුකය වදාළසේක. හෙද සප්පච්චය දුකය, සංඛත දුකය, සනිදස්සන දුකය, සප්පටිඝ දුකය, රූපි දුකය, ලොකිය දුකය, කෙනචිවිඤ්ඤෙය්‍ය දුකය යන මොවුන්ගේ වශයෙන් සත්වැදෑරුම් වේ.

ඔවුන් අතුරෙන් සප්පච්චය දුකය පළමු කොට වදාරනලදී. කෙසේ වදාළේද යත්? සප්පච්චයා ධම්මා අප්පච්චයා ධම්මා යනුවෙනි.

1. සප්පච්චයා නම් චිත්ත ඍතු ආහාර යන චතුර්විධ හෙතු වෙන් හටගන්නාවූ ධම්මා — පෙ — සන්ති — පෙ — අප්පච්චයා එකී චතුර්විධ හේතුන් නැත්තාවූ ධම්මා — පෙ — සන්ති — පෙ —

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, එකුන් අනූවිත්තය දෙපණස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති. (ඔවුන් බෙද වෙන්කිරීම යටකී නයමැයි.)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම්, නිර්වාණ ධර්මය ලැබේ. එය ස්කන්ධ විනිර්මුක්තයි. ධර්මායතන ධර්මධාතු නිරොධ සත්‍ය යන නම් ලබයි.

ආදිලබ්ධනාම දුක නමුදු නිප්පදෙශ දුක නමුදු වෙයි.

## සප්පච්චය දුකයයි.

2. සප්පච්චය දුකයට අනතුරුව සංඛත දුකය වදාළ සේක. කෙසේ වදාළසේක්ද යත්? සංඛතා ධම්මා අසංඛතා ධම්මා යනුවෙනි.

සඞ්ඛතා කර්ම චිත්ත සෘතු ආහාර යන චතුර්විධ ප්‍රත්‍ය ධර්මයන් විසින් සකස් කරනලද්දවූ ධම්මා -පෙ- සන්ති -පෙ-

අසඞ්ඛතා එකී චතුර්විධ ප්‍රත්‍ය ධර්මයන් විසින් සකස් නොකරන ලද්දවූ ධම්මා -පෙ- සන්ති -පෙ- මේ දුකයෙහි සියලු විස්තර විභාග සප්පච්චය දුකය මෙනි.

## සඞ්ඛත දුකයයි.

3. සඞ්ඛත දුකයට අනතුරුව සනිදස්සන දුකය වදාළ සේක. කෙසේ වදාලසේක්දයත්? සනිදස්සනා ධම්මා අනිදස්සනා ධම්මා යනුවෙනි.

සනිදස්සනා දැකීම් සහිතවූ (නොහොත්) දැකීම් සහිතව හට ගන්නාවූ (ධම්මා සන්ති)

අනිදස්සනා දැකීම් රහිතවූ (නොහොත්) දැකීම් රහිතව හට ගන්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකම රූපාරම්මණය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය රූප අරමුණ වර්ජිත සත්විසි රූපය නිර්වාණය ලැබෙති. මේ දුකයෙහි සියලු විස්තර විභාග යටකී නයමැයි.

## සනිදස්සන දුකයයි.

4. සනිදස්සන දුකයට අනතුරුව සප්පටිඝ දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? සප්පටිඝා ධම්මා අප්පටිඝා ධම්මා යනුවෙනි.

සප්පටිඝා හැපීම් සහිතවූ නොහොත් හැපීම සමග හටගන්නාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

අප්පටිඝා හැපීම්රහිතවූ නොහොත් හැපීම සමග හට නොගන්නාවූ ධම්මා—පෙ—සන්ති—පෙ

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ඕලාරික රූප දොළස ලැබෙති. ඒ ධර්මයෝ රූපස්කන්ධ නමි. ආයතන වශයෙන් දසවැදෑරුමි. ධාතු වශයෙන් දසවැදෑරුමි. සත්‍ය වශයෙන් දුක්ඛ සත්‍ය නමි. (බෙදීම සුගමයි)

ද්විතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය සූක්ෂමරූප සොළොස නිර්වාණය ලැබෙති. ඔව්හු ස්කන්ධ වශයෙන් පස්වැදෑරුමි. ආයතන වශයෙන් දෙවැදෑරුමි. ධාතුවශයෙන් අටවැදෑරුමි. සත්‍ය වශයෙන් සිව්වැදෑරමි. (බෙද වෙන්කිරීම සුගමයි) අංදිලබ්ධනාම දුක නමි. නිප්පදෙස දුක නමි.

## සප්පටිඝ දුකයයි

5. සප්පටිඝ දුකයට අනතුරුව රූපී දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? රූපිනො ධම්මා අරූපිනො ධම්මායනු වෙති. රූපිනො ශීතොෂ්ණාදී විරොධ ප්‍රත්‍යයන් හේතුකොට ගෙන විකාරවන සවභාව ඇත්තාවූ—පෙ—සන්ති—පෙ—

අරූපිනො ශීතොෂ්ණාදිය කරණකොටගෙන විකාර නොවන සවභාව ඇත්තාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්- අටවිසි රූපයෝ ලැබෙති. ද්විතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකුන්අනූ චිත්තය දෙපණස් චෛතසිකය නිර්වාණය ලැබෙති. (මේ දුකයෙහි සියලු විස්තර විභාග යටකී නයින් දතයුතුයි.)

## රූපීදුකයයි.

6. රූපී දුකයට අනතුරුව ලෞකිය දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? ලොකියා ධම්මා ලොකුත්තරාධම්මා යනුවෙති.

ලොකියා වෘත්තදුක්ඛ සංඛ්‍යාත සංසාර ලොකයෙහි පවත්නාවූ නොහොත් තෘෂ්ණාදෘෂ්ටි සංඛ්‍යාත උපාදානයන්ට අරමුණුවූ ධම්මා—පෙ—සන්ති—පෙ—ලොකුත්තරා සංසාර වෘත්තදුක්ඛයෙන් එතරවෙමින් පවත්නාවූද එතරවූද නොහොත් උපාදානයන්ට අරමුණු නොවන්නාවූද ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක්අසූව ඒ සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති. (ඔවුන්ගේ ස්කන්ධාදිය බෙද වෙන්කිරීම සුගමයි.)

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොකොත්තර සිත් අටහත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය විඥාණය ලැබෙති. (ස්කන්ධාදිය බෙද වෙන්කිරීම සුගමයි.) සෙස්ස පෙරමෙති.)-:

## ලෞකිය දුකයයි

7 ලෞකියදුකයට අනතුරුව කෙනචි විඤ්ඤෙය්‍ය දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? කෙනචිවිඤ්ඤෙය්‍යා ධම්මා, කෙනචිනවිඤ්ඤෙය්‍යා ධම්මායනුවෙති. කෙනචිවිඤ්ඤෙය්‍යා යම් කිසි විඤ්ඤාණයකින් දත හැකි වූ ධම්මා —පෙ— සන්ති —පෙ— කෙනචිනවිඤ්ඤෙය්‍යා යම්කිසි විඤ්ඤාණයකින් නොදතහැකිවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකුන් අනූචිත්තය දෙපණස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් යම්කිසි විඤ්ඤාණයකින් නොදතහැකිවූ—එකුන් අනූචිත්තය දෙපණස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (මේ දුකයෙහි සියලු විස්තර විභාග යටකී නයමැයි.)

## කෙනචිවිඤ්ඤෙය්‍ය දුකයයි.

චූලන්තර දුකයාගේ විස්තරාර්ථ වර්ණනාව නිමියේයි.

චූලන්තර දුකයට අනතුරුව ආසව ගොච්ඡකය වදාළසේක. එහෙද ආසවදුකය, සාසවදුකය, ආසවසම්පයුත්තදුකය, ආසවසාසව දුකය, ආසව ආසවසම්පයුත්ත දුකය, ආසව විප්පයුත්ත දුකය යන මොවුන්ගේ වශයෙන් සැවැදෑරුම්. ඔවුනතුරෙන් ආසවදුකය පළමුකොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්; ආසවා ධම්මා, නො ආසවා ධම්මා, යනුවෙති. ආසවා ආශ්‍රව නම් වූ නොහොත් භූමි වශයෙන් භවාග්‍රය දක්වාද ධර්ම වශයෙන් ගොත්‍රභූචිත්තය දක්වාද වහනය වෙමින් පවත්නාවූ නොහොත් බොහෝකල් පිළුණු වූ මේරයක් වැනි වූ ධම්මා—පෙ—සන්ති—පෙ—

නො ආසවා භූමි වශයෙන් භවාග්‍රය දක්වාද ධර්ම වශයෙන් ගොත්‍රභූ චිත්තය දක්වා වහනය නො වෙමින් පවත් නා වූ නොහොත් බොහෝ කල් පිළුණු වූ මේරයක් වැනි නොවූ නොහොත් ආසව නම් නොවන්නාවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොභ දිට්ඨි මොහ යන චෛතසිකයෝ තිදෙන ලැබෙති. (ස්කන්ධාදිය බෙද වෙන්කිරීම සුගමයි.)

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනම් එකුන් අනූවිත්තය ආසව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි)

ආදි ලබ්ධ නාම දුක නමුදු නිප්පදෙශ දුක නමුදු වෙයි.

ආසව දුකයයි

2 ආසව දුකයට අනතුරුව සාසව දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත් සාසවාධම්මා අනාසවා ධම්මා යනුවෙනි.

සාසවා ආශ්‍රවයන්ට අරමුණු වූ ධම්මා—පෙ—සන්ති—පෙ—

අනාසවා ආශ්‍රවයන්ට අරමුණු නොවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම්, ලෞකික සිත් එක්අසූව තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි.)

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනම්, ලොකොත්තර සිත් අට තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි.)

ආදි ලබ්ධ නාම දුක නමුදු නිප්පදෙශ දුක නමුදු වෙයි.

සාසව දුකයයි.

3 සාසව දුකයට අනතුරුව ආසව සම්පයුක්ත දුකය වදාළ සේක. කෙසේ වදාළසේක්ද යත්? ආසව සම්පයුත්තාධම්මා, ආසව විප්පයුත්තා ධම්මා යනුවෙනි.

ආසව සම්පයුත්තා ආශ්‍රව ධර්මයන් සමග ඒකොත්පාදදි භාවයෙන් මිශ්‍ර වූ ධම්මා—පෙ—සන්ති—පෙ—

ආසව විප්පයුත්තා ආශ්‍රවධර්මයන් සමග ඒකොත්පාදදි භාවයෙන් මිශ්‍ර නොවූ ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් දෙළොස් අකුසල් සිත්ය. ද්වෙෂ මූල මෝහ මූලයන්හි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ලැබෙති (ස්කන්ධාදිය බෙදීම සුගමයි.)

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනම් දෙළොස් අකුසල් සිත් වර්ජිත කොට ඇති සත්සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද්වෙෂ මූල මෝහ මූලයන්හි යෙදුනු මෝහය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ස්කන්ධාදිය බෙදීම යට කීනයින් දතයුතු.

ආදි ලබ්ධනාම දුකනමි. නිප්පදෙශ දුකනමි.

## ආසව සම්පයුත්තදුකයයි

4 ආසවසම්පයුත්ත දුකයට අනතුරුව ආසවසාසව දුකය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? ආසවාචෙව ධම්මා සාසවාච සාසවාචෙව ධම්මා නොච ආසවා යනුවෙනි.

ආසවාචෙව ආසව නම් වූ ද සාසවාච ආශ්‍රව ධර්මයන්ට අරමුණු වූ ද ධම්මා—පෙ—සන්ති—පෙ—

සාසවාචෙව ආශ්‍රව ධර්මයන්ට අරමුණු වූ ද නොච ආසවා ආශ්‍රව නම් නොවූ ද (ධම්මා—සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ දිට්ඨි මෝහ යන ආශ්‍රව ධර්මයෝ තිදෙන ලැබෙති. (ස්කන්ධාදිය බෙද වෙන් කිරීම සුගමයි.)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ආශ්‍රව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති. (බෙද වෙන් කිරීම සුගමයි )

ආදි ලබ්ධනාම දුකයයි. ලෝකොත්තර ධර්ම ඇතුලත් නොකොට වදාළහෙයින් සප්පදෙශ දුකනම්.

## ආසව සාසව දුකයයි.

5 ආසව සාසව දුකයට අනතුරුව ආසව ආසව සම්පයුත්ත දුකය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? ආසවාචෙව ධම්මා ආසවසම්පයුත්තාච ආසව සම්පයුත්තාචෙව ධම්මා නොච ආසවා යනුවෙනි.

ආසවාචෙව ආසව නම් වූ ද ආසව සම්පයුත්තාච ආශ්‍රවයන් සමග සම්ප්‍රයුක්ත වූ ද ධම්මා—පෙ—සන්ති—පෙ—

ආසව සම්පයුත්තාචෙව ආශ්‍රවයන් සමග සම්ප්‍රයුක්ත වූද නොච ආසවා ආශ්‍රව නම් නොවූ ද ධම්මා—පෙ—සන්ති—පෙ—

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ මූලික සිත් අටෙහි යෙදුනාවූ ආශ්‍රව ධර්මයෝ තිදෙන ලැබෙති. (ස්කන්ධාදිය බෙද වෙන් කිරීම සුගමයි.)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල සිත්ය ආශ්‍රව ධර්ම වර්ජිත සුවිසි චෛතසිකය ලැබෙති. (ඔවුන්ගේ බෙදීම ද සුගමයි.)

ආදි ලබ්ධනාම දුකයයි දොළොස් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑවිත්තය අට තිස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් දුකමුක්ත කොට වදාළ හෙයින් සප්පදෙශ දුකනම්.

## ආසව ආසව සම්පයුත්ත දුකයයි.

6 ආසව ආසව සම්පයුත්ත දුකයට අනතුරුව ආසව විප්පයුත්ත සාසව දුකය වදාළසේක. කෙසේ වදාළසේක්ද යත්? ආසව විප්පයුත්තා ඛො පන ධම්මා සාසවාපි අනාසවාපි යනුවෙනි.

ආසව විප්පයුත්තා ඛො පන ආශ්‍රව ධර්මයන් සමග විප්‍රයුක්ත වූද සාසවාපි ආශ්‍රව ධර්මයන්ට අරමුණු වූ ද ධම්මා—පෙ— සන්ති—පෙ—

ආසව විප්පයුත්තා ඛො පන ආශ්‍රව ධර්මයන් සමග විප්‍රයුක්ත වූ ද අනාසවාපි ආශ්‍රව ධර්මයන්ට අරමුණු නොවූ ද ධම්මා—පෙ— සන්ති—පෙ—

එහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල සිත් වර්ජිත එකුන් සැත්තෑ ලෞකික චිත්තයෝය. තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ද්වෙෂ මූල මෝහ මූලයන්හි මෝහය අටවිසිරූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. ඒ ධර්මයෝ ස්කන්ධවශයෙන් පස් වැදෑරුම්. ආයතන වශයෙන් දොළොස් වැදෑරුම්. ධාතු වශයෙන් අටලොස් වැදෑරුම්. සත්‍ය වශයෙන් එක් වැදෑරුම්. (වෙන්කොට දැක්වීම සුගමයි.)

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝකෝත්තර සිත් අටය. තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි.)

ආදි ලබ්ධ නාම දුකයයි. දොළොස් අකුසල චිත්තයන් හා ලොභ මූල චිත්තයන්හි යෙදුනාවූ ලෝභ දිට්ඨි මෝහ වර්ජිත කොට ඇති. පස්විසි චෛතසිකයන් ද මේ දුකයට ඇතුළත් කොට නො වදළහෙයින් සප්පදෙශ දුකනම්.

ආසව විප්පයුත්තසාසව දුකයයි.

පෙළෙහි ආවා වූ සවැදෑරුම් දුකයන්ගේ අර්ථවර්ණනාව නිමියේයි. අටුවානයින් වනාහි ප්‍රථම දුකයෙහි තෘතීය දුකයාගේ ප්‍රථම පදය බහා "ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තා ච ආසව සම්පයුත්තා චෙව ධම්මා නො ච ආසවා යන පස් වෙති. දුකය වුවාක් මෙන් ප්‍රථම දුකයෙහි තෘතීය දුකයාගේ ද්විතීය පදය බහා "ආසවා චෙව ධම්මා ආසව විප්පයුත්තා ච ආසව විප්පයුත්තා චෙව ධම්මා නො ච ආසවා යන දුකයක් ද විය යුත්තේය.

ආසවා චෙව ආසව නම් වූ ද ආසව විප්පයුත්තා ච ආසව විප්‍රයුක්ත නම් වූ ද (ධම්මා සන්ති) ආසව විප්පයුත්තා චෙව ආශ්‍රව විප්පයුත්ත වූ ද නො ච ආසවා ආසව නම් නොවූ ද (ධම්මා සන්ති)

එහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ද්වෙෂ මූල මෝහ මූලයන්හි යෙදුනාවූ මෝහයෝ සිව්දෙන ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (බෙද වෙන්කිරීම සුගමයි.)

ආදි ලබ්ධනාම ද්‍රකයයි. අකුසල සිත් දොළස ද්වෙෂ මූල මෝහ මූලයන්හි මෝහයෝ වර්ජිත සත්විසි චෛතසිකය මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙශ ද්‍රකනම්.

ආසව විප්පයුත්තා ධම්මා සාසවාපි අනාසවාපි යනුවෙන් වදාළ යුතු වුවද ඡ ඇධිකා අන්‍යාධිකොහොති යන පරිභාෂාක්‍රමයට අනුව අධිකාර්‍යවාචක "බොපන" යන ශබ්ද සමුදාය එක් කොට වදාළ බැවින් ඒ "බොපන" යන ශබ්දයෙන් ලැබිය යුතු අතිරේක ද්‍රකයන් අතුරෙන් ද්‍රතිය ද්‍රකයෙහි තෘතිය ද්‍රකයාගේ ද්‍රතිය පදය බහා ආසව විප්පයුත්තා ධම්මා සාසවාපි අනාසවාපි, යන සවෙනි ද්‍රකය වූවාක් මෙන් දෙවෙනි ද්‍රකයෙහි ප්‍රථම ද්‍රකයාගේ ද්‍රතිය පදය බහා නො ආසවා ධම්මා සාසවාපි අනාසවාපි යන ද්‍රකයෙක් ද විය යුත්තේ යි.

නො ආසවාචෙව ආසව නම් නොවූ ද සාසවාපි ආශ්‍රවයන්ට අරමුණු වූ ද ධම්මා සන්ති නො ආසවාචෙව ආසව නම් නොවූ ද අනාසවාපි ආශ්‍රවයන්ට අරමුණු නොවූද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ආශ්‍රව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

ද්‍රතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර සිත් අට සතිස් චෛතසිකය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (විස්තර සුගමයි.)

මෙහි ආසව ධර්මයන් ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස ද්‍රක නම් වෙයි.

තෘතිය ද්‍රකයෙහි ප්‍රථම ද්‍රකයාගේ ප්‍රථම පදය බහා ආසවා චෙව ධම්මා ආසව සම්පයුත්තාපි ආසව විප්පයුත්තාපි යන ද්‍රකයක් ද විය යුතුයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ මූලිකසිත් අටෙහි යෙදුනා වූ ආශ්‍රව ධර්මයෝ තුන්දෙන ලැබෙති.

ද්‍රතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ද්වෙස මූලික මෝහ මූලික චිත්තයන්හි යෙදුනාවූ මෝහයෝ සිව් දෙන ලැබෙති.

ආදි ලබ්ධනාම ද්‍රකයයි. එකුන් අනූ චිත්තය ආශ්‍රව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයන් ඇතුලත් නොවූ බැවින් සප්පදෙස ද්‍රකනම්.

තෘතිය ද්‍රකයෙහි ප්‍රථම ද්‍රකයාගේ දෙවෙනි පදය බහා නො ආසවාචෙව ධම්මා ආසව සම්පයුත්තාපි ආසව විප්පයුත්තාපි යන ද්‍රකයක් ද විය යුත්තේයි

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල්ය. ආශ්‍රව ධර්ම වර්ජිත සූවිසි චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත සත් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. ආසව ධර්මයන් මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුකනම්.

තෘතිය දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා ආසවා ධම්මා ආසව සම්පයුත්තාපි ආසව විප්පයුත්තාපි යන දුකයක් ද විය යුත්තේයි. ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල්ය දෙස මූලික මෝහ මූලික සිත් සතරෙහි යෙදුනාවූ මෝහය හැර සත්විසි චෛතසිකය යන මොවුහුයි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අකුසල් සිත් වර්ජිත ලෞකික එකුන් සැත්තෑ චිත්තය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය වෙෂ මූල මෝහ මූලයන්හි මෝහය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. ලෝකොත්තර සිත් අට තත් සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය නිර්වාණය මෙහි ඇතුලත් නොවූහෙයින් සප්පදෙස දුකනම්.

ප්‍රථම දුකයෙහි දුතිය දුකයාගේ ප්‍රථම පදය බහා සාසවං චෙව ධම්මා ආසවාපි නො ආසවාපි යන දුකයක් ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ආසව ධර්මයෝ තිදෙනායි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ආසව ධර්ම වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. ලෝකොත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුකනම්.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා ආසව සම්පයුත්තා ධම්මා ආසවාපි නො ආසවාපි යන දුකයක්ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝභ මූලික සිත් අටෙහි යෙදුනා වූ ආශ්‍රව ධර්මයෝ තුන්දෙනා ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල්ය ආශ්‍රව වර්ජිත සුවිසි චෛතසිකය යන මොව්හු ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. දෙලොස් අකුසල් වර්ජිත සත් සැත්තෑ චිත්තය අට තිස් චෛතසිකය ලොභ මූල මොහ මූලයන්හි යෙදුනාවූ මොහය අට විසි රූපය නිර්වාණය මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නමි.

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ දුතිය පදය බහා ආසව විප්පයුත්තා ධම්මා ආසවාපි නො ආසවාපි යන දුකයක් ද විය යුත්තේයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙස මූලික මෝහ මූලික සිත් සතරෙහි යෙදුනාවූ මෝහයයි.

මෙහි දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල් වර්ජිත සත් සැත්තෑ චිත්තය අට තිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. දෙලොස් අකුසල් හා ලොභ මූල මොහ මූලයන්හි මොහය වර්ජිත සත්විසි චෛතසිකයන් මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුකනමි. කියන ලද සියලු පදයන්හිම ස්කන්ධාදිය (බෙදා වෙන්කිරීම් කල යුතුයි)

**ආසව ගොච්ඡක අර්ථ වර්ණනාව නිමියේයි.**

ආසව ගොච්ඡකයට අනතුරුව සඤ්ඤොජන ගොච්ඡකය වදාලසේක. හෙද සඤ්ඤොජන දුකාදින්ගේ වශයෙන් ස වැදෑරුම් වේ. ඔවුනතුරෙන් සඤ්ඤොජන දුකය පලමු කොට වදාලසේක. කෙසේ වදාලේ ද යත්? සඤ්ඤොජනා ධම්මා නො සඤ්ඤොජනා ධම්මා යනුවෙති. සඤ්ඤොජනා භව රථයෙහි යොදන ලද හෙයින් සංයෝජන නම් වූ (ධම්මා සන්ති)

නොසඤ්ඤොජනා භවරථයෙහි නොයොදන ලද හෙයින් සංයෝජන නම් නොවන්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ දෙස මාන දිට්ඨි විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය මොහ සංඛ්‍යාත සංයෝජන ධර්මයෝ අටදෙන ලැබෙති. දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය සංයෝජන ධර්ම වර්ජිතකොට ඇති සුසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නමුදු නිප්පදෙස දුක නමුදු වෙයි.

## සංයෝජන දුකයයි.

2 සංයොජන දුකයට අනතුරුව සඤ්ඤොජනීය දුකය වදාළසේක. කෙසේ වදාළ සේක්දයත්? සඤ්ඤොජනීයා ධම්මා අසඤ්ඤොජනීයා ධම්මා යනුවෙති. සඤ්ඤොජනීයා සංයොජන ධර්මයන්ට අරමුණු වූ (ධම්මාසන්ති)

අසඤ්ඤොජනීයා සංයොජන ධර්මයන්ට අරමුණු නොවන්නා වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නමුදු නිප්පදේශ දුක නමුදු වෙයි.

## සඤ්ඤොජනීය දුකයයි.

3 සඤ්ඤොජනීය දුකයට අනතුරුව සඤ්ඤොජන සම්පයුත්ත දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? සඤ්ඤොජන සම්පයුත්තා ධම්මා සඤ්ඤොජන විප්පයුත්තා ධම්මා යනුවෙති.

සඤ්ඤොජන සම්පයුත්තා සඤ්ඤොජන ධර්මයන් හා සමග සම්ප්‍රයුක්ත වූ (ධම්මා සන්ති)

සංයෝජන විප්පයුත්තා සංයෝජන ධර්මයන් හා සමග නො යෙදුනා වූ (ධම්මා සන්ති) මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසලය උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල වර්ජිත සත් සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය උද්ධච්ච සහගත සිතෙහි මෝහය අටවිසි රූපය නිර්වාණය ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නමුදු නිප්පදෙස දුක නමුදු වෙයි.

## සඤ්ඤොජන සම්පයුත්ත දුකයයි.

4. සඤ්ඤොජනාචෙව සඤ්ඤොජන නාම් වූ ද සංයොජනීයාච සංයෝජනයන්ට අරමුණු වූ ද (ධම්මා සන්ති) සංයෝජනීයා චෙව සංයෝජන ධර්මයන්ට අරමුණුවූ ද නොච සඤ්ඤොජනා සංයෝජන නාම් නොවූ ද (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සඤ්ඤොජන ධර්මයෝ අවදෙනයි. දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව සඤ්ඤොජන ධර්මවර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නම්. ලොකොත්තර ධර්ම සියල්ල ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

සඤ්ඤොජනීය සඤ්ඤොජන දුකයයි.

5. සඤ්ඤොජනා චෙව සඤ්ඤොජන නම් වූ ද සඤ්ඤොජන සම්පයුත්තාච සංයෝජන ධර්මයන් හා සමග යෙදුනා වූ ද (ධම්මා සන්ති)

සඤ්ඤොජන සම්පයුත්තාචෙව සඤ්ඤොජන ධර්මයන් හා සමග යෙදුනා වූ ද නොච සඤ්ඤොජනා සංයෝජන නම් නොවූ ද (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදුනාවූ මොහය හැර සංයෝජන ධර්මයෝ අවදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල සිත්ය සංයෝජන ධර්ම වර්ජිත එකුන්විසි චෛතසිකයෝ ලැබෙති.

ආදිලබ්ධනාම් දුකයයි. අකුසල චිත්තොත්පාද වර්ජිත අතිරික්ත පරමාර්ථධර්ම සියල්ල මෙහි ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

සඤ්ඤොජන සම්පයුත්ත දුකයයි.

6. සඤ්ඤොජන විප්පයුත්තා ඛොපන සඤ්ඤොජනයන් හා සමග විප්‍රයුක්තවූ ද සඤ්ඤොජනීයාපි සංයෝජනයන්ට අරමුණුවූ ද (ධම්මා සන්ති) සඤ්ඤොජන විප්පයුත්තා ඛොපන සංයෝජනයන් හා සමග නොයෙදුනාවූ ද අසඤ්ඤොජනීයාපි සඤ්ඤොජනයන්ට අරමුණු නොවූ ද (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල සිත් වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව අටතිස් චෛතසිකය උද්ධච්ච සහගත සිතෙහි මොහය අටවිසි රූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොකොත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි. දොළොස් අකුසල සිත් හා උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛතසිකයන් මෙහි ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

සඤ්ඤොජන විප්පයුත්ත සඤ්ඤොජනීය දුකයයි.

## පාලියාගත දුකයන්ගේ අර්ථවර්ණනාව නිමියේයි.

ප්‍රථම දුකයෙහි තෘතීය දුකයාගේ ප්‍රථම පදය බහා සඤ්ඤොජනාචෙව ධම්මා සඤ්ඤොජන සම්පයුත්තාච සඤ්ඤොජන සම්පයුත්තා චෙව ධම්මා නොච සඤ්ඤොජනා යන පස්වෙනි දුකය හටගන්නාක් මෙන් ප්‍රථම දුකයෙහි දුතිය දුකයාගේ දුතිය පදය බහා සඤ්ඤොජනා චෙව ධම්මා සඤ්ඤොජන විප්පයුත්තාච සඤ්ඤොජන විප්පයුත්තා චෙවධම්මා නොච සඤ්ඤොජනා යන දුකයක් ද විය යුත්තේයි ඒ දුකයෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදුනාවූ මොහය ලැබේ

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එක්විසි කුසල්ය. සතිස් විපාකය විසි ක්‍රියාය. අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම් දුකයයි. මේ දුකයෙහි දෙළොස් අකුසල්ය උද්ධච්ච සහගත සිතෙහි මොහය හැර අතිරික්ත සත් විසි චෛතසිකයන් ඇතුළත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

සඤ්ඤොජන විප්පයුත්තා ඛො පන ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයාපි යන දුකයෙහි සඞ්ගහිතා අසඞ්ගහිතොහොති යන පරිභාෂානයින් ඛො පන යන අධික ශබ්දයාගේ බලයෙන් ලැබියයුතු අතිරෙක දුකයන් අතුරෙන් දෙවෙනි දුකයෙහි තෘතීය දුකයාගේ දුතිය පදය බහා සඤ්ඤොජන විප්පයුත්තා ඛො පන ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයාපි යන හයවෙනි දුකය වූවාක් මෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා නොසඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජනීයාපි අසඤ්ඤොජනීයාපි යන දුකයක් ද විය යුත්තේයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව සඤ්ඤොජනධර්ම වර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති.

ආදි ලබ්ධනාම් දුක නම්. සඤ්ඤොජනධර්ම අට ඇතුළත් නොවූ හෙයින් සප්පදෙස දුක නාමී.

තෘතීය දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා සඤ්ඤොජනා ධම්මා සඤ්ඤොජන සම්පයුත්තාපි සඤ්ඤොජන විප්පයුත්තාපි යන දුකයක් ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මොහය හැර සඤ්ඤොජන ධර්මයෝ අටදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය ලැබේ. ආදි ලබ්ධනාම දුක නම්. එකුන් අනූ චිත්තය සංයොජන වර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුක නම්.

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා නොසංයොජනා ධම්මා සංයොජන සම්ප්‍රයුක්තාපි සංයොජන විප්පයුත්තාපි යන දුකයක් ද විය යුත්තේයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල සිත්ය. සංයොජන ධර්ම වර්ජිත එකුන් විසි චෛතසිකයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල චිත්තොත්පාද වර්ජිත සියලු පරමාර්ථධර්ම ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නම්. සංයොජන ධර්ම මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුක නම්

තෘතිය දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා සංයොජනියා ධම්මා සංයොජන සම්පයුත්තාපි විප්පයුත්තාපි යන දුකයක් ද විය යුතුයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල් සිත්ය. උද්ධච්චසහගත සිතෙහි මෝහය වර්ජිත සත්විසි චෛත-සිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව අටතිස් චෛතසිකය උද්ධච්චසහගත සිතෙහි මෝහය අටවිසි රූපය යන ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුකනම්. ලෝකොත්තර ධර්ම සියල්ල මෙහි ඇතුලත් නොවූ බැවින් සප්පදෙස දුක නමුදු වෙයි.

ප්‍රථම දුකයෙහි දෙවෙනි දුකයාගේ ප්‍රථම පදය බහා සංයොජනියාධම්මා සංයොජනාපි නොසංයොජනාපි යන දුකයක් ද විය යුත්තේයි.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සංයොජන ධර්මයෝ අටදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක්අසූව සංයෝජන ධර්ම වර්ජිත සූසාලිස් චෛතසිකය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

ප්‍රථම දුකයෙහි තෘතිය පදයාගේ ප්‍රථම පදය බහා සංයොජන සම්පයුත්තා ධම්මා සංයොජනාපි නොසංයොජනාපි යන දුකයක් ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය වර්ජිත සංයෝජන ධර්මයෝ අවදෙනා ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල සිත් හා සංයෝජන ධර්ම වර්ජිත එකුන් විසි චෛතසිකයෝ ලැබෙති. (සෙස්ස සුගමය.)

ප්‍රථම දුකයෙහි තෘතීය දුකයාගේ ප්‍රථම පදය බඟා සංයෝජන විප්පයුත්තා චෙව ධම්මා සංයෝජනාපි නොසංයෝජනාපි යන දුකයක් ද විය යුතුයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් උද්ධච්ච සහගත සිතෙහි මෝහය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසල් වර්ජිත සත් සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය ලැබෙති. (සෙස්ස සුගමයි)

## සංයෝජන ගොච්ඡක අර්ථවර්ණනාව නිමියේයි.

සංයෝජන ගොච්ඡකයට අනතුරුව ගන්ථගොච්ඡකය වදලසේක. හෙද ගන්ථ දුකය ආදි කොට හවැදෑරුම් දුකයෙක් වන්නේය. කෙසේ වදලසේක්දයත්? ගන්ථා සංසාරයෙහි සත්වයන් ගැටගසන හෙයින් ග්‍රන්ථ නම්වූ (ධම්මා සන්ති) නො ගන්ථා ග්‍රන්ථ නම් නොවන්නා වූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝභ වෙෂ දිට්ඨි යන ග්‍රන්ථ ධර්මයෝ තිදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ග්‍රන්ථ ධර්ම වර්ජිත සියලු පරමාර්ථයන් ලැබෙති. සෙස්ස සුගමයි.)

## ග්‍රන්ථදුකයයි.

2 ගන්ථනියා ග්‍රන්ථ ධර්මයන්ට අරමුණු වන්නා වූ (ධම්මා සන්ති)

අගන්ථනියා ග්‍රන්ථ ධර්මයන්ට අරමුණු නොවන්නා වූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයා ගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික ධර්ම සියල්ල ලැබෙති. දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති, (සෙස්ස සුගමයි.)

## ග්‍රන්ථනියදුකයයි.

3 ගන්ථසම්පයුත්තා ග්‍රන්ථ ධර්මයන් සමග යෙදුනාවූ (ධම්මා සන්ති)

**ගන්ථවිප්පයුත්තා** ග්‍රන්ථ ධර්මයන් **සමග** නොයෙදුනාවූ (ධම්මා සන්ති)

**මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොභ මූල ද්වේෂ මූල සිත් දසය විචිකිච්ඡා, ද්වේෂ වර්ජිත පස්විසි චෛතසිකය ලැබෙති.** (සෙස්ස සුගමයි)

**ගන්ථසම්පයුත්තදුකයයි.**

4 **ගන්ථාචෙව** ග්‍රන්ථ නම් වූ ද **ගන්ථනියාච** ග්‍රන්ථයන්ට අරමුණුවූ ද (ධම්මා සන්ති)

**ගන්ථනියාචෙව** ග්‍රන්ථයන්ට **අරමුණුවූ ද නොචගන්ථා** ග්‍රන්ථ නම් නොවන්නාවූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ **අභිධෙය්‍යාර්ථයෝ** නම් ග්‍රන්ථ ධර්මයෝ **තුන්** දෙනා ලැබෙති. දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ග්‍රන්ථ ධර්ම වර්ජිත සියලු ලෞකික ධර්මයන් ලැබෙති. **(සෙස්ස සුගමයි)**

**ගන්ථ ගන්ථ නිය දුකයයි**

5 **ගන්ථාචෙව** ග්‍රන්ථ නම් වූ ද **ගන්ථසම්පයුත්තාච** ග්‍රන්ථයන් සමග සම්පයුත්තවූ ද (ධම්මා සන්ති)

**ගන්ථසම්පයුත්තාචෙව** ග්‍රන්ථයන් සමග **සම්ප්‍රයුක්තවූ ද නොච ගන්ථා** ග්‍රන්ථ නම් **නොවූ ද** ධම්මා **සන්ති**

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝනම් ලොභ දිට්ඨි චෛතසික දෙදෙනා ලැබෙති. දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ **නම් ලොභ මූල ද්වේෂ මූල සිත්දසය ග්‍රන්ථ ධර්ම හා විචිකිච්ඡාවර්ජිත තෙවිසි චෛතසිකයෝ ලැබෙති.(සෙස්ස** සුගමයි.)

**ගන්ථ ගන්ථ සම්පයුත්ත දුකයයි.**

6 **ගන්ථවිප්පයුත්තා** බොපන ග්‍රන්ථ **ධර්මයන් සමග විප්‍රයුක්ත** වූ ද **ගන්ථනීයාපි** ග්‍රන්ථ ධර්මයන්ට අරමුණුවූ ද (ධම්මා සන්ති)

ගන්ථවිප්පයුත්තා **බොපන—පෙ—අගන්ථනීයාපි ග්‍රන්ථයන්ට අරමුණු** නොවූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොභ මූල ද්වේෂ මූල චිත්තෝත්පාදවර්ජිත ලෞකික ධර්ම සියල්ල ලැබෙති.

**දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම්** ලොකෝත්තර ධර්ම සියල්ල ලැබෙති.

ආදි ලබ්ධනාම දුකයයි ලොභමූලික සිත් අටය ද්වේෂ මූල දෙසිතය දිට්ඨිගත විප්පයුත්ත **සිත්** සතරෙහි ලොභය හා ද්වේෂයද විචිකිච්ඡාවර්ජිත පස්විසි **චෛතසිකය** මෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

ග්‍රන්ථ විප්පයුත්ත ගන්ථනීය දුකයයි.

**පාළිආගත දුකයාගේ අර්ථවර්ණනාව සමාප්තයි.**

ප්‍රථම දුකයෙහි තෘතීය දුකයාගේ ප්‍රථම පදය බහා ගන්ථාචෙව ධම්මා ගන්ථසම්පයුත්තා ච ගන්ථසම්පයුත්තාචෙව ධම්මා නොචගන්ථා යන පස්වෙනි දුකය හටගන්නාක් මෙන් පලමුවෙනි දුකයෙහි තෘතීය දුකයාගේ දෙවෙනි පදය බහා ගන්ථාචෙව ධම්මා ගන්ථ විප්පයුත්තා ච ගන්ථ විප්පයුත්තා චෙවධම්මා නොචගන්ථා යන දුකයක්ද විය යුත්තේය.

ගන්ථාචෙව ගන්ථ නම් වූ ද ගන්ථවිප්පයුත්තාච ග්‍රන්ථයන් හා විප්පයුත්ත වූ ද (ධම්මා සන්ති)

ගන්ථ විප්පයුත්තාචෙව ග්‍රන්ථයන් හා විප්‍රයුක්තවූ ද නොච ගන්ථා ග්‍රන්ථ නම් නොවන්නා වූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි ලෝභය හා ද්වෙෂ මූල දෙ සිතෙහි ද්වෙෂය ලැබේ.

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෝභ මූල ද්වෙෂ මූල වර්ජිත එකුන් අසූ චිත්තය ලෝභ දිට්ඨි මාන දොස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච ථිනමිද්ධ වර්ජිත තෙසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය ලැබෙති.

ආදි ලබ්ධනාම දුකය නම්. ලෝභ මූලික සිත් අටය ද්වෙෂ මූල දෙසිතය දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි ලෝභ ද්වෙෂ මූල දෙසිතෙහි ද්වෙෂය විචිකිච්ඡා වර්ජිත පස්විසි චෛතසිකය දුක මූලකාවූ හෙයින් සප්පදෙස දුක නම්.

ගන්ථ විප්පයුත්තා ඛොපන ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි යන දෙශනාවෙහි සද්දාධිකා අත්ථාධිකො හොති යන පරිභාෂානයින් ඛොපන යන අධිකාර්ථ ශබ්දයන් කරණකොට ගෙන ලැබෙන්නාවූ අතිරෙක දුකයන් අතුරෙන් දෙවෙනි දුකයෙහි තෘතීය දුකයාගේ දෙවෙනි පදය බහා ගන්ථවිප්පයුත්තා චෙව ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි යන සවෙනි දුකය හටගන්නාක් මෙන් දෙවෙනි දුකයෙහි ප්‍රථම දුකයාගේ දෙවෙනි පදය බහා නො ගන්ථා ධම්මා ගන්ථනීයාපි අගන්ථනීයාපි යන දුකයක්ද වියයුත්තේය.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව ග්‍රන්ථධර්ම වර්ජිත එකුන්පණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි)

තෘතිය දුකයෙහි ප්‍රථමදුකයාගේ ද්විතිය පදය බහා නො ගන්ථා ධම්මා ගන්ථ සම්පයුත්තාපි ගන්ථවිප්පයුත්තාපි යන දුකයක් ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ සිත් අටය ද්වෙෂ මූල දෙසිතය ලොභ දිට්ඨි ද්වෙෂ විචිකිච්ඡාවර්ජිත තෙවිසි චෛතසිකය ලැබෙති.

ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ මූල ද්වෙෂ මූල වර්ජිත එකුන් අසූ චිත්තය ලොභ දිට්ඨි මාන දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථිනමිද්ධ වර්ජිත තෙසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මොනතක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

තෘතිය දුකයෙහි ප්‍රථම දුකයාගේ ප්‍රථම පදය බහා ගන්ථාධම්මා ගන්ථසම්පයුත්තා ගන්ථවිප්පයුත්තාපි යන දුකයක්ද වියයුත්තේයි.

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලොභ දිට්ඨි යන දෙදෙන ලැබෙති.

ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ද්වෙෂ මූල දෙසිතෙහි ද්වෙෂය ලැබේ. (සෙස්ස සුගමයි)

ප්‍රථම දුකයෙහි ද්විතිය දුකයාගේ ප්‍රථම පදය බහා ගන්ථනීයා ධම්මා ගන්ථාපි නොගන්ථාපි යන දුකයක්ද වියයුත්තේයි.

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ දිට්ඨි ද්වෙෂ යන ධර්මයෝ තිදෙනායි. ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ග්‍රන්ථ ධර්ම වර්ජිත ලෞකික ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි )

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ප්‍රථම පදය බහා ගන්ථ සම්පයුත්තා ධම්මා ගන්ථාපිනො ගන්ථාපි යන දුකයක්ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත සම්ප යුත්ත සිත් සතරෙහි ලොභදිට්ඨි ග්‍රන්ථ දෙදෙන ලැබෙති.

ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ මූල ද්වෙෂ මූල සිත් දසය. ග්‍රන්ථත්‍රයන් හා විචිකිච්ඡා වර්ජිත තෙවිසි චෛතසිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

ප්‍රථම දුකයෙහි තෘතිය දුකයාගේ ද්විතිය පදය බහා ගන්ථ විප්පයුත්තා ධම්මා ගන්ථාපි නොගන්ථාපි යන දුකයක්ද විය යුත්තේයි.

එහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි ලොභය හා ද්වෙෂ මූල දෙසිතෙහි ද්වෙෂය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ මූල ද්වේෂ මූල වර්ජිත එකුන්අසූ චිත්තය ලෝභදිට්ඨි මානදෙස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච ථිනමිද්ධවර්ජිත තෙසාලිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම් දුකය නම්. ලෝභමූල දොසමූල සිත් දසය දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි ලෝභය හා දොසමූල දෙසිතෙහි දොසය හැර පස්විසි චෛතසිකය දුකමුත්තයහ.

## ගන්ථ ගොච්ඡක අර්ථ වර්ණනාව නිමියේය.

ගන්ථ ගොච්ඡකයට අනතුරුව ඕඝ ගොච්ඡකය දේශනා කළසේක. ඒ ඕඝ ගොච්ඡකයකයද ඕඝ දුකය ආදි කොට ඇති දුක සයකින් යුක්තවේ. එයින් ඕඝ දුකය පළමුකොට වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? ඕඝා ධම්මා නො ඕඝා ධම්මා යනුවෙනි

ඕඝා සත්වයන් සංසාර සාගර පත්ලෙහි ගසන්නාවූ අර්ථයෙන් ඕඝ නම් වූ (ධම්මා සන්ති)

නොඕඝා ඕඝ නම් නොවන්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝභ දිට්ඨි මෝහ සඞ්ඛ්‍යාත ඕඝ ධර්මයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකුන් අණූ චිත්තය ඕඝ ධර්මයන් වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති.

ආදි ලබ්ධනාම දුක නමුදු නිප්පදෙස දුක නමුදු වෙයි.

2. ඕඝ දුකයට අනතුරුව—ඕඝනීය දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත්? ඕඝනියා ධම්මා අනොඝනියා ධම්මා යනුවෙනි. (සෙස්ස ආසව ගොච්ඡකයෙහි දෙවන දුකය හා සමානයි.)

3. ඕඝනීය දුකයට අනතුරුව ඕඝ සම්පයුත්ත දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත් ඕඝ සම්පයුත්තා ධම්මා ඕඝ විප්පයුත්තා ධම්මා යනුවෙනි. (සෙස්ස ආසව ගොච්ඡකයෙහි තුන්වන දුකය මෙනි.)

4 ඕඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඕඝ ඕඝනීය දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත් ඕඝා චෙව ධම්මා ඕඝනීයා ච ඕඝ නියා චෙව ධම්මා නො ච ඕඝා යනුවෙනි. (සෙස්ස ආසව ගොච්ඡකයෙහි හතර වන දුකය මෙනි.)

5. ඕඝ ඕඝනීය දුකයට අනතුරුව ඕඝ ඕඝ සම්පයුත්ත දුකය වදාළසේක. කෙසේ වදාළසේක්දයත් ඕඝා චෙව ධම්මා ඕඝ සම්පයුත්තා ච ඕඝ සම්පයුත්තා චෙව ධම්මා නො ච ඕඝා යනුවෙනි. (සෙස්ස ආසව ගොච්ඡකයෙහි පස් වන දුකය මෙනි.)

6. ඔඝ ඔඝ සම්පයුත්ත දුකයට අනතුරුව ඔඝ විප්පයුත්ත ඔඝනීය දුකය වදළසේක. කෙසේ වදළසේක්දයත්? ඔඝ විප්පයුත්තා ඛො පන ඔඝනීයාපි අනොඝනීයාපි යනුවෙනි. (සෙස්ස ආසව ගොච්ඡක සවන දුකය මෙනි.)

## පාළ්‍යාගත අර්ථ වර්ණනාවයි.

ඛොපනයන අධිකාර්ථ පදයක් නිසා අටුවාටීකානයින් ගනු ලබන සම්භව දුකයන්ද ආසව ගොච්ඡකය හා සමාන වන බැවින් පාලිමාත්‍රය පමණක් දක්වන්නෙමු.

1. නො ඔඝා ධම්මා ඔඝනීයාපි, අනොඝනීයාපි
2. ඔඝා ධම්මා ඔඝ සම්පයුත්තාපි, ඔඝ විප්පයුත්තාපි
3. නො ඔඝා ධම්මා ඔඝ සම්පයුත්තාපි. ඔඝ විප්පයුත්තාපි
4. ඔඝනීයා ධම්මා ඔඝ සම්පයුත්තාපි, ඔඝ විප්පයුත්තාපි
5. ඔඝනීයා ධම්මා ඔඝාපි, නො ඔඝාපි
6. ඔඝ සම්පයුත්තා ධම්මා ඔඝාපි, නො ඔඝාපි
7. ඔඝ විප්පයුත්තා ධම්මා ඔඝාපි, නො ඔඝාපි,

මෙහි සියලුම අර්ථවර්ණනාව ආසව ගොච්ඡකය බලා දත යුත්තේය. දේශනා විලාස වශයෙන් ද හා පුග්ගල ධ්‍යාස වශයෙන් ද ආසව ඔඝ යොග ගොච්ඡකයන් වදළේවි නමුත් ධර්ම වශයෙන් වෙනසක් නැත්තේය. වෙනස වනාහි ව්‍යංජනය පමණමැයි.

## ඔඝ ගොච්ඡක වර්ණනාවයි.

ඔඝ ගොච්ඡකයට අනතුරුව යොග ගොච්ඡකය වදළසේක. හෙද යොග දුකාදීන්ගේ වශයෙන් සමුදුරුමි. හේ කෙසේදයත්?

1. යොගා ධම්මා, නොයොගා ධම්මා
2. යොග නීයා ධම්මා, අයොගනීයා ධම්මා
3. යොග සම්පයුත්තා ධම්මා, යොග විප්පයුත්තා ධම්මා
4. යොගාචෙව ධම්මා යොගනීයාච, යොග නීයාචෙව ධම්මා නොච යොගා
5. යොගා චෙව ධම්මා යොග සම්පයුත්තාච, යොග සම්පයුත්තා චෙව ධම්මා නොචයෝගා
6. යොග විප්පයුත්තා ඛොපන ධම්මා යොගනීයාපි අයොගනීයාපි, පාළියෙහි ආදුකයෝයි.

## අටුවානය වශයෙන්

1. යොගාචෙව ධම්මා යොග විප්පයුත්තාච, යොගවිප්පයුත්තා චෙව ධම්මා නොචයොගා
2. නොයොගා ධම්මා, යොග නීයාපි අයොග නීයාපි

## පිණ්ඩනය වශයෙන්

1. යොගා ධම්මා යොග සම්පයුත්තාපි, යොග විප්පයුත්තාපි
2. යොගනීයා ධම්මා යොග සම්පයුත්තාපි, යොගවිප්පයුත්තාපි
3. යොගනීයා ධම්මා යොගාපි, නොයොගාපි,
4. යොග සම්පයුත්තා ධම්මා යොගාපි, නොයොගාපි
5. යොග විප්පයුත්තා ධම්මා යොගාපි, නොයොගාපි,

(මෙහි සියලු විස්තර විභාග සහිත අර්ථ වර්ණනාව ආසව ඔඝ ගොච්ඡකයන්ට සමානමැයි)

## යොග ගොච්ඡකයයි

යොග ගොච්ඡකයට අනතුරුව නීවරණ ගොච්ඡකය චදුලසේක හෙද නීවරණදුකදින්ගේ වශයෙන් සවැදෑරුම්. කෙසේදයත්? නීවරණා ධම්මා නොනීවරණා ධම්මා යනුවෙනි.

නීවරණා නීවරණ නම්වූ නොහොත් නිවන් මග ආවරණය කරන්නාවූ (ධම්මාසන්ති) නො නීවරණා නිවන් මග ආවරණය නොකරන්නාවූ නොහොත් නීවරණ නම් නොවන්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ දොස මොහ ථින මිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡායන ධර්මයෝ අටදෙන ලැබෙති.

ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූචිත්තය නීවරණ ධර්ම වර්ජිත සුසාලිස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය ලැබෙති. (සෙස්ස සුගමයි).

2 නීවරණියා නීවරණයන්ට අරමුණුවූ (ධම්මාසන්ති) අනීවරණියා නීවරණයන්ට අරමුණු නොවූ (ධම්මාසන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක්අසූව දෙපණස් චෛතසිකය අට විසි රූපය ලැබෙති. ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

3. නීවරණසම්පයුත්තා නීවරණ ධර්මයන් සමග සම්ප්‍රයුක්තවූ (ධම්මාසන්ති)

නීවරණවිප්පයුත්තා නීවරණයන් සමග විප්‍රයුක්තවූ (ධම්මාසන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල චිත්තය සත් විසි චෛතසිකය ලැබෙති.

ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල වර්ජිත සත් සැත්තෑ චිත්තය අටතිස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය ලැබෙති. (සෙස්ස සුගමයි)

4. නීවරණාචෙව නීවරණනාමවූද නීවරණියාච නීවරණයන්ට අරමුණුවූද (ධම්මා සන්ති)

නීවරණියාචෙව නීවරණයන්ට අරමුණුවූ ද නොච නීවරණා නීවරණ නාම් නොවූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නාම් නීවරණ ධර්ම අටදෙන ලැබෙති.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනාම් ලෞකික සිත් එකාසූව නීවරණ ධර්ම වර්ජිත තත් සමප්‍රයුක්ත සූසාලිස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති. (ලෝකෝත්තර ධර්ම මේ ද්‍වකයෙහි ඇතුලත් නොවන්නාහ.)

5. නීවරණාචෙව නීවරණනාම්වූද නීවරණ සම්පයුත්තාච නීවරණයන් සමග යෙදුනාවූ ද (ධම්මා සන්ති)

නීවරණ සම්පයුත්තාචෙව නීවරණයන් සමග යෙදුනාවූ ද නොච නීවරණා නීවරණ නාම් නොවූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනාම් නීවරණ ධර්ම අටදෙන ලැබෙති. ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනාම් දෙළොස් අකුසල් හා නීවරණ ධර්ම වර්ජිත එකුන්විසි චෛතසිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

6 නීවරණ විප්පයුත්තා චොපන නීවරණයන් සමග නොයෙදුනාවූද නීවරනීයාපි නීවරණයන්ට අරමුණුවූද (ධම්මා සන්ති)

නීවරණ විප්පයුත්තා චොපන නීවරණයන් සමග නොයෙදුනාවූ ද නීවරණියාපි නීවරණයන්ට අරමුණුවූ ද ධම්මා සන්ති) අනීවරණියාපි නීවරණයන්ට අරමුණු නොවූ ද (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනාම් දෙළොස් අකුසල් වර්ජිත ලෞකික සිත් එකුන් සැත්තෑව තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝනාම් ලෝකෝත්තර සිත් අටය සතිස් චෛතසිකය නිර්වාණය ලැබෙති. (සෙස්ස සුගමයි) අවුචාගත නය වශයෙන් වනාහි

1. නොනීවරණ ධම්මා නීවරණියාපි, අනීවරණියාපි

2. නොනීවරණා ධම්මා නීවරණ සම්පයුත්තාපි, නීවරණ විප්පයුත්තාපි කියා ද්‍වකයෝ දෙදෙනෙක. මූලචික්කානය වශයෙන්

1. නීවරණියා ධම්මා නීවරණ සම්පයුත්තාපි, නීවරණ විප්පයුත්තාපි

2. නීවරණියා ධම්මා නීවරණාපි, නොනීවරණාපි

3. නීවරණ සම්පයුත්තා ධම්මා නීවරණාපි, නොනීවරණාපි

අවුවාගත ටිකාගත දුක පංචකයාගේ අර්ථ වර්ණනාවයට ගොච්ඡකයන්ට කියන ලද නයානුසාරයෙන් දත යුත්තේය.

නීවරණ ගොච්ඡක අර්ථ වර්ණනාවයි

නීවරණ ගොච්ඡකයට අනතුරුව පරාමාස ගොච්ඡකය වදාරණ ලදී. හෙද පරාමාස දුක ආදීන්ගේ වශයෙන් පස් වැදෑරුම් හේ තෙභේදයත් පරාමාසා ධම්මා නොපරාමාසා ධම්මා යනාදී වශයෙනි.

**පරාමාසා** මිථ්‍යාවශයෙන් අල්වා ගනු ලබන හෙයින් පරාමාස නම් වූ (ධම්මා සන්ති)

**නොපරාමාසා** මිථ්‍යා වශයෙන් අල්වා නොගන්නා ලද හෙයින් පරාමාස නම් නොවූ )ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨි චෛතසිකය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෙසු පරමාර්ථ ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි)

2 **පරාමට්ඨා** පරාමාස ධර්මයන්ට අරමුණු වූ (ධම්මා සන්ති)

**අපරාමට්ඨා** පරාමාසයන්ට අරමුණු නො වූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි)

3 **පරාමාස සම්පයුත්තා** පරාමාසයන් හා සමග යෙදුනා වූ (ධම්මා සන්ති)

**පරාමාස විප්පයුත්තා** පරාමාසයන් හා සමග නොයෙදුනා වූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත සම්ප යුත්ත සිත් සතරය හත් සම්ප්‍රයුක්ත දිට්ඨිවර්ජිත සමවිසි චෛත සිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අතිරික්ත පන් අසූ චිත්තය, දිට්ඨිවර්ජිත එක්පණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය ලැබෙති.

දිට්ඨි තොමෝ මේ දුකයෙහි ඇතුලත් නොවූ හෙයින් සප්පදෙස දුක නම්.

4 **පරාමාසාචෙව** පරාමාස නම් වූ ද **පරාමට්ඨාච** පරාමාස යන්ට අරමුණුවූ ද (ධම්මා සන්ති)

පරාමට්ඨාචෙව පරාමාසයන්ට අරමුණු වූ ද නොපරාමාසා පරාමාස නම් නොවූ ද (ධම්මා සන්ති.)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකම දිට්ඨි චෛතසිකය ලැබේ. දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දිට්ඨි වර්ජ්ජිත අතිරික්ත ලෞකික ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි)

5 පරාමාස විප්පයුත්තා ඛොපන පරාමාසයන් හා සමග නොයෙදුනා වූ ද පරාමට්ඨාපි පරාමාසයන්ට අරමුණු වූ ද (ධම්මා සන්ති.)

පරාමාස විප්පයුත්තා ඛොපන පරාමාසයන් හා සමග නොයෙදුනා වූ ද අපරාමට්ඨාපි පරාමාසයන්ට අරමුණු නොවූ ද (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දිට්ඨිගත සම්පයුත්ත සිත් සතර හා දිට්ඨිවර්ජ්ජිත කොට ඇති ලෞකික ධර්ම සියල්ල ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෝකොත්තර ධර්ම සියල්ල ලැබෙති.

දිට්ඨිගත සම්පයුත්ත සිත් සතර හා තත් සම්ප්‍රයුක්ත එක් විසි චෛතසිකය මේ දුකයෙහි ඇතුළත් නොවූහ. මෙහි ඛොපන-ශබ්දයාගේ අතිරේක අර්ථ ග්‍රහණයවන බැවින් අටුවා නයින්,

1 නො පරාමාසා ධම්මා පරාමට්ඨාපි, අපරාමට්ඨාපි.

2 නො පරාමාස ධම්මා පරාමාස සම්පයුත්තාපි, පරාමාස විප්පයුත්තාපි කියා දුකයෝ දෙදෙනෙක් වෙති.

මූලටීකා නයින්

1 පරාමට්ඨා ධම්මා පරාමාස සම්පයුත්තාපි, පරාමාස විප්පයුත්තාපි.

2 පරාමට්ඨා ධම්මා පරාමාසාපි නොපරාමාසාපි, දැයි දුකයෝ දෙදෙනෙක් විය යුත්තාහ.

මෙහි විස්තරාර්ථ වර්ණනාව යටකී නයානුසාරයෙන් දත යුත්තේය.

පරාමාස ගොච්ඡක වර්ණනාවයි.

1 පරාමාස ගොච්ඡකයට අනතුරුව මහන්තර දුකය වදාළ සේක. හෙද සාරම්මණ දුක ආදීන්ගේ වශයෙන් තුදුස් වැදෑරුම් වේ. කෙසේද යත්? සාරම්මණා ධම්මා අනාරම්මණා ධම්මා යනාදි වශයෙනි.

සාරම්මණා අරමුණුකිරීම් සහිත වූ (ධම්මාසන්ති)

අනාරම්මණා අරමුණුකිරීම් රහිත වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය ලැබෙති.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අටවිසිරූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගම්යි.)

2 චිත්තා චිත්ත නම් වූ (ධම්මාසන්ති)

නො චිත්තා චිත්ත නම් නොවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තයෝ ලැබෙති.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙපණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගම්යි.)

3 චෙතසිකා චෛතසික නම් වූ (ධම්මාසන්ති)

අචෙතසිකා චෛතසික නම් නො වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙපණස් චෛතසිකයෝ ලැබෙති.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය අටවිසි රූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති (සෙස්ස සුගම්යි)

4 චිත්ත සම්පයුත්තා සිත හා සමග එකොත්පාදාදි භාවයෙන් මිශ්‍ර වූ (ධම්මාසන්ති) චිත්ත විප්පයුත්තා සිත හා සමග...පෙ... මිශ්‍ර නො වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයෙහි චෛතසිකයෝ ලැබෙති. ද්‍විතීය පදයෙන් එකුන් අනූ චිත්තය අටවිසි රූප හා නිර්වාණය ලැබෙති.

5 චිත්තසංසට්ඨා සිත හා මිශ්‍ර වූ (ධම්මාසන්ති)

චිත්ත විසංසට්ඨා සිත හා මිශ්‍ර නො වූ (ධම්මාසන්ති)

(සෙස්ස හතරවෙනි දුකයට සමානයි.

6 චිත්තසමුට්ඨානා සිත කරණකොට ගෙන හටගන්නා වූ (ධම්මාසන්ති)

නොචිත්තසමුට්ඨානා සිත කරණකොට ගෙන හට නො ගන්නා වූ (ධම්මාසන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙපණස් චෛතසිකය හා චිත්තජ රූප සතළොස ලැබෙති.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය විසිකර්මජ රූප, ඍතුජරූප පසළොස තුදුස් ආහාරජරූප හා නිර්වාණය ලැබෙති. (සෙස්ස යට කී නයින් දතයුතු)

7 චිත්තසහභුනො සිත හා සමග හටගන්නා වූ (ධම්මාසන්ති)

නො චිත්ත සහභුනො සිත හා සමග හට නොගන්නා වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෙපණස් චෛතසිකය හා විඤ්ඤත්ති රූපවය ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නාම් එකුන් අනූ චිත්තය විඤ්ඤත්තිරූපවජ්ජිත සවිසි රූප හා නිර්වාණය ලැබෙති.

8 චිත්තානුපරිවත්තිනො සිත හා අනුව පෙරලෙන්නා වූ (ධම්මාසන්ති)

නොචිත්තානුපරිවත්තිනො සිත හා අනුව නොපෙරලෙන්නා වූ (ධම්මාසන්ති) මෙහි සියලු විභාග සත්වෙනි දුකයට සමානයි

9 චිත්තසංසට්ඨසමුට්ඨානා සිත් හා මිශ්‍ර වූ ද සිත කරණ කොට ගෙන හටගන්නාවූ ද (ධම්මාසන්ති)

නො චිත්තසංසට්ඨසමුට්ඨානා සිත හා මිශ්‍ර නො වූ ද සිත කරණකොට ගෙන හට නොගන්නා වූද (ධම්මාසන්ති)

මෙහි සියලු අර්ථ විභාග තුන්වන චෛතසික දුකය මෙනි

10 චිත්තසංසට්ඨ සමුට්ඨාන සහභුනො සිත හා මිශ්‍ර වූ ද සිත කරණකොට ගෙන හටගන්නා වූ ද සිත හා එක්ව උපදනා වූද (ධම්මාසන්ති)

නොචිත්තසංසට්ඨ සමුට්ඨාන සහභුනො සිත හා සමග මිශ්‍ර නො වූ ද සිත කරණකොට ගෙන හට නොගන්නා වූ ද සිත හා එක්ව නුපදනා වූ ද (ධම්මාසන්ති)

මෙහි විස්තර විභාග චෛතසික දුකයට සමානයි.

11 චිත්තසංසට්ඨසමුට්ඨාන චිත්තානු පරිවත්තිනො සිත හා මිශ්‍ර වූ ද සිත කරණකොට ගෙන හටගන්නා වූ ද සිත අනුව පෙරලෙන්නා වූ ද (ධම්මාසන්ති)

නො චිත්තසංසට්ඨ සමුට්ඨාන චිත්තානුපරිවත්තිනො සිත හා මිශ්‍ර නො වූ ද සිත කරණකොට ගෙන හට නොගන්නා වූ ද සිතට අනුව නොපෙරලෙන්නා වූ ද (ධම්මාසන්ති)

මෙහි සියලු විස්තර විභාග චෛතසික දුකයට සමානයි.

12 අජ්ඣත්තිකා ආත්මය අධිපති කොට පවත්නා වූ (ධම්මාසන්ති) බාහිරා ආත්මයෙන් පිටත්හි හටගන්නා වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය හා ප්‍රසාද රූප පස්දෙන ලැබෙති. ද්විතීය පදයාගේ අභි–

ධෙයාඪීයෝ නම් දෙපණස් චෛතසික පසාද වජ්ජිත තෙවිසි රූපය නිර්වාණය ලැබෙති.

13 උපාදා, නිශ්‍රයකොට ගෙන නොහොත් නිසා හටගන්නාවූ (ධම්මාසන්ති)

නොඋපාදා නිශ්‍රයකොට නොගෙන නොහොත් නිසා හට නොගන්නාවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාඪීයෝ නම් භූතරූප වජ්ජිත සූවිසි රූපයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාඪීයෝ නම් සෙසු සියලු පරමාඪී ධම් ලැබෙති.

14 උපාදින්නා අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් ගෙන් යුක්තව කම්ය විසින් තමාගේ ඵලභාවයෙන් ලංකොට ගන්නා ලද්ද වූ (ධම්මාසනති)

නො උපාදින්නා අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් ගෙන් යුක්තව කම්ය විසින් තමාගේ ඵලභාවයෙන් ලංකොට නොගන්නා ලද්දවූ (ධම්මාසනති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාඪීයෝ නම් දෙතිස් ලෞකික විපාක චිත්තය හත් සම්ප්‍රයුතත පන්තිස් චෛතසිකය විසිකම්ජ රූප ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාඪීයෝ නම් ලෞකික විපාක වජ්ජිත සත්පණස් චිත්තය හත් සම්ප්‍රයුතත දෙපණස් චෛතසිකය සතළොස් චිත්තජරූපය පසළොස් උතුජරූප තුදුස් ආහාරජ රූප හා නිර්වාණය ලැබෙති.

සියලු පදයන්ගේ සකන්ධ ආයතනධාතු සත්‍ය බෙදා වෙන් කිරීම් යට කී නයානුසාරයෙන් දතයුත්තේයි.

මහන්තර දුකයාගේ අර්ථවණ්ණනාව නිමියේයි.

මහන්තර දුකයට අනතුරුව උපාදාන ගොච්ඡකය වදාළසේක. ඒ උපාදාන ගොච්ඡකයද උපාදාන දුකය ආදී කොට ඇති සවැදෑරුම් දුකයන්ගෙන් සමන්විතය. ඒ කෙසේදයත්?

1 උපාදානා ධම්මා නොඋපාදානා ධම්මා යනාදී වශයෙනි.

උපාදානා ඉතා දැඩිකොට අල්වාගන්නා අර්ථයෙන් උපාදාන නම් වූ (ධම්මාසන්ති)

නොඋපාදානා උපාදාන නම් නොවූ (ධම්මාසන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාඪීයෝ නම් ලොභදිට්ඨි යන චෛතසිකයෝ දෙදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභදිට්ඨි වර්ජිත අතිරික්ත පරමාර්ථ ධර්ම ලැබෙති.

2 (සෙස්ස සුගමයි)

2 උපාදනීයා උපාදනයන්ට අරමුණු වූ (ධම්මාසන්ති)

අනුපාදනීයා උපාදනයන්ට අරමුණු නොවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික ධර්ම සියල්ල ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි.)

3 උපාදන සම්පයුත්තා උපාදනයන් හා සමග සම්ප්‍රයුක්ත වූ (ධම්මාසන්ති)

උපාදන විප්පයුත්තා උපාදනයන් හා සමග විප්‍රයුක්තවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ මූලික සිත් අටය දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි යෙදුනා වූ ලොභය හා දෙස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡාවර්ජිත දෙවිසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභමූල සිත් වර්ජිත එක් අසූ චිත්තය තත් සම්ප්‍රයුක්ත ලොභදිට්ඨිමාන වර්ජිත එකුන් පණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය ලැබෙති,
(සෙස්ස සුගමයි)

4 උපාදනාචෙව උපාදන නම්වූ ද උපාදනියාච උපාදනායන්ට අරමුණුවූ ද (ධම්මාසන්ති)

උපාදනියාචෙව උපාදනයන්ට අරමුණුවූ ද නොච උපාදනා උපාදන නම් නොවූ ද (ධම්මාසන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභදිට්ඨි චෛතසික දෙදෙන ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව උපාදන වර්ජිත සමපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

(ලොකොත්තර ධර්ම මේ දුකයෙන් බැහැරවූහ )

5 උපාදනාචෙව උපාදන නම්වූ ද උපාදන සම්පයුත්තාච උපාදනයන් සමග සම්පයුත්තවූ ද (ධම්මාසන්ති)

උපාදන සම්පයුත්තාචෙව උපාදනයන් සමග සම්ප්‍රයුක්තවූ ද නොච උපාදනා උපාදන නම් නොවූ ද (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ඇති ලොභදිට්ඨි සංඛ්‍යාත උපාදාන ධර්මයෝ දෙදෙන ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභමූල සිත් අටය තත් සම්ප්‍රයුක්ත උපාදානවජ්ජිත සමවිසි චෛතසිකය ලැබෙති.

ලොභමූල සිත් වජ්ජිත එක් අසූ චිත්තය ලොභ දිට්ඨිමාන වජ්ජිත තත් සම්ප්‍රයුක්ත එකුන් පණස් චෛතසිකය අටවිසිරූපය හා නිර්වාණය මේ දුකයෙන් බැහැරවූහ.

6 උපාදානවිප්පයුත්තාඛොපන උපාදානයන් සමග විප්‍රයුක්ත වූ ද උපාදානීයාපි උපාදානයන්ට අරමුණුවූ ද (ධම්මාසඞ්ගනි)

උපාදාන විප්පයුත්තාඛොපන...පෙ...අනුපාදානීයාපි උපාදානයන්ට අරමුණු නොවූ ද (ධම්මාසඞ්ගනි)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභමූල සිත් වජ්ජිත ලෞකික තෙසත්තෑ චිත්තය (ලොභදිට්ඨිමාන වජ්ජිත) තත් සම්ප්‍රයුක්ත එකුන්පණස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති.

ලොභමූලික සිත් අට, දිට්ඨිගත විප්පයුක්ත සිත් සතරෙහි ලොභ දොස ඉස්සා මච්ඡරිය විචිකිච්ඡා වජ්ජිත දෙවිසි චෛතසිකය මේ දුකයෙන් බැහැරවූහ.

**පාලිගත දුක ෂට්කයාගේ අර්ථවර්ණනා නිමි.**

**ඛොපන යන සවන දුකයෙහි අධිකපදයාගේ අධිකාර්ථ වශයෙන්**

1 උපාදානාචෙවධම්මා උපාදාන විප්පයුත්තාච උපාදාන විප්පයුත්තා චෙවධම්මානොච උපාදානා

2 උපාදාන විප්පයුත්තා ධම්මා උපාදානීයාපි, අනුපාදානීයාපි

3 උපාදානාධම්මා උපාදාන සම්පයුත්තාපි, උපාදාන විප්පයුත්තාපි

4 නො උපාදානා ධම්මා උපාදාන සම්පයුත්තාපි උපාදාන විප්පයුත්තාපි කියා දුකයෝ සිව්දෙනෙක් ලැබිය යුත්තාහ.

**මූලවිකානය වශයෙන් ද**

1 උපාදානියාධම්මා උපාදානසම්පයුත්තාපි, උපාදාන විප්පයුත්තාපි

2 උපාදානියාධම්මා උපාදානාපි, නොඋපාදානාපි, කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තාහ. ඔවුන්ගේ සියලු අර්ථවර්ණනා දිය යටකී නයානුසාරයෙන් සුගමයි.

### අනුපිඨාන්තය වශයෙන් ද

1 උපාදාන සම්පයුත්තා ධම්මා උපාදානාපි, නොඋපාදානාපි

2 උපාදාන විප්පයුත්තා ධම්මා උපාදානාපි, නොඋපාදානාපි, කියා දුකයෝ දෙදෙනෙක් ලැබියයුතු බැව් දක්වේ. ඔවුන්ගේ අර්ථවර්ණනා ද සුගමයි

### උපාදානගොච්ඡක වර්ණනාව යි.

උපාදාන ගොච්ඡකයට අනතුරුව කිලෙස ගොච්ඡකය වදාළසේක. හෙද කිලෙසදුකාදීන්ගේ වශයෙන් අටවැදෑරුම්. කෙසේදයත්? කිලෙසාධම්මා නොකිලෙසාධම්මා යනාදී වශයෙනි.

1 කිලෙසා සංකිලෙසනාර්ථයෙන කෙලෙසන්නාවූ (හෙවත්) හිංසා කරන්නාවූ අර්ථයෙන් කෙලෙස නම්වූ (ධම්මාසන්ති) නොකිලෙසා කෙලෙස්නම් නොවන්නාවූ (ධම්මාසන්ති.)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොභ දෙස මොහ මානාදිට්ඨි විචිකිච්ඡා ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන චෛතසිකයෝ දසදෙන ලැබෙති.

දුතියපදයාගේ අභිධෙයාර්ථයෝනම් ක්ලේශධර්මවර්ජිත සියලු පරමාර්ථ ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

2 සංකිලෙසිකා කිලටුවන සවභාව ඇත්තාවූ නොහොත් කෙලෙසුන් ඉපදීමට සුදුසුවූ ධම්මාසන්ති නොසංකිලෙසිකා, නොකෙලෙසන්නාවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලෞකික පරමාර්ථ ධර්ම සියල්ල ලැබෙති

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්ස සුගමයි)

3 සංකිලිට්ඨා කෙලෙසන ලද්දවූ (ධම්මාසන්ති)

අසංකිලිට්ඨා නොකෙලෙසන ලද්දවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙලොස් අකුසලයන්හා සත්විසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අතිරික්තපරිමාර්ථ ධර්ම ලැබෙති. (සෙස්ස සුගමයි.)

4 කිලෙස සම්පයුත්තා කෙලෙසුන් සමග යෙදුනාවූ (ධම්මාසන්ති)

කිලෙස විප්පයුත්තා කෙලෙසුන් සමග නොයෙදුනාවූ (ධම්මාසන්ති) සෙස්ස තුන්වන දුකයට සමානයි.

5 කිලෙසාචෙව ක්ලේශ නාම් වූද සඞ්කිලෙසිකාච කෙලෙසුන්ගේ ඉපදීමට හිතවූද (ධම්මාසනාති)

සඞ්කිලෙසිකාචෙව කෙලෙසුන්ගේ ඉපදිමට හිතවූද නොචකිලෙසා කිලෙස නාම් නොවූද (ධම්මාසනාති)

ප්‍රථමපාදයාගේ අභිධෙයාර්ථයෝ නාම් යටකී ක්ලෙස ධර්මයෝ දසදෙනා ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නාම් ක්ලේසධර්ම වර්ජිත ලෞකික සියලු පරමාර්ථයෝ ලැබෙති. (සෙස්ස සුගමයි.)

6 කිලෙසාචෙව ක්ලේශ නාම් වූද සඞ්කිලිඨාච කෙලෙසන ලද්දුවූද (ධම්මාසනාති)

සඞ්කිලිඨාචෙව කෙලෙසනලද්දුවූද නොචකිලෙසා ක්ලේස නාම් නොවූද (ධම්මාසනාති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නාම් යටකී දස ක්ලේසයෝ ලැබෙති.

දුතියපදයාගේ අභිධෙයාර්ථයෝ නාම් දෙලොස් අකුසල්ය දස ක්ලේශ වර්ජිතකොට ඇත්තාවූ සතලොස් චෛතසිකයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

7 කිලෙසාචෙව කිලෙස නාම්වූද කිලෙස සමපයුතතාච ක්ලේස සම්පයුතතවූද (ධම්මාසනාති)

කිලෙස සමපයුතතාචෙව ක්ලේසධර්මයන් හා සම්ප්‍රයුක්තවූද නොචකිලෙසා කෙලසනාම් නොවූද (ධම්මාසන්ති) සෙස්ස සවෙනි දුකය හා සමානයි

8 කිලෙස විපපයුතතාබොපන ක්ලේසයන් හා විප්‍රයුක්තවූද සඞ්කිලෙසාපි ක්ලේසයන්ට හිතවූද (ධම්මාසන්ති)

කිලෙසවිප්පයුතතා බොපන—පෙ—අසඞ්කිලෙසිකාපි කෙලෙසුන්ට හිත නොවූද (ධම්මාසන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නාම් දෙලොස්අකුසල වර්ජිත ලෞකික සිත් එකුන්සැත්තෑව තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති.

දුතියපදයාගේ අභිධෙයාර්ථයෝ නාම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති (සෙස්ස සුගමයි)

මෙහි බොපතයන පදයාගේ අභිකාර්ථයෙන් අටුවානයින්

1 නොකිලෙසාධම්මා, සඞ්කිලෙසිකාපි, අසඞ්කිලෙසිකාපි

2 නොකිලෙසාධම්මා, සඞ්කිලිට්ඨාපි, අසඞ්කිලිට්ඨාපි

3 නොකිලෙස ධම්මා කිලෙස සම්පයුත්තාපි, කිලෙසවිප්පයුත්තාපි

4 සඞ්කිලෙසිකා ධම්මා අසඞ්කිලිට්ඨාපි, සඞ්කිලිට්ඨාපි කියා දුකයෝ සිව්දෙනෙක් ඇත්තාහ.

## මූලටීකානයින් ද

1 සඞ්කිලෙසිකාධම්මා, කිලෙස සම්පයුත්තාපි, කිලෙසවිප්පයුත්තාපි.

2 සඞ්කිලෙසිකාධම්මා කිලෙසාපි නොකිලෙසාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තාහ.

## අනුටීකානයින් ද

1 සඞ්කිලිට්ඨාධම්මා කිලෙසාපි නොකිලෙසාපි

2 කිලෙස සම්පයුත්තා ධම්මා කිලෙසාපි, නොකිලෙසාපි කියා දුකයෝ දෙදෙනෙක් ලැබිය යුත්තෝය.

මොවුන්ගේ සියලු අර්ථවර්ණනාවයම කීනයානුසාරයෙන්

සුප්‍රකමය කිලෙසගොච්ඡක අර්ථවර්ණනාව නිමි.

කිලෙසගොච්ඡකයට අනතුරුව පිට්ඨිදුකය වදාළසේක. හෙද දස්සනෙන පහාතබ්බ දුකාදීන්ගේ වශයෙන් අටළොස් වැදෑරුම්. එයින් දස්සනෙන පහාතබ්බදුකය පළමුකොට වදාළසේක. එකසේ වදාළසේක්දයත් දස්සනෙන පහාතබ්බා ධම්මා-නදස්සනෙන පහාතබ්බා ධම්මා යනුවෙති.

1 මෙහි ප්‍රථම පදයාගේ සියලු අර්ථ විභාග හා බෙදීම දස්සනත්‍රික ප්‍රථම පදය මෙනි. නදස්සනෙන පහාතබ්බා සෝවාන් මගින් ප්‍රහාණය නොකලයුතු (ධම්මාසන්ති) ඒ දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෝවාන්මගින් ප්‍රහාණය නොකටයුතුවූ අපායගාමිණී ශක්තිය හැර සෙසු අවස්ථාවන්ගෙන් යුත් දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර ද්වේෂමූල දෙසිත සෝවාන් මගින් ඒකාන්ත ප්‍රහාණය නොකටයුතු උද්ධච්චසහගත සිතය දෙළොස් අකුසල් වර්ජිත සත්සැත්තෑචිත්තය දිට්ඨිවිචිකිච්ඡාවර්ජිත සමපණස් චෛතසිකය අටවිසිරූපය හා නිර්වාණය ලැබෙති. (සෙස්සසුගමයි)

2 භාවනායපහාතබ්බා මතුමාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතුවූ (ධම්මාසන්ති) නභාවනායපහාතබ්බා මතුමාර්ගත්‍රයෙන් ප්‍රහාණ නොකටයුතුවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථමපදයාගේ සියලු අර්ථවිභාග දස්සනත්‍රික දුතිය පදය හා සමානයි. දුතියපදයාගේ අභිධෙයාර්ථයෝ නම් මතුමාර්ගත්‍රයෙන් ප්‍රහාණය නොකටයුතුවූ දිට්ඨිගත සම්පයුත්ත සිත්

සතරය විචිකිච්ඡාසහගත සිතය දෙලොස් අකුසලවජ්ජිත සත්-සැත්තෑවිත්තය යන පන්අසූ චිත්තයන්ද තත්සම්පයුත්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය හා නිර්වාණය ද ලැබෙති. (සෙස්ස සුගමයි)

3 දස්සනෙනපහාතබ්බහෙතුකා සෝවාන්මගින් ප්‍රහාණය කටයුතු හේතු ඇති (ධම්මාසන්ති)

නදස්සනෙනපහාතබ්බහෙතුකා සෝවාන් මගින් ප්‍රහාණය නොකටයුතු හෙතු ඇති (ධම්මාසන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙය්‍යාර්ථ හා බෙදීම දස්සනහෙතු-ත්‍රික ප්‍රථමපදය මෙනි.

දුතීයපදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සෝවාන්මගින් ප්‍රහා-ණය කටයුතු හෙතු ඇත්තාවූ ධර්මයන් හැර අපායගමණීය ශක්ති නැත්තාවූ දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත්සතරය ද්වේෂමූලික දෙසිතය සෝවාන් මගින් ඒකාන්තයෙන් ප්‍රහාණය නොකටයුතුවූ උද්ධච්ච සහගත සිතය එක්විසිකුසල්ය, සතිස්විපාකය විසික්‍රියාය දෘෂ්ටි විචිකිච්ඡාවර්ජිත සම්පණස් චෛතසිකය විචිකිච්ඡාසහගත චිත්තයෙහි යෙදුනාවූ මෝහය අටවිසිරූපය නිර්වාණය යන මොවුහු ලැබෙති. (සෙස්ස සුගමයි)

4 භාවනාය පහාතබ්බහෙතුකා මතුමාර්ගත්‍රයෙන් ප්‍රහාණය කටයුතු හෙතු ඇති ධම්මාසන්ති)

නභාවනාය පහාතබ්බහෙතුකා භාවනාසංඛ්‍යාත මතුමාර්ගත්‍ර-යෙන් ප්‍රහාණය නොකටයුතු හෙතු ඇති (ධම්මාසන්ති)

ප්‍රථමපදයාගේ සියලු අර්ථවිභාග දස්සනහෙතුත්‍රික දුතිය පදය හා සමානයි.

දුතියපදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් මතුමාර්ගත්‍රයෙන් ප්‍රහා-ණය කටයුතු හෙතු නැත්තාවූ ධර්මයන් කෙරෙන් අන්‍යවූ අපාය ගමනට ශක්ති නැත්තාවූ දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතරය. ද්වේෂ මූලික දෙසිතය මතුමාර්ගත්‍රයෙන් ප්‍රහාණය නොකටයුතුවූ දෘෂ්ටි-ගත සම්ප්‍රයුක්ත සිත් සතරය විචිකිච්ඡාසහගත චිත්තය එක්විසි කුසල්ය සතිස්විපාකය විසික්‍රියාය. දෙපණස් චෛතසිකය උද්ධච්ච සහගත චිත්තයෙහි යෙදුනාවූ මෝහය අටවිසිරූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

5 සවිතක්කා විතර්ක සහිතවූ (ධම්මාසන්ති)

අවිතක්කා විතර්ක රහිතවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නම් සවිතර්කසිත් පස්පණසය තත්සම්ප්‍රයුක්ත විතර්කවර්ජිත එක්පණස් චෛතසිකය ලැබෙති.

ද්‍විතියපදයාගේ අභිධෙයාර්ථයෝ නම් අවිතර්කසිත් සසැටය තත් සම්ප්‍රයුක්ත විතර්කවර්ජිත සත්තිස්චෛතසිකය අටවිසිරූපය නිර්වාණය යන ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

6 සවිචාරා විචාරසහිතවූ (ධම්මා සන්ති)

අවිචාරා විචාර රහිතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නම් සවිචාර සිත් සසැටය තත්සම්ප්‍රයුක්ත විචාරවර්ජිත එක්පණස් චෛතසිකයෝ ලැබෙති.

ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අවිචාරසිත් පස්පණ-සය තත් සම්ප්‍රයුක්ත විතර්කවිචාරවර්ජිත සත්තිස් චෛත සිකයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

7 සප්පීතිකා ප්‍රීතිසහිතවූ (ධම්මා සන්ති)

අප්පීතිකා ප්‍රීතිරහිතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථමපදයාගේ අභිධෙයාර්ථයෝ නම් සප්පීතික එක්-පණස් චිත්තය තත් සම්ප්‍රයුක්ත දේස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡාප්‍රීතිවර්ජිත සත්සාලිස් චෛත්‍ය සිකය ලැබෙති.

ද්‍විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ප්‍රීති රහිත සමසත්තෑ චිත්තය තත්සම්ප්‍රයුක්ත ප්‍රීතිවර්ජිත එක් පණස් චෛතසිකය අට විසි රූපය නිර්වාණය ලැබෙති.

(සෙස්ස සුගමයි)

8 පීතිසහගතා ප්‍රීතිය හා සමග එකොත්පාදදි භාවයෙන් මිශ්‍රවූ (ධම්මා සන්ති)

නපීති සහගතා—පෙ—මිශ්‍ර නොවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ සියලු විභාග පිතිත්‍රික ප්‍රථම පදය හා සමානයි.

ද්‍විතිය පදයාගේ සියලු විභාග අපපීතික පදයට සමානයි. (සෙස්ස සුගමයි)

9 සුඛ සහගතා සුඛ වෙදනාව හා එකොත්පාදදි භාවයෙන් මිශ්‍රවූ (ධම්මා සන්ති)

න සුඛ සහගතා—පෙ—මිශ්‍ර නොවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ විස්තර විභාග වෙදනාත්‍රික ප්‍රථම පදය හා සමානයි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෞම්නස් දෙසිතය උපෙක්‍ෂා පස්පනසය දුක්ඛ සහගත කාය විඥානය තත්සම්ප්‍රයුක්ත පීතිවජ්ජිත එක්පණස් චෛතසිකය සුඛවෙදනාවෝ තෙසැටය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

10 උපෙක්ඛා සහගතා උපෙක්ඛාවෙදනාව හා...පෙ...මිශ්‍ර වූ (ධම්මා සන්ති)

නඋපෙක්ඛාසහගතා උපෙක්‍ෂා – පෙ – මිශ්‍රනොවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ සහිත විභාග වෙදනාත්‍රික තෘතිය පදය හා සමානයි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සුඛසහගත තෙසැට චිත්තය දුක්ඛ සහගත චිත්තයෝ තිදෙන විචිකිච්ඡාවජ්ජිත එක් පණස් චෛතසිකය උපෙක්‍ෂාසිත් පස්පණසෙහි යෙදුනාවූ පස් පණස් උපෙක්‍ෂාවෙදනාවෝය. අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්සසුගමයි)

11 කාමාවචරා එකොලොස් කාමභූමින්හි බහුලවශයෙන් හැසිරෙන හෙයින් කාමාවචර නම්වූ (ධම්මා සන්ති)

නකාමාවචරා — පෙ — නොහැසිරෙන්නාවූ හෙයින් කාමාවචර නම්නොවූ (ධම්මා සන්ති) මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සූපණස් කාමාවචර චිත්තය තත්සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් පන්තිස් මහග්ගත ලොකොත්තර චිත්තය තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය නිර්වාණය ලැබෙති. (සෙස්සසුගමයි)

12 රූපාවචරා පසලොස් රූප භූමින්හි බහුල වශයෙන් හැසිරෙනහෙයින් රූපාවචර නම්වූ (ධම්මා සන්ති.)

නරූපාවචරා — පෙ — නොහැසිරෙන හෙයින් රූපාවචර නම් නොවූ (ධම්මා සන්ති) මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් රූපාවචර සිත් පසලොසය තත්සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් සෙසු පරමාර්ථ ධර්ම සියල්ල ලැබෙති. (සෙස්සසුගමයි)

13 අරූපාවචරා අරූපාවචරා නම්වූ (ධම්මා සන්ති)

නඅරූපාවචරා අරූපාවචර නම් නොවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අරූපාවචර සිත් දොළස තත්සම්ප්‍රයුක්ත සමතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සෙසු සත්සැත්තෑ චිත්තය තත්සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසිරූපය හා නිර්වාණය ලැබෙති. (සෙස්සසුගමයි)

14 පරියාපන්නා වෘත්තදුක්ඛයෙහි ඇතුලත්වූ (ධම්මාසන්ති)

අපරියාපන්නා (කර්මවිපාක ක්ලේශ) යන ත්‍රිවිධ දුක්ඛවෘත්තයෙහි ඇතුලත් නොවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලෞකික සිත් එක් අසූව තත් සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසි රූපය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොකොත්තර ධර්ම සියල්ල ලැබෙති. (සෙස්සසුගමයි)

15 නීය්‍යානිකා සංසාර වෘත්තයෙන් නික්මීමට කාරණාවූ හෙවත් සංසාර සාගරයෙන් එතර වීමට කාරණාවූ (ධම්මාසන්ති)

නනිය්‍යාණිකා නෛය්‍යාණිකනම් නොවූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝනම් සතරමාර්ග චිත්තය තත්සම්ප්‍රයුක්ත සතිස්චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝනම් සෙසු සියලු පරමාර්ථ ධර්ම ලැබෙති. සෙස්ස සුගමයි

16 නියතා චුතියට අනතුරුව නොහොත් තමාගේ පැවැත්මට අනතුරුව විපාකදීමට පොහොසත්වූ (ධම්මාසන්ති)

අනියතා චුතියට හෝ තමාගේ පැවැත්මට අනතුරුව ඒකාන්ත වශයෙන් විපාක දීමට අපොහොසත්වූ (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝනම් නියතමිත්‍යා දෘෂ්ටි වශයෙන් පැවැත්තාවූ දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්තවිථි සතරෙහි සත්තම ජවනයෝය. තත්සම්ප්‍රයුක්ත මාන දෙස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡාවර්ජිත එක්විසි චෛතසිකය, පඤ්චානන්තරිය කර්ම වශයෙන් පැවැත්තාවූ ද්වෙෂමූල දෙසිතෙහි සත්වෙනි ජවන් හුය, තත්සම්ප්‍රයුක්ත ප්‍රීති ලොභදිට්ඨිමාන විචිකිච්ඡාවර්ජිත දෙවිසි චෛතසිකය, සතරමාර්ගචිත්තය තත්සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් නියත මිත්‍යා දෘෂ්ටි වශයෙන් පැවැත්තාවූද ආනන්තරිය කර්මවශයෙන් පවත්නාවූද යටකී ජවන විථින්හි සත්වන ජවනයන් හා සතරමාර්ගසිත්වර්ජිත පස්අසූචිත්තය තත්සම්ප්‍රයුක්ත දෙපණස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

17 සඋත්තරා තමාට වඩා උත්තරීතර ධර්මයන් ඇත්තාවූ (ධම්මා සන්ති)

අනුත්තරා තමහට වඩා උත්තරීතර කෙනෙක් නොමැත්තාවූ (ධම්මා සන්ති) මෙහි සියලු විස්තර විභාග ලොකියදුකයට සමානයි.

18 සරණා ඇඬීම් සහිතවූ (ධම්මා සන්ති)

අරණා ඇඬීම් රහිතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෙළොස් අකුසල සිත් හා තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකයෝ ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දෙළොස් අකුසල වර්ජිත සත් සැත්තෑ චිත්තය තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය අටවිසි රූපය නිර්වාණය යන මෙතෙක් ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි.)

පිට්ඨිදුකය නිමි.

දුක මාතෘකා විස්තර සත්තයද මෙතෙකින් නිමියේය.

මේ අභිධර්ම මාතෘකාවෙහි 1 වෙදනා ත්‍රිකය 2 විතර්ක ත්‍රිකය 3 ප්‍රීති ත්‍රිකය 4 පරිත්තාරම්මණ ත්‍රිකය 5 මග්ගාරම්මණ ත්‍රිකය 6 උප්පන්නත්‍රිකය 7 අතීත ත්‍රිකය 8 අතීතාරම්මණ ත්‍රිකය 9 අජ්ඣත්තාරම්මණ ත්‍රිකය යන මේ ත්‍රිකයෝ නවදෙන සප්පදෙස ත්‍රික නම්.

සෙසු තෙළෙස් ත්‍රිකයෝ නිප්පදෙස ත්‍රිකනම් වෙති.

දුක මාතෘකාවෙහි 1 හේතු ගොච්ඡකය 2 ආසව ගොච්ඡකය 3 සඤ්ඤොජන ගොච්ඡකය 4 ග්‍රන්ථ ගොච්ඡකය 5 ඕඝ ගොච්ඡකය 6 යොග ගොච්ඡකය 7 නීවරණ ගොච්ඡකය 8 පරාමාස ගොච්ඡකය 9 උපාදාන ගොච්ඡකය යන මේ ගොච්ඡකයන් නවදෙනාගේ අවසාන තුන් තුන් දුකයෝද ක්ලේශ ගොච්ඡකයෙහි අවසානදුකයෝ සිව්දෙනද චිත්තසම්පයුත්ත දුකය චිත්තසංසට්ඨ දුකය යන මේ තෙතිස් දුකයෝ සප්පදෙසදුකනාම් වෙත්. සෙසු දුකයෝ සත් සැටදෙනා නිප්පදෙස දුක නම් වෙත්.

අභිධර්ම මාතෘකා අර්ථව්‍යාඛ්‍යානය මෙතෙකින් සමාප්තයි.

---

සූත්‍රාන්ත මාතෘකාව වනාහි ආභිධම්මික භික්ෂූන්ට සූත්‍රාන්තයට බැස නොවෙහෙසනු පිණිස ධර්ම සෙනෙවි ශාරිපුත්‍ර මහාස්ථවිර පාදයාණන් වහන්සේ විසින් අඞ්ගුත්තරනිකායෙහි එකක නිපාත දුකනිපාතබාලවග්ග හා දීඝනිකායෙහි සඞ්ගීති සූත්‍රය දසුත්තර සූත්‍රයන් ගෙන්ද සංග්‍රහ කොට තබන ලද්දකි ඒ සූත්‍රාන්ත මාතෘකාව වනාහි එකම නික්ඛෙප කාණ්ඩයෙහි කෙළවර දක්වා විභාග කරණ ලදී.

අවශෙෂවූ චිත්තුප්පාද කාණ්ඩ රූපකාණ්ඩ අට්ඨකථාකාණ්ඩ යන කාණ්ඩත්‍රය හා සමග අභිධර්ම ෂට්ප්‍රකරණයෙහි නො බෙදන ලද්දේය.

කුසලාධම්මා යන පදය ආදිකොට අරණාධම්මා යන පදය අවසන් කොට ඇති අභිධර්ම මාතෘකා තොමෝ එකම නික්ඛෙප කාණ්ඩය හැර සියලු අභිධර්ම පිටකයෙහි විභාග කොට වදරණ ලදී

ධර්මසේනාපති ශාරිපුත්‍ර මහා ස්ථවිර පාදයාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ඥාණශක්තියෙන් ඒ සූත්‍රාන්ත මාතෘකාව බුද්ධභාසිතවූ නිකායවශයෙන්ම සංග්‍රහකොට තබනලද හෙයින් තථාගත දේශනාව මැයි.

ඒ මේ සූත්‍රාන්ත මාතෘකාවද විජ්ජාභාගි දුකය ආදිකොට දෙසාළිස් දුකයකින් සමන්විත වෙයි. හේ කෙසේදයත්?

1 විජ්ජාභාගිනො සම්ප්‍රයුක්තවශයෙන් අෂ්ටවිද්‍යාවන් භජනය කරන්නාවූ (ධම්මා සන්ති)

අවිජ්ජාභාගිනො සම්ප්‍රයුක්ත වශයෙන් චතුස්සත්‍යධර්මයන් මුවහ කිරීම ලක්ෂණ මොහය භජනයකරන්නාවූ නොහොත් ඒ චතුර්විධ මෝහයන්ගේ සමුදයෙහි හටගන්නාවූ (ධම්මා සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් (විදර්ශනා ඥාණ මනොමය ඉර්ධිඥාණය ඉර්ධිවිධ ඥාණය පරචිත්ත විජානන ඥාණය පූර්වෙනිවාසානුස්මෘති ඥාණය දිව්‍යචක්ෂුරභි ඥාණය දිව්‍යශ්‍රොත ඥාණය ආශ්‍රවක්ෂයකර ඥාණය කියන ලද්දවූ අෂ්ටවිද්‍යාවන් හා සම්ප්‍රයුක්තවූ ඥාණසම්ප්‍රයුක්ත මහා කුසල් සතරය ඥාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සතරය අභිඥදෙසිතය අර්හත්මාර්ගී චිත්තය තත්සම්ප්‍රයුක්ත අමොහ වර්ජිත සත්තිස් චෛතසිකය යන මොවුහුලැබෙති (මෙහි සකන්ධාදිය බෙදීම යටකී නයානුසාරයෙන් දතයුතු)

ද්විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල් සිත් හා තත්සම්ප්‍රයුක්ත මෝහවර්ජිත සවිසි චෛතසිකයෝ ලැබෙති. (බෙදීමසුගමයි.)

(දුකමුක්ත ධර්ම කියනලද නයානුසාරයෙන් සුප්‍රකටයි)

**විජ්ජාභාගි දුකයයි.**

2 විජ්ජූපමා විදුලියකට බඳු වූ උපමා ඇත්තාවූ (ධම්මා සන්ති)
වජිරූපමා හෙන පහරකට බඳු උපමා ඇත්තාවූ (ධම්මා සන්ති.)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සෝවාන් සකෘදාගාමි අනාගාමි යන මාර්ගත්‍රයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකයෝ තුන්දෙනායි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අභීත් මාගීසිතෙහි යෙදුනාවූ ප්‍රඥාචෛතසිකය ලැබේ. (ස්කන්ධාදිය බෙදීම සුගමයි)

### විජ්ජුපමා දුකයයි.

3 බාලා අඥාණවූ නොහොත් අඥානයන් කෙරෙහි පිහිටියාවූ (ධම්මා සන්ති) පණ්ඩිතා පණ්ඩිත වූ නොහොත් පණ්ඩිතයන් කෙරෙහි පිහිටියාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙළොස් අකුසල් හා තත්සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එක්විසි කුසල්ය තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ලැබෙති. (සෙස්සසුගමයි)

### බාල දුකයයි.

4 කණ්හා කාලවණීවූ නොහොත් සතරඅපාදුක් එලවන්නාවූ (ධම්මා සන්ති.)

සුක්කා සෙවත වණීවූ නොහොත් සුගති සැප එලවන්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දෙළොස් අකුසල්ය තත් සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එක්විසි කුසල් හා තත් සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකයෝ ලැබෙති. (සෙස්සසුගමයි)

### කණ්හ දුකයයි.

5 තපනීයා මෙලෝ පරලෝ දෙක්හි නොහොත් ප්‍රත්‍යුත්පන්න භවයෙහි හා අනාගත භවයන්හි තැවීමට කාරණාවූ (ධම්මා සන්ති)

අතපනීයා වර්තමාන භවයෙහි හා අනාගත භවයන්හි නොතැවීමට කාරණවූ (ධම්මා සන්ති)

මේ දුකයෙහි සියලු අර්ථ විභාග තුන්වන සතරවන දුකයන්ට සමානයි

### තපනීය දුකයයි.

6 අධිවචනා ශබ්දමාත්‍රය අදිපති කොට පවත්නාවූ, ශබ්ද ප්‍රඥප්තියයි කියන ලද නොහොත් අර්ථයෙහි නමන අර්ථයෙන් නාම නම් වූද අර්ථයෙහි නැමෙන ලද හෙයින් නාම කර්ම නම් වූද අර්ථයෙහි නැමෙන ලදුව පිහිටියාවූ අර්ථ සංඛ්‍යාත නාම ධෙය්‍යය නම් වූද අර්ථය නිකුත්කොට කියන ලද හෙයින් නාම නිරුක්ති නම්වූ ද අර්ථ ප්‍රකාශකරන වාක්‍ය සංඛ්‍යාත නාම ව්‍යඤ්ජන නාම් වූ ද අර්ථයට අභිමුඛව නැමෙන හෙයින් නාමාභිලාප නම් වූද (ධම්මා සන්ති)

අධි වචන පථා ශබ්ද මාත්‍රයක් අධිපතිකොට ගන්නාවූ ශබ්ද ප්‍රඥප්තියට කාරණාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අසන්නාවුන් ගේ අර්ථාවබෝධයට කාරණ වූ ශබ්ද ප්‍රඥප්තිය ලැබේ. ඒ ශබ්ද තොමෝ විඤ්ඤත්ති සහිත වචී ශබ්දයයි.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් කියන්නාන්ගේ අවබෝධයට කාරණ වූ අර්ථ ප්‍රඥප්තිය ලැබෙ. ඒ මේ අර්ථ ප්‍රඥප්තිය වනාහි ශෙත්‍රාර්ථයෙන් ඉවත්ව නොපවත්නා හෙයින් එකුන් අනූවිත්තය දෙපණස් චෛතසිකය අටවිසිරූපය නිර්වාණය ය යන මේ ධර්මයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

## අධිවචන දුකයයි

7 නිරුත්ති අර්ථය නිකුත් කොට කියන ලද ශබ්ද ප්‍රඥප්ති සඞ්ඛ්‍යාතවූ නාම, නාම කර්ම, නාම ධෙය්‍ය, නාම නිරුත්ති, නාම ව්‍යංජන, නාමාභිලාප ය යි කියන ලද (ධම්මා සන්ති)

නිරුත්තිපථා යථොක්ත නිරුක්තියට කාරණාවූ අර්ථ ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

මේ දුකයෙහි සියලු අර්ථ විභාග සවන අධිවචන දුකයට සමානයි.

## නිරුතති දුකයයි

8 පඤ්ඤත්ති ප්‍රභෙද වශයෙන් දතයුතු ශබ්ද ප්‍රඥප්ති ය යි කියන්නාවූ නාම, නාම කර්ම, නාමධෙය්‍ය, නාමනිරුත්ති, නාම ව්‍යංජන, නාමභිලාප සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති) පඤ්ඤත්තිපථා ප්‍රඥප්තියට කාරණාවූ (ධම්මා සන්ති)

මෙහි සියලු අර්ථ විභාග සවන අධි වචන දුකයට සමානයි.

## පඤ්ඤත්ති දුකයයි

9 නාමඤ්ච අරමුනෙහි නැමෙන අර්ථයෙන් නාම නම් වූ (ධම්මා සන්ති)

රූපඤ්ච ශීතොෂ්ණාදී විරොධ ප්‍රත්‍යයෙන් විකාරවීම් සවභාව කොට ඇත්තාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය නිර්වාණය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අටවිසි රූපය ලැබෙති. (සෙස්ස සුගමයි.)

## නාමරූප දුකයයි.

10 අවිජ්ජාච චතුස්සත්‍ය මුවහකරන්නාවූ මොහ සඞ්ඛ්‍යාත අවිද්‍යා නම් වූ (ධම්මා සන්ති)

භව තණ්හාච භවය ඇලුම් කරන්නාවූ ලොභ නම් වූ (ධම්මා සන්ති) (සෙස්ස සුගමයි)

## අවිජ්ජා දුකයයි.

11 භවදිට්ඨිච නිත්‍ය සදාකාලික වශයෙන් ගන්නාවූ මිත්‍යා දෘෂ්ටි නම් වූ (ධම්මා සන්ති)

විභවදිඨිව ආත්මය හා ලෝකය සිඳෙන්නේය, විනාශ වන්නේය යන දෘෂ්ටි සඞ්ඛ්‍යාත වූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකම භව දෘෂ්ටිය ලැබේ.

ද්විතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකම විභව දෘෂ්ටිය ලැබේ. (දෙපදයෙන්ම ලබනුයේ දිඨිචෛතසිකයයි) (සෙස්ස සුගමයි)

භව දිඨි දුකයයි

12 සස්සතදිට්ඨිව තමශරීරය හා ලෝකය නිත්‍යය සදාකාලික යයි ගන්නාවූ දෘෂ්ටියෙක් ද (සන්ති) උච්ඡේදදිට්ඨිව ශරීරය හා ලෝකය විනාශ වීමෙන් නැවත භව නොගන්නේය යන උච්ඡේද දෘෂ්ටියක් ද (සන්ති) සෙස්ස එකොළොස් වන දුකයට සමානයි.

සස්සතදිට්ඨි දුකයයි

13 අන්තවාදිට්ඨිව තමාගේ ශරීරය ද ලෝකය ද කෙලවරක් ඇත්තේය යන මිත්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත වූ (ධම්මා සන්ති) අනන්තවාදිඨිව තමාගේ ශරීරය ද ලෝකය ද කෙලවරක් නැත්තේය යන මිත්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි දෙපදයෙන්ම එනම්වූ දෘෂ්ටි චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

අන්තවාදිට්ඨි දුකයයි

14 පුබ්බන්තානුදිට්ඨිව සංසාරයෙහි පූර්ව කෙලවර අරමුණු කොට පවත්නාවූ දෘෂ්ටි සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

අපරන්තානු දිට්ඨිව සංසාරයාගේ පස්චිම කෙලවර අරමුණු කොට පවත්නාවූ දෘෂ්ටි සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

මෙහි දෙපදය ම එනම්වූ දෘෂ්ටිහු ලැබෙති. (සෙස්ස සුගමයි)

පුබ්බන්තානුදිට්ඨි දුකයයි

15 අහිරිකඤ්ච පාපයෙහි ලජ්ජා නොවීම් ලක්ෂණ අහිරික නම් වූ (ධම්මා සන්ති)

අනොත්තප්පඤ්ච පාපයෙහි බිය නොවීම් ලක්ෂණ අනොත්තප්ප නම් වූ (ධම්මා සන්ති)

මේ දෙපදයෙන් එනම් චෛතසික යුග්මය ලැබෙති.

අහිරික දුකයයි

16 හිරිච පාපයෙහි ලජ්ජාවීම් ලක්ෂණ හිරි නම වූ (ධම්මා සන්ති)

ඔත්තප්පඤ්ච පාපයෙහි බියවීම් ලක්ෂණ ඔත්තප්ප නම් වූ (ධම්මා සන්ති) (සෙස්ස සුගමයි)

## හිරි දුකයයි

17 දොවචස්සතාච අවවාද පිළිනොගන්නා වූ අකීකරු පුද්ගලයාගේ ස්වභාව ලක්ෂණ දුර්වච භාවයෙක්ද (සන්ති)

පාපමිත්තතාච පවිටු මිතුරන් ඇත්තහුගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක්ද (සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් උසස් ගුණවත් අයවලුන් විසින් අවවාද දෙන කල්හි නොහොත් බුද්ධ ප්‍රඥප්තියෙන් අවවාද දෙන කල්හි මුරණ්ඩු වචන ප්‍රකාශ කරමින් දුර්වච ගතිය පාන්නාවූ ද්වේෂ මූල දෙසිතය තත් සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය යන මොව්හු ලැබෙති.

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් පවිටු මිතුරන් ඇසුරු කිරීමේ වරද නොදැනීම හා ඇලුම් කිරීම ඇති කරණ ලෝභ මූලික සිත් අටය, මෝහ මූලික දෙසිතය තත්සම්ප්‍රයුක්ත දෙවිසි චෛතසිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

## දොවචස්සතා දුකයයි

18 සොවචස්සතාච සුවච පුද්ගලයාගේ යහපත් වචන ඇති බව යයි කියන ලද ස්වභාව ධර්මයක් ද (සන්ති)

කල්‍යාණ මිත්තතාච යහපත් මිතුරන් ඇත්තහුගේ ස්වභාව ධර්මයක් ද (සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් වැඩිහිටියන් විසින් අවවාද දෙන කල්හි ද බුද්ධප්‍රඥප්තියෙන් අනුශාසනා කරණ කල්හි ද ගෞරවයෙන් අසමින් පිළිගන්නාවූ පුද්ගලයා හට උපදනා මහා කුසල මහා ක්‍රියා සිත් සොළසය තත් සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකය ලැබෙති.

ද්විතීය පදයාගේ සියලු අර්ථ විභාග ප්‍රථම පදයට සමානයි. (සෙස්ස සුගමයි)

## සොවචස්සතා දුකයයි

19 ආපත්ති කුසලතාච ඇවත් දැනගැන්මෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ධර්මයක් ද (සන්ති) ඇත්තාහ. වුට්ඨාන කුසලතාච පැමිණි ඇවතින් නැගිසිටීමෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ධර්මයෙක් ද (සන්ති) ඇත්තාහ.

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සත්ත ආපත්ති ස්කන්ධයන් දැනගැන්මෙහි පොහොසත්වූ පුද්ගලයාගේ ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා සිත් අටෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය ලැබේ.

ද්විතීය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් පැමිණි ඇවතින් නැගී සිටීමෙහි පොහොසත් පුද්ගලයාගේ යථොක්ත ප්‍රඥා චෛතසිකයෝ අටදෙන ලැබෙති.

## ආපත්තිකුසලතා දුකයයි

20 සමාපත්ති කුසලතාව රූපාරූප ධ්‍යාන සඞ්ඛ්‍යාත අෂ්ට සමාපත්තීන්හි නොහොත් නවානුපූර්ව විහාර සමාපත්තීන්හි දක්ෂ බැව් සඞ්ඛ්‍යාත ස්වභාව ධර්මයෙක්ද (සන්ති)

සමාපත්ති වුට්ඨානකුසලතාව යටකී සමවතින් නැගීසිටීමෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ධර්මයෙක් ද (සන්ති)

මෙහි සියලු විස්තර විභාග ආපත්තිකුසලතා දුකයට සමානයි.

## සමාපත්ති කුසලතා දුකයයි

21 ධාතු කුසලතාව අවලොස් ධාතූන් දැනීමෙහි පොහොසත් වූ පුද්ගලයාගේ ස්වභාව ධර්මයක් ද (සන්ති) මනසිකාර කුසලතාව අවලොස් ධාතූන් මෙනෙහි කිරීමෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව ධර්මයෙක් ද (සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අවලොස් ධාතූන් දැනගන්නාවූ මහා කුසල මහා ක්‍රියා ඥාණ සම්ප්‍රයුක්ත සිත් අටය අභිඥා දෙසිතය සතර මාර්ග සිත්ය යන තුදුස් චිත්තයන්හි උපදනා ප්‍රඥා චෛතසිකය ලැබේ.

ද්‍විතීය පදයාගේ අභිධෙයාර්ථයෝ ද ප්‍රථම පදයම සමාන වෙති. (සෙස්ස සුගමයි)

## ධාතු කුසලතා දුකයයි

22 ආයතන කුසලතාව දොළොස් ආයතනයන් දැනීමෙහි පොහොසත් පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක් ද (සන්ති)

පටිච්ච සමුප්පාද කුසලතාව ද්වාදසාඞ්ගයකින් යුත් පටිච්ච සමුප්පාද ධර්මයන් දැන ගැන්මෙහි පොහොසත්වූ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක්ද (සන්ති)

මේ දුකයෙහි සියලු අර්ථවිභාග ධාතුකුසලතා දුකයට සමානයි.

## ආයතන කුසලතා දුකයයි

23 ඨාන කුසලතාව ස්ථාන සඞ්ඛ්‍යාත හෙතු ධර්මයෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක්ද (සන්ති)

අඨාන කුසලතාව අස්ථානයන් දැනගැන්මෙහි දක්ෂ පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක්ද (සන්ති)

ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් නියම හේතුව දැන ගැනීමෙහි පොහොසත්වූ මහාකුසල මහා ක්‍රියා ඥාණ සම්ප්‍රයුක්ත සිත් අටෙහි හා අභිඥා දෙසිතෙහි උපදනා ප්‍රඥා චෛතසිකයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් අඹ බීජය තල් ගසේ හේතුව නොවේ. චක්ඛුප්‍රසාදය ශ්‍රොත විඥ්ඥානයාගේ හේතුව නොවේ. යනාදීන් අස්ථානය දැනගැන්මෙහි පොහොසත් වූ යථොක්ත ප්‍රඥා චෛතසිකයෝ දසදෙන ලැබෙති. (සෙස්ස සුගමයි)

### ඨාන කුසලතා දුකයයි

24 අජ්ජවො ච ඍජු සිත් ඇති පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක් ද (සනාති)

මජ්ජවො ච මධ්‍යස්ථ පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක් ද (සනාති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් කායුජ්ජුකතා දචිත්තුජ්ජුකතා සඞ්ඛ්‍යාත ධර්මයෝ දෙදෙන ලැබෙත්.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් කාය මුදුතා චිත්ත මුදුතා චෛතසික යුග්මය ලැබේ. (සෙස්ස සුගමයි.)

### අජ්ජව දුකයයි

25 ඛන්තී ච ඉවසීම් සඞ්ඛ්‍යාත වූ ස්වභාව ධර්මයෙක් ද (සනාති)

සොරච්චඤ්ච යහපත් ධර්මයෙහි ඇලෙන්නාවූ පුද්ගලයාගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක් ද (සනාති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ඉවසීම් සඞ්ඛ්‍යාත අද්වේෂය ප්‍රධාන මහා කුසල මහා ක්‍රියා සිත් සොළසය හා සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සීලචෙතනා ප්‍රධාන මහා කුසල මහා ක්‍රියා සිත් සොළසය හා සම්ප්‍රයුක්ත අප්‍රමාණ්‍ය වර්ජිත සතිස් චෛතසිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

### ඛන්ති දුකයයි

26 සාඛල්‍යඤ්ච මෘදු වූ සම්පූර්ණ වචන ඇත්තාහුගේ ස්වභාව සඞ්ඛ්‍යාත ධර්මයෙක් ද (සනාති)

පටිසන්ථාරො ච ආමිස සන්ථාර ධර්මපටි සන්ථාර වශයෙන් පිළිසඳර කිරීම් සංඛ්‍යාතවූ ස්වභාව ධර්මයෙක් ද (සනාති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් මෘදු මොලොක් වචන කියන්නාවූ කල්හි උපදනා මහා කුසල මහා ක්‍රියා සිත් සොළසය හා සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් කුදු මහත් වත් පිළිවෙත් කරණ කල්හි උපදනා යථොක්ත ධර්මයෝ මැයි. (සෙස්ස සුගමයි)

### සාඛල්‍ය දුකයයි

27 ඉන්ද්‍රියෙසු චක්ඛුරාදී ෂඩෙන්ද්‍රියයන් කෙරෙහි, අගුත්ත ද්වාරතාව නොරක්නා ලද ද්වාර ඇත්තාහුගේ ස්වභාව සංඛ්‍යාත ධර්මයෙක් ද (සන්ති)

භොජනෙ භොජනයෙහි නොහොත් සිව්පසයෙහි අමත්තඤ්ඤුතාව පමණ නොදන්නාවූ පුද්ගලයාගේ ස්වභාව සංඛ්‍යාත ධර්මයෙක් ද (සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොභ මූල ද්වෙෂ මූල සිත් දසය හා තත් සම්ප්‍රයුක්ත විචිකිච්ඡා වර්ජිත සවිසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ලොභ මූල මෝහ මූල සිත් දසය හා තත් සම්ප්‍රයුක්ත දෙවතුසකවර්ජිත තෙවිසි චෛත-සිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා දුකයයි

28 ඉන්ද්‍රියෙසු චක්ඛුරාදි ෂඩෙන්ද්‍රියයන්හි ගුත්ත ද්වාරතාව ආරක්‍ෂා කරන ලද ද්වාර ඇත්තහුගේ නොහොත් සදෙරින් අකුසලයන්ට වැද්දනොදී ආරක්‍ෂා කරන්නහුගේ ස්වභාව සංඛ්‍යාත ධර්මයෙක් ද (සන්ති)

භොජනෙ භොජනයෙහි නොහොත් සිව්පසයෙහි මත්තඤ්ඤුතාව පමණ දන්නහුගේ ස්වභාව සංඛ්‍යාත ධර්මයෙක් ද (සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් මහා කුසල මහා ක්‍රියා සිත් සොළසය ලොකොත්තර සිත් අටය තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් පස්විසා සිව්පසය අනුභවකරන්නහුට උපදනා මහා ක්‍රියා මහා කුසල සිත් සොළසය තත්සම්ප්‍රයුක්ත විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකය ලැබෙති. (සෙස්ස සුගමයි)

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා දුකයයි

29 මුට්ඨස්සච්චඤ්ච මුලාවූ සිහි ඇති බැව් සංඛ්‍යාත (ධම්මා සන්ති)

අසම්පජඤ්ඤඤ්ච මනාකොට සාත්ථක සප්‍රාය අසම්මොහ ගොචර සංඛ්‍යාත සතර සම්පජඤ්ඤ නුවණින් වෙන් වූ ස්වාභාව සංඛ්‍යාත (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් දොළොස් අකුසල්ය සත්විසි චෛතසිකය යන මොව්හුයි.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ප්‍රඥාවට ප්‍රතිපක්‍ෂ වූයට හී ධර්මයෝ මැ යි (සෙස්ස සුගමයි)

මුට්ඨස්සච්ච දුකයයි

30 සතිච චිරකෘතාදිය සිහිකිරීමෙහි පොහොසත් වූ (ධම්මා සන්ති)

සම්පජඤ්ඤඤ්ච මනාකොට සතර සම්ප්‍රජඤ්ඤ නුවණින් යුක්තවූ සවභාව සඞ්ඛ්‍යාත සවභාව ධර්මයෙක් ද (සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ස්මෘති චෛතසිකය ලැබේ

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් ප්‍රඥා චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

### සති දුකයයි

31 පටි සඞ්ඛාන බලඤ්ච ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි නොසැලෙන්නාවූ ප්‍රඥා සඞ්ඛ්‍යාත වූ (ධම්මා සන්ති)

භාවනාබලඤ්ච වීර්‍ය්‍ය පෙරටුකිරීමෙන් සප්තබොධ්‍යඞ්ග ධර්මයන් වඩන්නාවූ පුද්ගලයාගේ වශයෙන් නොසැලෙන්නාවූබල සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් එකම ප්‍රඥා චෛතසිකය ලැබේ

දුතිය පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් එක්විසි කුසල් හා තත්සම්ප්‍රයුක්ත අවතිස් චෛතසිකයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

### පටිසඞ්ඛාන දුකයයි

32 සමථොච ප්‍රතිපක්ෂවූ අකුසල ධර්මයන් සංසිඳවීමෙහි පොහොසත් සමාධි සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

විපස්සනාච ත්‍රෛභූමික සංස්කාර ධර්මයන් අනිත්‍යාදි වශයෙන් විවිධාකාරයෙන් බලන්නාවූ ප්‍රඥාසංඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් සමාධිධර්මය ලැබේ. (එකාග්‍රතාවයි)

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝනම් ප්‍රඥා චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

### සමථ දුකයයි

33 සමථනිමිත්තඤ්ච සමථයට කාරණාවූ නොහොත් සමථයට පූර්ව හෝ පසුව හටගන්නාවූ (ධම්මා සන්ති)

පග්ගහ නිමිත්තඤ්ච උත්සාහයට පූර්ව හෝ පසු වූ හෝ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් පශ්චිම පශ්චිම ධ්‍යානයන්ට කාරණාවූ පූර්ව පූර්ව සමාධිය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් පශ්චිම පශ්චිම විශ්‍යීයට කාරණාවූ පූර්‍ව පූර්‍ව සම්‍යක් ව්‍යායාමයෝ ලැබෙති. (සෙස්ස සුගමයි)

සමථ නිමිත්ත දුකයයි

34 පග්ග හෝච සම්ප්‍රයුත්ත ධර්මයන්ට රුකුල් දෙන්නාවූ වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

අවික්ඛෙපොච සම්ප්‍රයුත්ත ධර්මයන් නානා අරමුණෙහි විසිරයානොදී ධරාසිටින්නාවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයෙන් සම්‍යක් ව්‍යායාමය හා දුතිය පදයෙන් සම්‍යක් සමාධිය ලැබේ. (සෙස්ස සුගමයි)

පග්ගහ දුකයයි

35 සීලවිපත්තිච සීලයාගේ බිඳීම් සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

දිට්ඨිවිපත්තිච දෘෂ්ටියගේ වැරදීම් සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් දොළොස් අකුසල සිත් හා තත්සම්ප්‍රයුක්ත සත්විසි චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් එකම මිත්‍යාදෘෂ්ටිය ලැබේ. (සෙස්ස සුගමයි)

සීලවිපත්ති දුකයයි

36 සීල සම්පදාච සීල සම්පත්තියගේ පරිපූර්ණභාව සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

දිට්ඨිසම්පදාච සම්‍යක්දෘෂ්ටි සම්පත්තියගේ පරිපූර්ණභාව සඞ්ඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝ නම් මහා කුසල මහ ක්‍රියා සිත් සොළසය තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් සම්‍යක්දෘෂ්ටි සඞ්ඛ්‍යාත එකම ප්‍රඥා චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

සීලසම්පදා දුකයයි

37 සීලවිසුද්ධිච විශෙෂයෙන් පිරිසිදු සිල් ඇතිවූ නොහොත් පරිපූර්ණවූ සිල් ඇති සවභාව සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

දිට්ඨිවිසුද්ධිච සම්‍යක් දෘෂ්ටියගේ පරිපූර්ණත්වයෙන් පිරිසිදු සිත් ඇති සවභාව සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයෙන් ලොකොත්තර සිත් අට හා තත්සම්ප්‍රයුක්ත සතිස් චෛතසිකයද දුතිය පදයෙන් කම්මස්ස කතා ඥාණය හා සච්චානු ලොමික ඥාණ සඞ්ඛ්‍යාත මස්තක ප්‍රාප්ත විදර්ශනා ඥාණය, හා මාර්ග ඵල ඥාණයෝද ලැබෙත්. (සෙස්ස සුගමයි)

සීලවිසුද්ධි දුකයයි

38 දිට්ඨිවිසුද්ධි ඛො පන සම්‍යක් දෘෂ්ටිහුගේ විශේෂ වශයෙන් පිරිසිදු බැව් සඞ්ඛ්‍යාත (ධම්මා සන්ති)

යථාදිට්ඨිස්ස පධානං විශේෂවශයෙන් පවිත්‍රවූ ප්‍රඥාවට සුදුසු වීර්‍ය්‍ය සංඛ්‍යාත (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ කම්මස්සකථා ඥාණය, සච්චානුලෝමික ඥාණ සඞ්ඛ්‍යාත මස්තක ප්‍රාප්ත විදර්ශනා ඥාණය, මාර්ග ඥාණ හා ඵල ඥාණයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් ප්‍රථම පදයෙහි අනන්තර්ගත චතුර්විධ ඥාණයන් හා ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල මහා ක්‍රියා ලෝකෝත්තර යන සොළොස් චිත්තයන්හි යෙදුනාවූ වීර්‍ය්‍ය චෛතසිකයන් ද ලැබෙති (සෙස්ස සුගමයි)

දිට්ඨිවිසුද්ධි දුකයයි

39 සංවෙජනියෙසුට්ඨානෙසු සංවෙග වියයුතු ජාතිජරා ආදී හෙතුවක් ඇති කල්හි සංවෙගො ච සංවෙගවීම් සංඛ්‍යාත වූ (ධම්මාසන්ති)

සංවිග්ගස්සච සංවෙගයට පැමිණියාවූ තැනැත්තාහුගේ යොනිසො පධානං නුවණින් උත්සාහ කිරීම් සංඛ්‍යාත (ධම්මාසන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් සංවේගනීය වස්තුවක් ඇති කල්හි උපදනා ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසලයන්හි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය ලැබේ.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එක්විසි කුසල්ය ඵල සිත්සතරය යන පස්විසි චිත්තයන්හි යෙදුනාවූ වීර්‍ය්‍ය චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

සංවෙජනීයට්ඨාන දුකයයි

40 කුසලෙසු ධම්මෙසු කුසල ධර්මයන් කෙරෙහි අසන්තුට්ඨිතාව තෘප්තියට නොපැමිණීම් සංඛ්‍යාතවූ (ධම්මා සන්ති)

පධානස්මිං කුසල ධර්මයන් වැඩීම පිණිස කරන්නාවූ උත්සාහයෙහි අප්පටිවාණිතාව පසුනොබස්නා සවභාව සංඛ්‍යාත (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එක්විසි කුසල් හා තත්සම්ප්‍රයුක්ත අටතිස් චෛතසිකය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම් එක්විසි කුසලයන්හි යෙදුනාවූ වීර්‍ය්‍ය චෛතසිකය ලැබේ. (සෙස්ස සුගමයි)

අසන්තුට්ඨිතා කුසල දුකයයි

41 විජ්ජාච අවිද්‍යාව විනාශ කරන්නාවූ විද්‍යානම්වූ (ධම්මා සන්ති)

විමුත්තිච සතුරුවූ නීවරණ ධර්මයන් ගෙන් මොනවට දුරු වන්නාවූ අෂ්ට සමාපත්ති සංඛ්‍යාත විමුක්තියෙක්ද නොහොත් සියලු කෙලෙසුන් කෙරෙහි දුරුවන්නාවූ නිර්වාණ සංඛ්‍යාත විමුක්ති යෙක් ද (සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් පූර්වේනිවාසානු ස්මෘතිඥාණය දිව්‍යචක්ෂුරභිඥාණය ආශ්‍රවක්ෂයකරඥාණය ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝ නම් මහග්ගත කුසල ක්‍රියා සිත් අව්ලෞාස තත්සම්ප්‍රයුක්ත පන්තිස් චෛතසිකය නිර්වාණය ලැබෙති. (සෙස්ස සුගමයි)

විජ්ජා දුකයයි

42 ඛයෙ ක්ලෙශයන් ගෙව්මෙහි පොහොසත් (සතර මාර්ගයෙහි යෙදුනාවූ) ඥාණං ඥාණ සංඛ්‍යාත (ධම්මා සන්ති)

අනුප්පාදෙ ඒ ඒ මාර්ගයෙන් නසන ලද්දාවූ ක්ලෙශයන් නැවත නුපදනා පරිදි හවගන්නාවූ සතර ඵලයෙහි යෙදුනාවූ ඥාණං ඥාණ සංඛ්‍යාතවූ (ධම්මා සන්ති)

මෙහි ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයෝනම් සතර මාර්ග සම්ප්‍රයුක්ත ප්‍රඥා චෛතසිකයෝ ලැබෙති.

දුතිය පදයාගේ අභිධෙයාර්ථයෝනම් සතර ඵල සම්ප්‍රයුක්ත ප්‍රඥා චෛතසිකයෝ ලැබෙති. සෙස්ස සුගමයි)

ඛයෙඤාණ දුකයයි

සූත්‍රාන්ත මාතෘකා අර්ථ වර්ණනාව මෙතෙකින් නිමියේය

මේ සුවාසූ පදයෝම ස්කන්ධ ආයතන ධාතු සත්‍ය වශයෙන් බෙදවෙන්කිරීම යට කී නයානුසාරයෙන් කළ යුත්තේමැයි.

නිබ්බාණ පච්චයොහොතු

භවග්ගුපාදය අවීචි හෙට්ඨතො-එත්ථන්තරෙ සත්තකා යුප්පන්නා
රූපී අරූපීච අසඤ්ඤ සඤ්ඤිනො-දුක්ඛාප මුඤ්චන්තු ඵුසන්තු
නිබ්බුතිං

අහන්තු පරමං බොධිං-පත්වා ධම්මමනුත්තරං
දෙසෙත්වා පාණිනොසබ්බ-මොචෙය්‍යං භව බන්ධනා—

# මාතෘකා විවරණය

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

''මාතාවියාති මාතිකා'' යනු නිර්වචන බැවින් යම් පාලියක් තොමෝ මවකට බඳු සවභාව ඇත්තීවිද ඒ මාතෘකා නම් වන්නීය. කුමක් හෙයින් මවට සමානවන්නීද යත්? මවුතොමෝ දරුවන්ගේ ඉපදීමට හේතුවේද එසේම මාතෘකා තොමෝ විස්තර නිර්දෙසයාගේ හට ගැණීමට හේතුවෙයි එහෙයින් මාතිකා නම් වෙයි විමති විනෝදනී ටීකායෙහි "මාතිකාති උද්දෙසො සොහි නිද්දෙස පදානං ජනනිට්ඨානෙයිතත්තා මාතාවියාති මාතිකාති වුච්චති'' යනු කියන ලදි. විනයාලඞ්කාරයෙහි වනාහි මාතාවියාති මාතිකායථා පුත්තා මාතිතො පභවන්ති එවං නිද්දෙස පදානි උද්දෙසතො පභවන්ති තස්මා මාතාවියාති මාති කාති වුච්චති (නොහොත්) මාතිකාවියාති මාතිකා'' නිර්වචනබැවින් යම් පාළි ප්‍රදෙශයක් තෙමේ දිය බස්නා ඇලකට බඳු උපමා ඇත්තේවේද එහෙයින් ඒ පාළි තොමෝ මාතිකා නම් වන්නීය. කවර හෙයකින් මාතිකාවට සමාන වන්නීදයත් දිය අගල වනාහි වැව් ගංගා කෙත්වත් ආදිය ගලා බස්නීද එපරිද්දෙන් මාතෘකාවද නිර්දෙසය බලා පවත්නේයි, මේ විකල්පයන් අතුරෙන් පළමුවන විකල්පයෙහි මාතුපදයෙන් පරව කප්‍රත්‍යාගම හා ඉකාරාගමද වේ. "පටිභාග කුච්ඡිත සඤ්ඤාතු කම්පාදි අත්‍ථේසු කපච්චයො'' යනු රූප සිඩි බැවින් මෙහි පටිභාගාර්ථයෙහි කප්‍රත්‍යයයි ඉකප්‍රත්‍යයද මෙහි යෙදෙන්නේයි, එහෙයින් දෙවෙනි විකල්පයෙහි සතර මහා ප්‍රදෙස සූත්‍ර සතරින් යම්කිසි සූත්‍රයකින් ඉකප්‍රත්‍යය දෙශය වෙයි. එම සූත්‍රයෙන් අප්‍රත්‍යා දෙශදවි දෙවෙනි විකල්පය සිඩයි. අතීත අත්බැව්හි මාතෘභූතවූ සන්තුසිතනම් දිව්‍ය පුත්‍රයා ප්‍රමුඛ කොට ඇත්තාවූ දෙවියන්ට මේ අභිධර්මපිටකය දෙශනාකර වදාළේය. යන මෙහි ''දෙවූපපත්තිපන පුරිස භාවෙන වුත්තා'' යනු ථෙරගාථා අටුවා බැවින් දිව්‍ය ලොකයෙහි ඉපදීම පුරුෂභාවයෙන් කියන ලදී. ''මාතුදෙවපුත්තොතායි'' අභිධර්ම අවතාර ටීකායෙහි ආයේයි ''සන්තුසිත දෙවපුත්තො'' යනු ධම්මපදට්ඨ කථායෙහි ආයේයි පාළිවිවරණානයෙහි ඒ මාතෘකා තොමෝ අභිධර්ම මාතෘකාවය සූත්‍රාන්ත මාතෘකාව යයි දෙවදෑරුම් බව කුමකින් දතයුත්තේද යත්? ''සාපි තිකමාතිකා දුකමාති කාති දුවිධා'' යන මෙහි දුක මාතෘකාවෙහි ඇතුලත්කොට සූත්‍රාන්ත මාතෘකාව වදාරණ ලදී. ඔවුන් අතුරෙන් තිකමාතෘකාව කුමක් හෙයින් පළමුකොට තබන ලද්දේදයත්? "සුඛගහණතො අප්ප හෙදතොච තිකා එව පඨමං

වුත්තා" යනු අනුටීකා බැවින් සුවසේ ගැණීම් වශයෙන්ද සවල්ප හෙද ඇති බැවින්ද තිකමාතෘකාව පළමුකොට වදාරණ ලදී. තිකමාතෘකාවෙහි දෙවිසි ත්‍රිකයන් අතුරෙන් කුසල ත්‍රිකය කවර හෙයකින් පළමු කොට තබන ලද්දේද යත්?

"නෙසුපන සබ්බ සඞ්ගහ අසංකර ආදි කල්‍යාණ භාවෙන පඨමං කුසලත්තිකංවුත්තං" යනු අනුටීකා බැවින්ද මේ ත්‍රිකයෙහි සියළු පරමාර්ථ ධර්මයන් සංගෘහිත බැවින් ද කුසල් අකුසල් අව්‍යාකෘතයන් අමිශ්‍ර වශයෙන් දේශනා කළ බැවින් ද කුසල ධර්ම සංඛ්‍යාත වූ ආදි කල්‍යාණයෙන් යුක්ත බැවින් ද කුසල ත්‍රිකයම ආදියෙහි තබන ලද්දේ සි. (නොහොත්) "තදඤ්ඤතිකානං සුඛ ගහණතො" යනු ටීකා වචන බැවින් කුසල ත්‍රිකයෙන් අන්‍ය වූ ත්‍රිකයන් සුවසේ ගැණීම පහසුවන බැවින් කුසල ත්‍රිකය පළමු කොට වදාරණ ලදී.

### මාතෘකා ප්‍රකීර්ණක විවරණයයි

1 කුසල ත්‍රික ගණ්ඨි පදය කෙසේදයත්? කුසල ත්‍රිකයෙහි කුසල පදය කුමක් හෙයින් පළමුකොට තබන ලද්දේදයත්? "කුසලත්ති කෙපි පධාන පාසංස සඳය හිත භාවතො කුසලා ධම්මා පඨමං වුත්තා" යනු අනුටීකා වචන බැවින් සුඛ විපාක ලක්ෂණ ඇති හෙයින් ද ප්‍රධානාර්ථයෙන් ද ප්‍රසංසා කටයුතු හෙයින් ද යුක්ති හෙයින් ද ලෞකික ලොකොත්තර සැප ඵලවත හෙයින්දැයි යන මේ සතරාර්ථයෙන් කුසල ධර්මයෝම පළමුකොට වදාරණ ලද්දාහුය. තදනන්තරව අකුසල ධර්මයෝ කුමක් හෙයින් වදාරණ ලද්දාහුදයත්? "තප්පටි පක්ඛත්තා තදනන්තරං අකුසලා" යනු ටීකා බැවින් කුසලයට අනතුරුව අකුසලය වදාරණ ලදී. තදනන්තරව අව්‍යාකෘත ධර්මයෝ කුමක් හෙයින් වදාරණ ලද්දාහුද යත් "තදුභය විපරිත සභාවාතදනන්තරං අබ්‍යාකතා වුත්තා" යනු අනුටීකා බැවින් තුන්වෙනුව අව්‍යාකෘත ධර්මයෝ දෙසනා කරණ ලද්දාහුය. (නොහොත්) කුසලයන්ගෙන් ආසවාදයද අකුසලයන්ගෙන් ආදිනවයද, අව්‍යාකෘත පදයෙහි ඇතුළත්වූ නිර්වාණයෙන් නිස්සරණයදැයි මෙසේ ආසවාදි ආදීනව නිස්සරණයන්ගේ ක්‍රමයෙන් වදාරණ ලද්දේයයි අනුටීකාවෙහි කියනලදී.

තවද ප්‍රඥාවන්ත සත්වයෝ කුසල ධර්මයෙහි පිහිටා අකුසල ධර්මයන් දුරුකොට අභීත් ඵල නිර්වාණයන් ප්‍රත්‍යක්ෂ කරණ හෙයින් ප්‍රතිපත්ති ක්‍රමයෙන්ද මෙසේ වදාරණ ලද්දේයයි එම ටීකාවෙහි දක්වනලදී. තවද මේ කුසල ත්‍රිකයෙහි එනාහි සෙක්ඛ ත්‍රිකයෙහි තෘතීය පදය නෙවසෙක්ඛා නාසෙක්ඛාධම්මා, යනුවෙන් වදලාක්මෙන් "නෙවකුසලා නාකුසලා ධම්මා,, කියා කුමක්

හෙයින් නොවදුළේදයත්? සෙඛ සවභාව අසෙඛ සවභාව ඇත්තාවූ යම් කිසි ධර්මයක් යම් හේතුවකින් තමාගේ සවභාවයෙන් නොවදුරණ ලද්දුවූ එකම ධර්මයෙකුත් නැත්තේයි. කුසල ත්‍රිකයෙහි මෙසේ නොලැබෙන්නේයි. මෙහි වනාහි කුසලා කුසල සවභාව ඇත්තාවූ ධර්මයෝ තුමූ අභිත් ඵලය ලැබූ කල්හි ඒ කුසලා කුසල සවභාවෙන් නොවදුරණ ලද්දුහුය. එහෙයින් මේ විශෙෂය දක්වනු පිණිස" නෙවකුසල නාකුසලායි,, නොවදුරණ ලද්දේය.

"ඉධපන කුසලා කුසල සභාවා එව ධම්මා අගගඵලුපපතතියා තථා නබ්‍යා කරණීයා හොන්තීති ඉමස්ස විසෙසසස දීපනත්‍ථං අබ්‍යාකතාති වුත්තං,, යනු අනුටීකායි. කුසලා කුසල කර්මය තෙමේ අභිත් ඵලය ලැබූ තැනැත්තාහට ක්‍රියා සථානයෙහි පිහිටන හෙයින් තමාගේ සවභාවෙන් නොවදුරණ ලද්දේය යනුයි. මේ සථානය අතිශයින් දුර්බෝධ සථානයකි. එහෙයින් උපරි පණ්ණාස දක්ඛිණ විභඞ්ග සූත්‍ර අටුවාවෙහි "ඛීණාසවෙන කතකම්මං පනතිවජ්ජා රඟත්තා කුසලංවා අකුසලං වානහොති ක්‍රියාමත්තෙ තිට්ඨති" යනු කියනලදී. (නොහොත්) "නෙවකුසලා නාකුසලා" යන පදය හා අව්‍යාකතා යන පදයද ව්‍යඤ්ජන වශයෙන්ම වෙනස ඇතත් අර්ථ වශයෙන් සමාන වන්නේයි "වචනමත්තමෙව ඉදං නානාකරණං අබ්‍යා කතා නෙව කුසලා නාකුසලාති,, යනු අනුටීකා වචනයි-

## කුසල ත්‍රික විවරණයයි

2 කුසල ත්‍රිකයට අනතුරුව වෙදනා ත්‍රිකය කුමක් හෙයින් වදුළේද යත්? කුසල ත්‍රිකයෙහි වදළාවූ කුසලා කුසල අබ්‍යාකෘත ධර්මයන් හා යෙහුයය වශයෙන් සම්ප්‍රයුක්තවන්නාවූ වෙදනාවෝ කුසල ත්‍රිකයෙහි ක්‍රමයෙන්ම වදුරණ ලදී. මේ ක්‍රමය අනතුරුව වදුරන්නාවූ තික දුකයන්ටත් මෙසේම යෙදිය යුතුයි. මෙසේ සත්කල සියළු තික දුකයෝ සමාන සම්බන්ධයෙන් සම්බන්ධවෙත්. එහෙයින් අනුටීකායෙහි "අවයවානං අනෙක හෙදත්තං දස්සනත්‍ථං තිකනනතර දෙසනා,, යනු කීහ. අවයවානං, අවයවයන්ගේ හෙවත් සතර පරමාර්ථ ධර්මයන්ගේ; අනෙකභාවං දස්සනත්‍ථං, අනෙකප්‍රකාර බව දක්වණ පිණිස; තිකනනතර දෙසනා, අනතුරු ත්‍රිකයන්ගේ දෙසනාව වෙයි; වෙදනා ත්‍රිකයෙහි වෙදනාව පදත්‍රයෙහිම කුමක් හෙයින් ඇතුළත් නොකොට ත්‍රිකමුක්ත වශයෙන් උධරණය කළ සේක්ද යත්? "වෙදනාය, යන සහදිශෝග යෙන් යුක්ත හෙයින් සහාදිශෝගවත්වූ භෙදකර වෙදනාවෝ ඒ ත්‍රිකයෙහි ඇතුළත් නොකටයුතු හෙයිනි. තවද වෙදනාව හා යෙදිය යුතු අනික් වේදනාවක් නැති හෙයින් (නොහොත් එක්

චිත්තයෙක්හි වේදනා දෙකක් නොයෙදන හෙයින්ද සියළු චිත්තයෙහි යෙදුනාවූ වේදනාවන්ට සහාදියෝගය ලැබෙන හෙයින්ද සියළු වේදනාවෝම තිකමුක්තවූහ. වේදනා සම්ප්‍රයුක්ත චිත්තයන් හා උපදනා චිත්ත වශයෙන් කුමක් හෙයින් නො ගන්නා ලද්දහුද යත්? "සංයුක්ත" ශබ්දයෙන් නොවදරා "සම්පයුත්තා" ශබ්දයෙන් වදළ හෙයින් ඒ කුපපාද එකනිරොධ එකාලම්බන එකවස්තුක යන සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් යුක්තවූ ධර්මයන් මුත් සංයුක්තවූ ධර්මයන් නොගත යුතු හෙයිනි. "එකුප්පාදාදි නාංවසෙන සම්පයොගලො වුත්තො,, යනු අටුවා බැවින් මේ වේදනා ත්‍රිකය සබ්බලඩනාම ත්‍රිකයයි කී තන්හි-

අනිට්ඨිතෙ පදෙවණ්ණො වාක්‍යාරං නිට්ඨිතෙ පදං
වාක්‍යං තස්ස සමුදායො තමෙකෙකුකෙකු පේක්ඛලක්ඛණං.

යනුවෙන් යම් වචනයක් උච්චාරණය කොට අවසන්නොවූ කල්හි එක එක වර්ණය අක්ෂර නම් වෙයි. ඒ පදය නිෂ්ටාවූ කල්හි අක්ෂර නාමය හැර පද නාමය ව්‍යවහාර වෙයි. ඒ පදය මූහය ක්‍රියාවකින් නිෂ්ටාවන කල්හි වාක්‍ය නම්වෙයි. එහෙයින් මේ වේදනා ත්‍රික තුන් වාක්‍යයන්හි දොළොස් පදයක් වන හෙයින් වාක්‍යත්‍රයෙහිම ඇතුළත්වූ වේදනා ශබ්දයෙන් කුමක් හෙයින් නම් ලබන්නේද යත්? අක්ෂර සමූහ පදය පද සමූහ පදයයි යන ද්විප්‍රකාර පදයන් අතුරෙන් මෙහි පද සමූහ පදය අභිමතයි. එහෙයින් මූල ටීකාවෙහි "අධිප්පෙතප්පකාරප්ඵත්තස්ස පද සමුදායස්ස පදන්තා පජ්ජති අවබුජ්ඣියති එතනාති පදං" යනුද අනුටීකාවෙහි "තෙනවාක්‍යං ඉධපදන්ති වුත්තන්ති දස්සෙති" යනුද කියනලදී. මේ සබ්බලඩ නාමත්‍රිකයයි කී තන්හි අවයවූ පචාරය බැව් දත යුතුයි. අවයවූ පචාරය නම් ගම්මිරිස් තිප්පිලි කරාබු වසාවාසි සාදික්කා යනාදි ද්‍රව්‍යයන් සමව කිරාගෙන සුණු කළ කල්හි ඒ සියළු චූර්ණයෙහි "සමංචුණ්ණං" යන නාමය ව්‍යවහාර කිරීම අවයවූ පචාරයයි දතයුතු. එපරිද්දෙන්ම පළමුවෙනි දෙවෙනි තුන්වෙනි පද යන්හි ආවාවූ වේදනා ශබ්දය සමුදායවූ ත්‍රිකයෙහි ආරෝපනය කොට ව්‍යවහාර කළ හෙයින් අවයවූ පචාරයයි දතයුතුයි. එහෙයින් අනුටීකාවෙහි "සබ්බදෙහීති තීහිපදෙහි ලඩනාමොහොති අවයව පදෙනාපි සමුදායස්ස අපදිසිතබ්බතො යථා සමංචුණ්ණන්ති" යනු කියන ලදී. එහෙයින්ම සබ්ද සාරත්ථ ජාලිනියෙහි-

"අවයවෙ පවත්තො වොහාරො සමූහෙ ඛතො
තං යථාවෙ සමංචුණ්ණං සමන්තෙපථාව යවං මත්තං

යනු ද කියන ලදී.

වේදනා ත්‍රික විවරණයයි.

3 විපාකත්‍රික ප්‍රථම පදයෙහි කුසලා කුසලයන්ගෙන් හටගන්නාවූ කර්මජ රූපයෝද මෙහි ඇතුළත් නොවිය යුත්තා—හුදයත්? මුඛ්‍යඵල වශයෙන් නාම ධර්මයෝම විපාක ව්‍යවහාර ලබත්. කර්මජ රූපයන්ට කටත්තාරූප යන නාමය මුත් විපාක යන නාමය නොලැබෙන්නේය. එහෙයින් මේ විපාකත්‍රිකයෙහි ප්‍රථම පදයෙන් කර්මජ රූපයෝ උද්ධරණය නොවූහ. කුමක් මෙන්දයත්? සාලිබීජාදියෙන් හටගත්තාවූ අංකුර පත්‍රාදී අවයවයෝ සාලිබීජයාගේ ඵලයයි ව්‍යවහාර නොකොට ඒ වෘක්ෂයන්හි හටගන්නාවූ ධාන්‍ය බීජයෝම සාලිබීජයාගේ ඵලයයි ව්‍යවහාර කරන්නාක්මෙනි. එහෙයින්ම කුසලා කුසල කර්මයන් හා අරූපධර්මවශයෙන් සමානවූ සතර අරූප ස්කන්ධයන්ටමුත් එම ධර්මයෙන් හටගන්නාවූ රූපයන්ට විපාක ව්‍යවහාරය නොලැබෙත්මැයි. එහෙයින් අට්ඨ සාලිනි අටුවාවෙහි “අඤ්ඤ මඤ්ඤ විරුද්ධානං කුසලා කුසලානං පාකාති විපාකා අරූප ධම්මානමෙතං අධිවචනං” යනු කියනලදී. මූලටීකාවෙහිද “යථාසාලිබීජාදීනං” යනාදි පාඨයෙන් යථොක්ත උපමාව දක්වන ලදී. විභාවිනී ටීකාවෙහිද යට කී කාරණය කුසලා කුසල කම්ම සමුට්ඨානානම්පි කටත්තා රූපානං නත්ථි විපාක වොහාරො” යනුවෙන් දක්වන ලදී. එසේවීනම් උපාදින්න ත්‍රිකයෙහි උපාදින්න පදයෙන් කර්මජරූපයන් කුමක් හෙයින් ගන්නා ලද්දේදයත්? විපාක ශබ්දයෙන් මුඛ්‍යඵලයද උපාදින්න ශබ්දයෙන් මුඛ්‍යාමුඛ්‍ය ඵලවයද ගත යුතු හෙයිනි.

විපාක ත්‍රික විවරණයයි

4 උපාදින්න ත්‍රික ප්‍රථම පදයෙහි සමවිසි කර්මජරූපය යනු අභිධර්මාර්ථ සංග්‍රහයෙහි දක්වූ ඒකාන්ත අනේකාන්ත වශයෙන් ගැනෙන අටළොස් රූපයන්ට උපචය සන්තති රූපවය එක් කිරීමෙන් ලැබෙන රූපයෝ විසිදෙනායි. දෙවන පදයෙහි තිජරූප යනුවෙන් දක්වෙන්නේ විඥප්ති රූපමය ශබ්දය ලහුතාදිත්‍රය අවිනිබ්භොග රූප අටය. පරිච්ඡේද රූපය යන පසළොස් රූපයන්ට උපචය සන්තති රූපවය එක්කිරීමෙන් ලැබෙන සතළොස් රූපයෝයි. චිත්තජ උතුජ ආහාරජ යන ත්‍රිවිධ රූපයෝ තිජ රූප නම්වෙයි. “ලක්ඛණ රූපානි නකුතොචි ජායන්ති යන අභිධර්මාර්ථ සංග්‍රහ පාළියෙම උපචය සන්තති රූපවය මෙසේ එක්කිරීම නොගැළපෙන්නේ නොවේද? ධම්ම සඞ්ග ප්‍රකරණ රූපකාණ්ඩයෙහි ඒ ලක්ෂණ රූපයෝ සිව්දෙන රූප ජනක ප්‍රත්‍යයන්ගේ උපකාරයෙන්ම හටගන්නේයයි වදාළ බැවින්ද විභාවිනී ටීකාවෙහි “පාටෙක්කුතොචි ජාතත්තං ජාතියා පරියායතො” යනාදිය දක්වූ හෙයින්ද නොගැළපෙන්නේ වේමය.

පාඨයේ, රූපකාණ්ඩ පාළියෙහි; ජාතියා, උපචය සන්තති රූපද්වයයාගේ; කුතොචිජාතත්තං; යම්කිසි රූප ජනක ප්‍රත්‍යයකින් හටගත්බවක්; පරියායතො, අප්‍රධානවශයෙන් නොහොත් ලෙස මාත්‍රායකින් (උදීරිතං) කියන ලද්දේය.

## උපාදින්න ත්‍රික විවරණයයි

5 "සංකිලෙසෙතීති සංකිලෙසො විබාධති උපතාපෙතීවාති අත්ථො සංකිලෙසෙන සමන්නාගතා සංකිලිට්ඨා අත්තානං ආරම්මණං කත්වා පවත්තනෙන සංකිලෙසං අරහන්තී සංකිලෙසෙවා නියුත්තා තස්ස ආරම්මණභාවං අනතික්කමනතොති සංකිලෙසිකා සංකිලෙසිකස්ස ආරම්මණ පච්චයභූතානං එතං අධිවචනං සංකිලිට්ඨාච තෙ සංකිලෙසිකාචාති සංකිලිට්ඨ සංකිලෙසිකා" යනු අටුවා වචනයි. යො ධම්මො, යම් ධර්මයක් තෙමේ; සංකිලෙසෙති, බාධා කෙරේද (නොහොත්) හිංසා කෙරේද තවන්නේත් වේද; (තස්මා) එහෙයින්; සො ධම්මො, ඒ ධර්ම තෙමේ; සංකිලෙසො, සංකිලෙස නම් වේ. සංපූර්ව "කිලිශ උපතාපෙ" යන ධාතුහු කෙරෙන් "පරවර්ණ ප්‍රත්‍යයවූතැති. ඒ ණ ප්‍රත්‍යයෙන් දශ ක්ලේශයෝ ගැණෙති. ධාත්වර්ථයෙන් බාධාකිරීම හිංසා කිරීමාදිය ගැනෙති. සංශබ්දය ධාත්වර්ථයට අනුව පවත්නේ වෙයි. කවර ධර්ම කෙනෙක් සංකිලිට්ඨ නම් වන්නාහුද යත්? යම් අකුසල ධර්ම කෙනෙක් කෙලෙසුන් හා සම්පූර්ණ වෙද්ද (හෙවත්) කෙලෙසුන් සමග යෙදෙත්ද? ඒ අකුසල ධර්මයෝතුමූ සංකිලිට්ඨ නම් වෙති. යම් රූප කෙනෙක් කෙලෙසුන් සමග සහජාතවූ නමුත් සම්ප්‍රයෝග නොවන හෙයින් ඒ රූපයෝ මෙහි අභිමත නොවන්නාහ. සංකිලෙසික යන පදයෙන් කෙලෙසුන්ට අරමුණුවන්නාවූ ත්‍රෛභූමික නාමරූප ධර්මයන් ගැනෙති.

## සංකිලිට්ඨ ත්‍රික විවරණයයි.

6 විතක්කත්තිකයෙහි විතර්ක විචාරවය හා සම්ප්‍රයුක්තවූ ධර්මය ප්‍රථම පදයෙන් වදරණ ලදී. එහෙයින් විතර්ක විචාර වර්ජිත සමපණ්ණස් චෛතසිකයෝ උදාහරණය වූහ. ද්‍රිතීය පදයෙන් විචාරය හා සම්ප්‍රයුක්තවන ධර්මයන් වදාළ බැවින් ප්‍රථම පදයෙන් වර්ජිතවූ විතර්ක පඤ්චපණ්ණසද උදාහරණය වූහ. තුන්වන පදයෙන් අවිතර්ක අවිචාර ධර්මයන් වදාළ බැවින් ද්‍රිතීය පදයෙන් වර්ජිතවූ විචාර චෛතසිකයන් එකොලොස්දෙන ඇතුළත් කරණ ලද්දාහ. "චිත්තාන සමමුද්දිසෙ යන අභිධර්මාර්ථ සංග්‍රහ පාළියට අනුව විතර්ක පඤ්චපණ්ණසය විචාරයෝ එකොලොසයයි කී බැවී දත යුතු.

## විතක්කත්‍රිකය විවරණයයි.

7 පීතිත්‍රිකයෙහි පළමුවන පදය පමණක් වෙදනා ත්‍රිකයෙන් වෙනස් වන්නේය සෙසු දෙපදයෝ වෙදනාත්‍රික ප්‍රථම පදය හා

තුන්වන පදයම සමානය. “නිප්පීතික සුඛස්ස සප්පීතික සුඛතො විසෙසදස්සනවසෙන අයං තිකො වුත්තො” යනුවෙන් නිප්පීතික සප්පීතික සුඛ වෙදනාවන්ගේ වෙනස දක්වනු පිණිස මෙම ත්‍රිකය වදාළසේක. එහි සුඛසහගත කායවිඤ්ඤාණය හා චතුර්ථ ධ්‍යාන එකොළොස නිප්පීතික සුඛ නම් වෙත්. සෙසු එක්පණස් චිත්තයන් සමග යෙදුනාවූ සුඛ වෙදනාවෝ සප්පීතික නම් වෙත්. (නොහොත්) ප්‍රීති සුඛයන්ගේ ධර්ම ස්වභාව විශෙෂය දැනගැණීම දුෂ්කර හෙයින් ඒ වෙනස දක්වනු පිණිස වදාරණ ලදී. ඒ බව මූලටීකාවෙහි මෙසේ දැක්වේ. “අථවා පීති සුඛානං දුබ්බිඤ්ඤෙය්‍ය නානත්තා නානත්ත දස්සනත්ථං අයං තිකො වුත්තො” නොහොත් “චතුත්ථජ්ඣාන සුඛං අතිපණීත සුඛත්තා ඔළාරිකං ගහෙත්වා නීහරිත්වා තස්ස පණීත භාවං දස්සෙතුං අයං තිකො වුත්තොති කෙචි වදන්ති” යන මූල ටීකාගත කෙචි වාදයෙන් එකොළොස් චතුර්ථ ධ්‍යානයන් හා සමග යෙදුනාවූ සුඛ වෙදනාවෝ ප්‍රණීතතර සුඛයෝ නම් වෙත්. ඔවුන් කෙරෙන් ඖදාරික සුඛවෙදනාවන් වෙන් කොට දැක්වීම පිණිස වදාරණ ලදැයි සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් කියත්ලු. මේ වචනය එල්බගෙණ අනුටීකාචාරීන් වහන්සේද එසේම වර්ණනා කළසේක

පීතිත්‍රික විවරණයයි.

8 දස්සන ත්‍රිකයෙහි ඒකාන්තික අනෙකාන්තික ධර්මයන්ගේ වෙනස මෙසේ දතයුතු. සෝවාන් මගින් නිරවශෙෂයෙන් ප්‍රහාණය කරන්නාවූ දිට්ඨි විචිකිච්ඡා සම්පයුත්ත ධර්මයෝ ඒකාන්තික නම් වෙත්. මතු මාර්ගත්‍රයෙනුදු ප්‍රහාණය කිරීමට තබා ඒක දේශ මාත්‍රයක් ප්‍රහාණය කරණ ධර්ම සමූහය අනෙකාන්තික නම් වෙත්. උද්ධච්ච සහගත චිත්තය අර්හත් මාර්ගයෙන් මුත් යට මාර්ගත්‍රයෙන් ප්‍රහාණය කිරීමෙක් නැත. දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර හා ද්වෙෂමූල දෙසිත සෝවාන් මගින් අපාය ගාමිණී ශක්තිය ප්‍රහාණය වෙයි. සකෘදාගාමි මගින් ඖදාරික භාවය තුනීවෙයි. අනාගාමි මගින් කාම රාගය සමග යෙදුනාවූ දිට්ඨි ගත විප්පයුත්ත සිත් සතර හා සමග ද්වෙෂ මූල දෙසිත නිරවශෙෂ ප්‍රහාණ වශයෙන් ප්‍රහාණය වෙයි. රහත් මගින් උද්ධච්ච සහගත සිත සමග රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා වන් සමග යෙදුනාවූ දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර නිරවශෙෂ වශයෙන් ප්‍රහාණය වෙයි.

දස්සනත්‍රික ගණ්ඨිපදයයි.

9 දස්සන හේතු ත්‍රිකයෙහි මෝහ මූල දෙසිතෙහි යෙදුනාවූ මෝහය සමග අන්‍ය මෝහ කෙනෙක් නොමැති බැවින් අභිධර්මාර්ථ වශයෙන් නොගන්නා ලදී.

දස්සනහෙතුත්‍රික විවරණයයි.

10 ආචයගාමි ත්‍රිකය සුගමයි.

11 සෙක්ඛ ත්‍රිකයෙහි සෙක්ඛා අසෙක්ඛා කියා ද සෙඛා අසෙඛා කියා ද දක්නට ලැබේ. "උපෙඛා-උපෙක්ඛා සවක්ඛාතො-සවඛාතො යනුවෙන් දක්නා ලද බැවින් ඒ විප්‍රකාරයම යෙදෙන් නේයි. රහතුන් වහන්සේගේ අර්හත් ඵල ඤාණය අසෙක්ඛ ධර්ම නම්. සෙසු මාර්ග ඵලසථයින් සත්දෙනාගේ ඒ ඒ මාර්ග ඵල ඤාණයෝ සෙක්ඛ ධර්ම නම් වෙති.

සෙක්ඛත්‍රික විවරණයයි.

12 පරිත්ත ත්‍රිකය සුගමයි.

13 පරිත්තාරම්මණ ත්‍රිකයෙහි ප්‍රථම පදයෙන් කරුණා මුදිතා දෙදෙන අනන්ත සත්ව ප්‍රඥප්තිය අරමුණු කරණ බැවින් වර්ජිත කළහ. විරතීහු වනාහි ලෝකෝත්තර සිත් සමග යෙදෙන විට නිවනම අරමුණු කෙරෙති. කාම ධර්ම මහග්ගත ධර්ම අරමුණු නොකෙරෙති. මහා කුසලයන් සමග යෙදෙන විට වෙන්විය යුතු කාය දුශ්චරිත වාග් දුශ්චරිත සංඛ්‍යාත විරමිතව්‍ය වස්තුවක්ම අරමුණු කෙරෙති. මෙසේ මොවුන්ගේ ආරම්මණ භේදය දතයුතු. හසිතුප්පාදවර්ජිත කාමජවන අටවිස්ස මනොද්වාරාවර්ජනය අභිඥාදෙසිත්තය යන එක්තිස් චිත්තයෝ ත්‍රිකයෙහි ඇතුළත් වන්නාහුද නොවන්නාහුද වෙති. එකම ගවයෙක් තෙමේ කිරි බොන කාලයෙහි වච්ඡා යන නමින් ද කිරි වැරූ තැන් පටන් නාම්බා යන නමින් ද බර උසුලන කාලයෙහි ගොනා යන නමින් ද (වච්ඡ, දම්ම, බලිවද්ද,) ව්‍යවහාර වන්නාක් මෙන් ඒ ඒ ධර්ම අරමුණු කරණ නොකරණ අවස්ථාවන් බලා එසේ කළ බැව් දතයුතු. ඒව අනේකාන්තිකභාගය ක්‍රමය යි කියනු ලැබේ.

පරිත්තාරම්මණත්‍රික විවරණයයි.

14 හීන ත්‍රිකය සුගමයි.

15 මිච්ඡත්ත ත්‍රික ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථයන් අතුරෙහි අහේතුක, අකිරිය, නාස්තික යන දෘෂ්ටීහු තිදෙන නියත මිථ්‍යා දෘෂ්ටි වශයෙන් ගැනෙති. ඒ නියත මිථ්‍යාදෘෂ්ටි කර්මය හෝ පඤ්චානන්තරිය කර්මය හෝ කළාවූ සත්ව තෙමේ මහමෙර උසට මහ සෑයක් කොට සක්වළ පුරා වැඩහුන් බුදු පසේබුදු මහරහත්නට දින පතා සිව්පසයෙන් මහ දන් දුන්නේ නමුදු ඒ කර්මයෙන් නො මිදිය හැක්කේමැයි. ඒ සත්ව තෙම චුතියට අනතුරුව ලබන දෙවන අත්බැව්හි නිරයෙහි උපදනේමය. එහෙයින් නියත මිථ්‍යා දෘෂ්ටිය හා පඤ්චානන්තරිය කර්මය ප්‍රථම පදයාගේ අභිධෙයාර්ථ ලෙස ගන්නා ලදී. ඒ කර්මයෝ සදෙන කරන්නාවූ අවස්ථාවෙහි උපදනා චිත්ත වීථියෙහි සත්වන ජවන චෙතනාවම කියන ලද

අනතුරු අත්බැව්හි විපාකදීමේ ශක්තිය ඇත්තේය. දෙවෙනි ජවනයේ පටන් සවෙනි ජවනය දක්වා ඇති චේතනාවෝ පස්දෙන තුන්වන අත්බැව්හි පටන් නිවන් ලබන අන්තිම ආත්මභාවය දක්වා ඉඩ ලැබුණු තැනකදී විපාක දීමට අවසරයක් සොයමින් පසු පස්සෙහි ලුහුබඳනාහ. ප්‍රථම ජවන චේතනාව යම් කිසි හේතුවක් ඉදිරිපත්වූ විට ප්‍රත්‍යක්ෂ අත්බැව්හිදීම විපාකදීමේ ශක්තිය ඇත්තේය. මෙසේ විපාක නොදුන්නොත් අහෝසි කර්ම සංඛ්‍යාවට පැමිණේති. එහෙයින් සත්වන ජවනයම ගන්නා ලදැයි දතයුතු. ඉතිරි ජවනයෝ සදෙන "අනියතා ධම්මා" යන තුන්වන පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් ගණු ලැබේ.

මාතෘඝාතකාදී ආනන්තරිය කර්ම පසම යමෙකු විසින් කරණ ලද්දේ නම් බලවත්වූ සඞ්ඝ භෙද කර්මයම දෙවන අත්බැව්හි විපාක දෙන්නේය. සෙසු කර්මයෝ සිව්දෙන අහෝසිවන්නාහ යි විභඞ්ගට්ඨ කථාවෙහි දක්වා තිබේ. දෙවන පදයෙන් තමාට අනතුරුව විපාක දෙන්නාවූ මාර්ග වීථින්හි ඵල සිත් සතර ගන්නා ලද්දේය.

## මිච්ඡත්තත්‍රික විවරණයයි

16 මග්ගාරම්මණ ත්‍රික ප්‍රථම පදයෙන් මාර්ගය අරමුණු කරන්නාවූ කල්හි ඤාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සතරය ඤාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සතරය මනොද්වාරාවජ්ජනය අභිඤ්ඤා දෙසිතය විරති අප්‍රමාණ්‍ය වර්ජිතවූ චෛතසිකයෝ තෙතිස්දෙනය යන මේ ධර්මයන් වර්තමාන කාලයෙහි ආචාර්යවරයෝ උද්ධරණය කරතත් ආරම්මණ ප්‍රත්‍යය හා ආරම්මණාධිපති ප්‍රත්‍යය යන ප්‍රත්‍යය දෙදෙන වෙන් කොට ගත්තාහුය. ආරම්මණාධිපති ප්‍රත්‍යය ඒකාන්තයෙන් යෙදෙන්නාවූ පරිද්දෙන්ම ගන්නාවූ කල්හි ද තමාගේ මාර්ගය ආරම්මණාධිපති ප්‍රත්‍යය වශයෙන් උපකාර වන කල්හි ද ඤාණසම්ප්‍රයුක්ත මහා කුසල් සතරය මහා ක්‍රියා සතරය විරති අප්‍රමාණ්‍ය වර්ජිත තෙතිස් චෛතසිකයෝ යයි මෙසේ වෙන් කොට ගතයුත්තාහුය. තෘතීය පදයෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යය සහජාතාධිපති ප්‍රත්‍යය යන ප්‍රත්‍යය දෙදෙන වෙන් කොට ගන්නාවූ කල්හි ද ආරම්මණාධිපති ප්‍රත්‍යය වශයෙන් තමාගේ මාර්ගයෙන් ආරම්මණාධිපති ප්‍රත්‍යය ගන්නාවූ කල්හි ද කුමක් හෙයින් තමාගේ මාර්ගය ප්‍රත්‍යය වශයෙන් ගන්නේද යත්? යමක ප්‍රාතිහාර්යය දක්වන්නාවූ තථාගතයන් වහන්සේගේ මාර්ග ප්‍රත්‍යවෙක්ෂා කරන්නේද අධිපති ප්‍රත්‍යය වශයෙන් උතුම් කොට නො සලකන හෙයින් අන්‍යයන්ගේ මාර්ගය ආරම්මණාධි ප්‍රත්‍යය නො විය හැක්කේයි. තමාගේ මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍යය විය යුත්තේයි එහෙයින් තමාගේ මාර්ගයම ආරම්මණාධිපති ප්‍රත්‍යය

වන හෙයින් ඒ මාර්ගයම ප්‍රත්‍යය විය යුත්තේයි. එහෙයින් අට්ඨසාලිනී අටුවායෙහි "අරියසාවකානං හි අත්තනො මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛණකාලෙ ආරම්මණාධිපති ලබ්භති" යනු කියන ලදී.

යට කියන ලද චෛතසිකයන් කෙරෙහි ඇතුළත් විය යුතු නමුදු "විරිය වීමංස" යන දෙදෙන කුමක් හෙයින් කියන ලද්දේද යත්? චෛතසිකයන්ගේ සඞ්ඛ්‍යාව අඩු කොට කිය යුතු හෙයිනැයි දත යුතුයි. මේ ත්‍රිකයෙහි ත්‍රිකමුක්ත ධර්මයන් අතුරෙන් තෘතිය පදයෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යුත්පන්නවූ ධර්මයන් ලෙස මහා කුසලාදි ධර්මයන් ඇතුළත් වන හෙයින් ප්‍රථම පදයෙහි එකම අපාදන කාරකයක් යෙදිය යුත්තේය.

මග්ගාරම්මණත්‍රික විවරණයයි.

17 උප්පන්න ත්‍රික ප්‍රථම පදයාගේ අද්ධාපච්චුප්පන්න සන්තති පච්චුප්පන්න ඛණපච්චුප්පන්න සමය පච්චුප්පන්න වශයෙන් සතර වැදෑරුම්වූ පච්චුප්පන්නයන් අතුරෙන් උප්පන්න ශබ්දය මේ ත්‍රිකයෙහි ඛණ පච්චුප්පන්න වශයෙන් අර්ථ ගත යුතු බව දක්වනු පිණිස ඛණ ප්‍රත්‍යුත්පන්නවූ එකුන් අනුචිත්තය දෙපණස් චෛතසිකය අටවිසි රූපය යන මෙතෙක් ධර්මයෝ ගන්නා ලද්දාහුය. ඛණ ප්‍රත්‍යුත්පන්නය යනු උප්පාදට්ඨිති භඞ්ග වශයෙන් ක්ෂණත්‍රයට පැමිණ පවත්නාවූ ධර්මයයි. සතරාකාර ප්‍රත්‍යුත්පන්නයාගේ විශේෂ විභාග සම්මෝහ විනෝදනී අටුවා ඉතිවුත්තක අටුවාවන්හි දක්වනලදී. මේ ත්‍රිකයෙහි පූර්ව පදය ප්‍රත්‍යුත්පන්න කාලවශයෙන්ද සෙසු දෙපදය අතීතානාගත කාලවශයෙන්ද ගතයුතුයි. දෙවෙනි පදයෙහි විපාක කර්මජ රූපයන්ගේ විශේෂයක් නැතිබව දැක්වූ හෙයින් ඒ ධර්මයන් හැර අනාගත ධර්මයෝම ගන්නා ලද්දාහුය. තෘතීය පදයෙහි වනාහි හේතුභාවයෙන් කල්පලක්ෂයකට මත්තෙහි හටගත්තාවූද කුසලාකුසල කර්මයන් ගෙන් විපාක කටත්තා රූපයන් විය යුතු හෙයින් අනාගත ධර්මතාවයෙන් ඒ විපාක කර්මජ රූපයෝ උද්ධරණය කරණ ලද්දාහුය.

උප්පන්න ත්‍රික විවරණයයි

18 අතීත ත්‍රිකය සුගමයි.

19 අතීතාරම්මණත්‍රික ප්‍රථම පදයෙහි විරතිවර්ජිත නොකොටම අභිධ්‍යාණී ගැණීමෙක්ද ඇත්තේයි. එතකුදු වුවත් අතීතවූ විරමිතව්‍ය වස්තුවක් නොගත යුතු හෙයින් විරති වර්ජිත කිරීම අතිශයින් යෙදෙන්නෙයි. දෙවෙනි තුන්වෙනි පදයෙහි විරතිත්‍රය වර්ජිත කිරීම යෙදෙයි. අප්‍රමාණ්‍යයෝ

දෙදෙන වනාහි තුන් පදයෙහිම වර්ජ්‍ය කටයුතු හෙයින් අතීතානාගත වර්තමානයයි කියයුතුවූ ප්‍රඥප්තියම අරමුණුකොට ඇති හෙයින් සමහර ආචාර්‍යවරයෝ මේ ත්‍රිකයෙහි ත්‍රිකමුක්ත ධර්මයන් අතුරෙහි ලෝකොත්තර සිත් අවනොගන්නෝයි කුමක් හෙයින්දයත්? නවත්තබ්බාරම්මණවූ නිර්වාණයම අරමුණුකොට ඇති හෙයිනැයි දතයුතුයි.

### අතීතාරම්මණ ත්‍රික විවරණයයි

20 අජ්ඣත්ත ත්‍රිකය සුගමයි

21 අජ්ඣත්තාරම්මණ ත්‍රික ප්‍රථම පදයෙහි ඊර්ෂ්‍යාතොමෝ අනුන්ගේ සම්පත්තිය අරමුණුකොට රවාබැලීම ලක්ෂණකොට ඇත්තීය. අප්‍රමණ්‍යයෝද අනන්‍යවූසත්ව ප්‍රඥප්තියම අරමුණුකොට පවත්නාහුය. එහෙයින් ඊර්ෂ්‍යා අප්‍රමණ්‍යයෝ තුන්දෙන වර්ජිත කරණ ලද්දහුය. දුතිය පදයෙහි මාත්සර්‍ය්‍යය තමාගේ සම්පත් සැඟවීම ලක්ෂණකොට ඇති බැවින් වර්ජිත කරණ ලද්දේයි. තෘතීය පදයෙහි වනාහි තමාගේද අනුන්ගේද සම්පත් අරමුණු කොට පවත්නා හෙයින් ඊර්ෂ්‍යාමාත්සර්‍ය්‍ය අප්‍රමණ්‍යයන් අතුරෙන් ඊර්ෂ්‍යා අප්‍රමණ්‍ය දෙදෙන තමාගේද අනුන්ගේද සන්තානයන් අරමුණුකොට පවත්නේය. මාත්සර්‍ය්‍යය වනාහි අධ්‍යාත්මික ධර්මයක්ම අරමුණුකොට පවත්නා හෙයින් ඒ ධර්මයෝ සතර දෙනම වර්ජිත කරණ ලද්දහුය.

### අජ්ඣත්තාරම්මණ ත්‍රික විවරණයයි

22 සනිදස්සන ත්‍රික ප්‍රථම පදයෙහි සනිදස්සන ශබ්දයෙන් වෙණස් කරණ හෙයින් එකොළොස් ප්‍රකාරවූ සප්පටිඝ රූපය අත්හරණ ලද්දේයි දක්නාලද ස්වභාව හා සමග පැවැත්ම සනිදස්සන ශබ්දයෙන් වාචක වන හෙයින් රූපාලම්බණය නොලැබෙන්නේදැයි ප්‍රශ්න කරත් නම් "සිලාපුත්තකස්ස ශරීරං යෙන උදාහරණයෙහි මෙන් රූපාලම්බණයෙන් අන්‍යවූ දක්ක යුතු ස්වභාවක් නැති හෙයින් අභෙදයෙහි භෙදපරිකල්පනායයි කියන ලද්දවූ අභෙද භෙදො පචාර වශයෙන් කියන ලද්දේයයි විසඳිය යුත්තේයි එහෙයින් අනුටීකායෙහි "අද්දක්ඛා සිලා පුත්ත කස්ස සරීරන්ති,, යනු කියනලදී. අභෙද භෙදො පචාරයෙහි ප්‍රභෙදයක් නැත්තාක්මෙන් කොට ව්‍යවහාර කෙරෙයි එතකුදු වුවත් මධුසාරත්ථ දීපනී ටීකායෙහි ප්‍රභෙද ඇතක් ප්‍රභෙද නැත්තාක්මෙන් කොට ව්‍යවහාර කිරීමයයි කියනලදී. මේ අභෙද භෙදො පචාරය වනාහි පරමාර්ථ අභෙද භෙදො පචාරය ප්‍රඥප්ති අභෙද භෙදො පචාරයයි දෙවැදෑරුම්වේ. මෙහි වනාහි පරමාර්ථ අභෙද භෙදො පචාරය දත යුතුයි.

### සනිදස්සන ත්‍රික විවරණයයි.

## ත්‍රික මාතෘකා විවරණයයි

හෙතුගොච්ඡක ප්‍රථම දුකයෙහි හෙතුනාමේ හේතු හෙතුය උත්තම හෙතුය පච්චය හෙතුය සාධාරණ හෙතුයයි සිව් වැදෑරුම්වේ ඔවුන් අතුරෙන් මෙතැන්හි හේතු හේතුවම ලැබිය යුතු හෙයින් කුසලං කුසලාදි චිත්ත සම්ප්‍රයුක්තවූ ලොභාදී හේතුහු සදෙන උධරණය කරණ ලද්දෝය. ඉදින් උත්තම හෙතුව මෙතැන්හි අභිමතවේනම් කුසල සම්ප්‍රයුක්ත හේතුහු තිංදනම ගත යුත්තාහුය. පච්චය හේතුව අභිමතවේනම් පටිච්ච සමුප්පාද පට්ඨාන දෙක්හි ආවාවූ සියළුම ප්‍රත්‍ය ධර්මයෝ ගත යුත්තාහුය. සාධාරණ හේතුව අභිමතවේනම් අවිද්‍යාදිද්වාද සාංගධර්ම ගතයුත්තාහුවෙති. මෙහි වනාහි ඒ හේතූන් තිදෙනම වර්ජිත කොට "මූලඨෙන හෙතු සබ්බතාධම්මා" යනුවෙන් අටුවාවෙහි වර්ණනාකරණ ලද හේතුහු සදෙනම ගන්නා ලදහ. "හෙතුධම්මා" කියා හ්‍රස්ව වශයෙනද 'හෙතුධම්මා' කියා දීර්ඝ වශයෙන්ද දෙවැදෑරුම් සමාස වාක්‍යයන් ලැබෙනබව අටුවා ටීකාවන්හි දක්වාතිබේ, සහෙතුක දුක දෙවන පදයෙන් මොහ දෙසිතෙහි යෙදුනාවූ මෝහය සමග යෙදෙන්නාවූ වෙන හේතුවක් නැති හෙයින් අහේතුක භාවයෙන් ගැනීම පිණිස වර්ජිත කරණලදී. මොහය වර්ජිත කළේවී නමුදු දෙපණස් චෛතසිකය කියා අභිධෙයාර්ථ දක්වන ලද්දේ ලොභ මූල ද්වෙස මූල යන්හී යෙදුනාවූ මෝහය ගැණීමෙනි.

මේනයින්ම මතු දැක්වෙන තන්හිද අර්ථ දත යුත්තේය· සහෙතුක ව්‍යවහාරය වනාහි ජනක හෙතුව කෙරෙන් අන්‍යවූ සම්ප්‍රයෝග හේතුව සඳහාම කියනලද්දේ වෙයි. ඉදින් ජනක හේතුව සඳහා කියන්නේ නම් ප්‍රථම පදයෙහි අහේතුක චිත්තයන් ගෙන් උපදවන රූපයෝ ගතයුත්තාහු වෙති. දෙවන පදයෙන් නිර්වාණ ධර්මය ලැබිය යුතු වෙයි. ඒ සඳහා අටුවා කථාවෙහි "සම්පයොගතො පවත්තෙන සහහෙතු නාති සහෙතුකා,, යනු කියනලදී.

හෙතුසම්පයුක්ත දුකය සහෙතුක දුකයට අර්ථ වශයෙන් සමානව තිබියදීම-දෙශනා විලාශ වශයෙන්ද වෙනෙයජ්ඣාශය වශයෙන්ද වදුරණ ලද බැව් දත යුත්තේය. විකල්පයෙන් ධර්මවශයෙන් අසමාන බැවින්ද වචනවශයෙන් සමාන බැවින්ද මෙලෙස වදුරණ ලද්දේයයි ටීකාවෙහි දක්වන ලද්දේය. මෙබඳු සියළු පදයන්ගේ අර්ථ මේනයින්ම දතයුත්තේය. සම්භව දුකයෝද හෙවත් බොපන ශබ්දයෙන් ලැබිය යුතු අධිකාර්ථයෙන් ගන්නාලද දුකයෝද අටුවානය මූලටීකානය වශයෙන් නාන්

වැදුරුම් වෙති. එතකුදු වුවත් මූලටීකාචාරීන් විසින් සම්භව දුකයෝ ප්‍රතික්‍ෂෙප කරණ ලද්දෝය. අනුටීකාචාරීන් වහන්සේ වනාහි ධර්මරජන්වූ භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරණ ලද්දාවූ සම්භව දුකයන් නොගත යුතුයයි දක්වනලදී.

''ධම්මානංචා සභාව කිච්චානි බොධෙතබ්බා කාරකාව යථාවතො ජානන්තෙන ධම්මස්සාමිනා යත්තකා දුකාවුත්තා තත්තකෙසු ඨාතබ්බං අධිකා යෙදුකා නවත්තබ්බා තෙ භගවතා නවුත්තාති වෙදිතබ්බං'' යනු අනුටීකා වචනයි

ගොච්ඡ ශබ්දතෙමේ ශබ්දාර්ථ වශයෙන් ඔවුනොවුන් සම්බන්ධ වන්නාවූ දුක සමූහයෙහි ආරොපනය කරණ ලද්දාවූ අනිෂ්පන්න පාටිපදික ශබ්දයෙකැයි ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් කියති. ගොච්ඡ ශබ්දතෙමේ මල්කැන් වාචකවන්නාවූ ශබ්දයෙකි එහෙයින් ''ගොච්ඡකමිව ගොච්ඡකං'' යනුවෙන් ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් කල්පනා කෙරෙති. එතකුදු වුවත් අර්ථ කථාචාරීන් වහන්සේ වර්ණනා ක්‍රමය බලා විශෙෂාර්ථ දත යුත්තේය.

## හෙතු ගොච්ඡක විවරණයයි

අර්ථසාලිනි අටුවා දුක මාතිකා වර්ණනාවෙහි සප්පච්චය දුක වර්ණනා කරන්නාවූ අටුවාචාරීන් වහන්සේ විසින් ''චූලන්තර දුකෙසු අත්තනො නිප්ඵාදකෙන සහපච්චයෙනාති සප්පච්චයා නත්ථි එතෙසං උප්පාදෙවා ඨිතියංවා පච්චයොති අප්පච්චයා'' යනුවෙන් අර්ථ වර්ණනා කරණලදී. ඒ අර්ථ වර්ණනා ක්‍රමය චොදනා පරිහාර අභිප්‍රායාර්ථ සමග දක්වනු ලැබේ. ''අප්පච්චයා ධම්මා'' යන දුතිය පදයාගේ සංවර්ණනාව කරන්නාවූ අටුවාචාරීන් වහන්සේ විසින් ''නත්ථි එතෙසං පච්චයොති'' යන සමාස පදය දැක්වූ පමණින් ''අප්පච්චය පදයාගේ අර්ථය සිඩවන්නේ නමුදු ''උප්පාදෙවා ඨිතියංවා'' යන දෙපදය අධික වශයෙන් කුමක් හෙයින් කියන ලද්දේද යත් නිර්වාන ධාතුවෙහි උප්පාදක්‍ෂණ ඨිතික්‍ෂණ දෙක ලැබිය යුතුවාක් මෙන් ශ්‍රොතෲජනයාහට සංසය හටගැණීමට සුදුසු පරිද්දෙන් කී හෙයින් ''නත්ථි එතෙසං පච්චයොති'' යන සමාස වාක්‍යය කරණකොටගෙන අප්පච්චය'' පදයාගේ අර්ථය සිඩවන්නේ නමුදු ''උප්පාදෙවා ඨිතියංවා යන දෙපදය ඇතුලත් කිරීමෙන් ''අප්පච්චයා ධම්මා'' යන පදයෙහි අකාරය කුමක් හෙයින් ප්‍රතිෂෙධාර්ථ ද්‍යොතක වන්නේද යත්? ප්‍රත්‍යුත්පන්නවූ නාම රූප ධර්මයෝ තුමූ ප්‍රත්‍ය ධර්මයන් හා සම්බන්ධව නිර්වාණ ධර්මයෙහි නැති බව මෙයින් ප්‍රකාශ කරණ ලද්දේය. ''අප්පච්චයා ධම්මා යන පදයෙහි අකාර තෙමේ යුෂ්මත්හු විසින් කියන ලද පරිද්දෙන් ප්‍රත්‍ය ධර්මයන් හා සම්බන්ධය වළක්වා

ලීමෙන් ප්‍රත්‍ය ධර්මයන් හා සම්බන්ධ නොවන හෙයින් "උප්පා-දෙවඃඨිතියංවා" යන පදය නොයෙදූම නිර්වාණ ධර්මයාගේ අප්‍රත්‍ය භාවය ප්‍රකට වශයෙන් දතයුතු බැවින් ඒ "උප්පාදෙවඃඨිතියංවා" යන පදයෙහි ඵලයක් නැත්තාක් මෙන් වැටහෙන්නේ නොවේද යත්? ඒ සැකය දුරුවන පිණිස ඊට පරිහාර දක්වනු ලැබේ. "සප්පච්චයා ධම්මා" යන ප්‍රථම පදයාගේ අර්ථය "අත්තනො නිප්ඵාදකෙන සහපච්චයෙනාති සප්පච්චයා" යන අර්ථ කථං වචනයෙන් කී හෙයින් සප්පච්චය ධර්මයන්ගේ අර්ථයවූ චිත්ත චෛතසික රූප සංඛ්‍යාතවූ ප්‍රත්‍යුත්පන්න ධර්මතෙමේ හෙතුභූතවූ නිෂ්පාදක ප්‍රත්‍ය ධර්මයන් හා සම්බන්ධය ඇත්තේයි. ප්‍රත්‍යුත් පන්නවූ මේ නාමරූප ධර්මයාගේ ප්‍රත්‍යධර්මයන් හා සම්බන්ධ බවෙක්ද ඇත්තේයි. ඒ ප්‍රත්‍යුත්පන්නවූ නාමරූප ධර්මයාගේ උප්පාදක්ෂණ ඨිතික්ෂණයෙහිම ඒ සම්බන්ධත්වය ඇත්තේය

භංගක්ෂණයෙහි නැත්තේයි. ඒ භංගක්ෂණය වැලැක්විය යුතු බැවින් වස්තුස්වභාව ඇත්තාවූ ලැබීම් යුක්තස්ථානයෙහිම වැලැක්විය යුත්තේයි ඒ වැලැක්විය යුතුවූ අර්ථය මේ "අප්පච්චයා ධම්මා" යන ද්විතීය පදයෙහිද "සප්පච්චයා ධම්මා" යන ප්‍රථම පදයෙන් ලැබිය යුතු හෙයින් පරමාර්ථ ධර්මස්වභාව වැලැක්වීම් වශයෙන් ප්‍රථම පදයාගේ අර්ථයෙන් අන්‍යවූ පරමාර්ථ ස්වභාවක් දක්වන හෙයින් ප්‍රතිෂෙධාර්ථද්‍යොතකවූ අකාරය ප්‍රතිෂෙධාර්ථය ඇති බැවින් දුරුකටයුතුවූ වස්තුවෙහි ඒ ඒ ස්ථානයෙහි ලැබෙන්නාවූ ප්‍රත්‍යුත්පන්න නාම ධර්මයාගේ භංගක්ෂණයෙහි සප්‍රත්‍යය වූ හේතුව වලක්වන්නේ අද්හෝයි යන සැකය දුරුවන පිණිස ඒකාන්තයෙන් උප්පාදක්ෂණ ඨිතික්ෂණයෙහිම හෙතුභූතවූ ප්‍රත්‍ය ධර්මය ලැබිය යුතු හෙයින් ඒ උප්පාදක්ෂණ ඨිතික්ෂණ යන ක්ෂණම යෙහි ලැබිය යුතු හෙතුවම වැලැක්විය යුතු හෙයින් හෙතුභූතවූ ධර්මයක් නැත්තාවූ ස්ථානයෙහි කෙසේ වන්නේදැයි යන ශ්‍රොත්‍ර ජනයාගේ සැකය දුරුකිරීමට කාරණාවූ ප්‍රතිෂෙධයාගේ ස්වභාව ශක්තිය හා සමග පච්චය පදයාගේ අර්ථ ස්වභාව සම්පූර්ණකොට හඟවන පිණිස "නත්ථි එතෙසං පච්චයොති" යන සාමාන්‍ය වාක්‍යයෙන් අප්පච්චය පදයාගේ අර්ථය සිධවන්නේ නමුදු "උප්පාදෙවා ඨිතියංවා" යන දෙපදය බහා අර්ථ කථාචාරීන් වහන්සේ විසින් අර්ථ විවරණය කරණ ලද්දේයි නිර්වාණයෙහි උප්පාදක්ෂණ ඨිතික්ෂණයත් ලැබිය යුතු හෙයින් කීසේ නොවෙයි දත යුතුයි. නිර්වාණයෙහි වනාහි උප්පාදක්ෂණ ඨිතික්ෂණ නැති හෙයිනැයි දත යුතු යුක්ති වශයෙන් වනාහි උප්පාදඨිති භංග යන ක්ෂණත්‍රයකින් යුක්තවූ පරමාර්ථ ධර්ම සමුදායෙහි සුදුසු පරිද්දෙන් කර්මාදි හෙතූන්ගේද හෙතු ආලම්බණාදී ප්‍රත්‍යයන් හා සමගද සම්බන්ධ වන්නාවූ ක්‍රමය අවබොධ කටයුතුයි. නිර්වාණ සංඛ්‍යාතවූ

පරමාර්ථ ධර්මයෙහි ප්‍රත්‍යය ස්වභාවයක් නැති බව දක්නා හෙයින් ස්වභාව හා ස්වභාවාර්ථයද වෙන් වශයෙන් නොලැබිය යුතු හෙයින් ස්වභාව වත්වූ උප්පාදක්ෂණ ස්ථිතික්ෂණයෙක්ද නැත්තේය. යන සැකය දුරුවන හෙයින් "නත්ථි එතෙසං" යනාදී වශයෙන් දක්වන ලද වාක්‍යයෙහිද "එතෙසං" යන පදය සම්බන්ධාර්ථ වශයෙන් ගෙණ "පච්චයො නත්ථි" යනු හා සම්බන්ධ කරණු. "උප්පාදෙවා ඨිතියංවා" යන්න සමග සම්බන්ධ නොකරණු එ දෙපදය වනාහි දූන් දක්වන ලද ස්වභාවාර්ථ අභිප්‍රාය ශ්‍රොතෘ ජනයාට අවබෝධ කරණු පිණිස දක්වන ලද්දේයයි දතයුතු "දුබ්බිජානඤානමිදං සාධුකං සල්ලක්ඛෙතබ්බං" යනු පුරාතනාචාර්යවරයන්ගේ අනුශාසනායි.

සප්පච්චය දුක විවරණයයි.

චූලන්තර දුකයෙහි තිබෙණ ධර්ම මාත්‍රයක් ලැබියයුතු පදයෙහි "අප්පච්චයා අසංඛතා" යනාදීන් බහුවචන නිර්දෙශය කුමක් හෙයින් තබන ලද්දේද යත්? මාතෘකාවෙහි වනාහි මතු විස්තර කටයුතු අර්ථයන් පරිච්ඡේද වශයෙන් තුබූ හෙයින් බහුවචනයෙන් වදාරණ ලද්දේයයි දතයුතු එත්ථච අප්පච්චයා අසංඛතාති බහුවචන නිද්දෙසො අවිනිච්ඡිතත්ථ පරිච්ඡෙදවසෙන මාතිකාඨපනතොති වෙදිතබ්බො" යනු මූල ටීකා වචන හා ශබ්ද නීති වචන බැවින්ද බහු වචනයෙන් තබන ලද්දේයයි දත යුතුයි. තවද දෙශනා ශ්‍රොතයෙහි බහුවචනය තැබිය යුතු හෙයින් බහුවචනයෙන් තබන ලද්දේයි.

"භවන්තො නාමපි එකත්ථ සමාරොපනතො බහු
වචනං දෙසනා සොතෙ පතිතත්තාච මඤ්ඤතෙ"

යන සම්බන්ධ චින්තා වචනය හා යෙදෙන්නේයි එතකුදු වුවත් සම්බන්ධ චින්තා වචනය සද්ද නීති කාරක අග්ගවංසාචාරීන් වහන්සේ විසින් ප්‍රතික්ෂෙප කරණ ලද්දේයි. "කෙචිපන දෙසනා සොත පතිත වසෙන බහු වචන පයොගොති වදන්ති තං නගෙහෙතබ්බං නහි භගවා සති සම්පජඤ්ඤ විරහිතො ධම්මං දෙසෙති සුත්තපිච නදිස්සති" යනු සද්දනීති පාඨයි. ශබ්ද සාරාර්ථ ජාලිනියෙහිද.

"අබහුත්තෙපි සතියෙව අත්තනිච ගරූසුච
පරිච්ඡෙදරහෙජ්ජෙදෙ ඉත්‍යාදිසු බහුබ්භවෙ"

මේ ව්‍යාකරණ ග්‍රන්ථයන්හි ත්‍රිවිධාකාර මතයක් ඇතත් මූලටීකාචාරීන්ගේ මතයම ආචාර්ය පරම්පරාවෙහි ගරු කොට ගත්තේයි. "සනිදස්සන" දුකයෙහි වනාහි "සනිදස්සනා" යන්නෙන් එකම රූපාලම්බණය ගත යුතුයි. ඒ රූපාලම්බණය අතීත අනාගත

වර්තමාන වශයෙන් වන්නාවූ ප්‍රභේදය සඳහා භාග්‍යවත්හු විසින් බහුවචනයෙන් වදාරණ ලද්දේය. යනු මූලටීකාචාරීන්ගේ මතයයි. කෙනචි විඤ්ඤෙය්‍ය දුකයෙහි වනාහි ප්‍රථම පදයෙන් හා ද්විතීය පදයෙන් ගන්නාවූ අර්ථයෝ සමාන වෙත් මැයි එසේ ඇති කල්හි කුමක් හෙයින් දුකයක් කොට දෙසනා කෙළේද යත්? විඤ්ඤෙය්‍ය ශබ්දයෙන් ගතයුතු ධර්මයන්ගේ අනේකප්‍රකාර බව වන හෙයින් දුකයක් වන්නේය යනු අර්ථ කථාචාරීන්ගේ අභිප්‍රායයි "කෙනචි" යන පදයාගේ අර්ථය චක්ෂුර් විඥානයයි ගන්නා කල්හි "විඤ්ඤෙය්‍ය" යන පදයාගේ අර්ථය රූපාලම්බණ වෙයි. 'න විඤ්ඤෙය්‍ය" යන පදයාගේ අර්ථය ශබ්දාලම්බනාදි වූ අවශෙෂ පඤ්චාලම්බනය වෙයි. මෙසේ ශ්‍රොත ඝ්‍රාණ ජිව්හා කාය විඥානයන්හිද දතයුත්තේයි මනො විඥානයෙහි වනාහි අතීත අනාගත වර්තමාන ධර්මයන් අතුරෙන් යම් කිසි ධර්මයක් අරමුණු කරන්නාවූ කල්හි "විඤ්ඤෙය්‍ය" ශබ්ද යාගේ අර්ථය අරමුණු කරණ ලද්දාවූ එක එක ධර්මයක් වෙයි මෙසේ විඤ්ඤෙය්‍ය ශබ්දයාගේ අර්ථය අසමාන බැවින් දුකයක් වන්නේයයි කී නියායි. ටීකාචාරීන්ගේ මත පරිද්දෙන් "කෙනචි" යන ශබ්දයෙන් ලැබියයුතු විඥානයෝ අනෙක ප්‍රකාරයෙන් දුකයක් වන්නේය යනුයි. එහි අභිප්‍රාය මෙසේයි පළමුවන කෙනචි ශබ්දයාගේ අර්ථය චක්ෂුර් විඥානය වන කල්හි විඤ්ඤෙය්‍ය ශබ්දයාගේ අර්ථය රූපාලම්බණයවෙයි. පශ්චිමවූ කෙනචි ශබ්දයාගේ අර්ථය ශ්‍රොත විඥානාදීන් වන කල්හි "නවිඤ්ඤෙය්‍ය" ශබ්දයාගේ අර්ථය රූපාලම්බණයම වෙයි. මෙසේ අවශෙෂවූ විඥානයෙහිද පෙරළ පෙරළා අර්ථ දතයුතුයි. කෙනචි ශබ්ද යාගේ අර්ථය විඥානයන්ගේ බහුප්‍රකාරයම ඇති බැවින් දුකයක් වන්නේයයි කී නියායි. මේ අට්ඨකාචාරීන්ගේ හා මූලටීකාචාරීන් ගේ වාදයන් අතුරෙන් අර්ථ කථාචාරීන්ගේ වාදයම අනුටීකාචාර්‍ය්‍ය ගුල්හත්ථ විනිශ්චයාචාරීන් වහන්සේ විසින් පිළිගන්නා ලදී. මූලටීකාචාර්‍ය්‍ය වාදය නොපිළිගන්නා ලදී. මූලටීකාචාර්‍ය්‍ය මතය ගුල්හත්ථ විනිශ්චයාචාරීන් හැර අනික් ආචාර්‍ය්‍ය වරයන් විසින් පිළිගන්නා ලදී.

### චූලන්තරදුක විවරණයයි.

ආසව ගොච්ඡකයෙහි ඇතුළත් වූ සාසව දුකයෙහි "ස" ශබ්දය වනාහි සහ ශබ්දයාගේ පර්‍ය්‍යාය වූ හෙයින් එක්ව හට- ගැණීමය යන අර්ථවාචක වන්නේයි එහෙයින් එක්ව හට- ගන්නාවූ අර්ථය සම්ප්‍රයුක්තාර්ථයට වෙනස් නොවන හෙයින් ආසව සම්පයුක්ත දුකය හා අර්ථ වශයෙන් සමානවන්නේ නම් සම්ප්‍රයුක්ත වශයෙන් එක්ව හටගන්නා බව නොකිය යුත්තේය. එ හෙයින් අරමුණු වන්නාවූ ධර්මයෝම ගන්නා හෙයින් ආසව සම්ප්‍රයුක්ත දුකය හා සාසව දුකය අර්ථවශයෙන් සමාන

නොවෙත්මැයි එහෙයින් අටුවාවෙහි "අත්තානං ආරම්මණං කත්වා පවත්තන්ති සහ ආසවෙහීති සාසවා,, යනු කියන ලද්දේයි. ආසව සම්පයුක්ත දුක ප්‍රථම පදයෙහි ද්වේෂමූලික මෝහමූලික සතර චිත්තයෙහි යෙදුනා වූ මෝහය වර්ජිත කළ හෙයින් ඒ සිත් හා එක්ව යෙදුනාවූ මෝහය හැර අනික් ආශ්‍රවයන් හා සම්ප්‍රයුක්ත නොවන හෙයින් ඒ මෝහය වර්ජිත කෙලෙස්හි අවශෙෂ ගොච්ඡකයන්හිද මේ ක්‍රමය ගතයුත්තේයි.

හෙතුගොච්ඡකයෙහි අවසාන දුකය මෙන් මේ ආසව ගොච්ඡකයෙහි අවසාන දුකයද "ආසවබොපනධම්මා සාසවාපි අනාසවාපි,, යනුවෙන් වදළ යුතු වුවද "ආසවවිප්පයුත්තා බොපන ධම්මා සාසවාපි අනාසවාපි,, යනුවෙන් කුමක් හෙයින් වදළේද යත්? සම්ප්‍රයුක්ත වශයෙන් සාසව නොවන්නේය ආරම්මණ ආරම්මණිකව විප්පයුත්ත වශයෙන් සාසව නම් වන්නේයයි දක්වනු කැමතිව එපරිද්දෙන් දෙශනා කළසේක. සහේතුක යයි කීයේ නම් හේතුව හා සමග හටගන්නාවූ ධර්මයක් ලැබෙන්නාක් මෙන් සාසවයයි කීයේ නම් ආශ්‍රවයන් හා සමග හටගන්නාවූ ධර්මය නොගතයුත්තේයි. ආලම්බන ආලම්බනික-භාවයෙන් විශෙෂවූ ධර්මයක්ම ගතයුතු බව දක්වනු කැමතිව මෙසේ වදාරණ ලදී. "ඔසාන දුකෙ නොආසවාබොපනාති අවත්වා ආසව විප්පයුත්තා බොපනාති වචනං සාසවානං සහෙතුකානං විය සම්පයුත්තෙනාති සංසදිසතා නහොතීති දස්සනත්ථං,, යනු අභිධර්ම මූලටීකා පාඨයි නොහොත් "නොආසවා බොපන,, යන අවසාන දුකයෙහි ප්‍රථම පද තෙමේ චතුත්ථ දුක-යෙහි ද්විතීය පදයට සමාන වන්නේයි ද්විතීය පදයම එහි විශෙෂ වන්නේයි මේ එකම ද්විතීය පද තෙමේ දුකයක් නොවිය යුතු හෙයින් "ආසව විප්පයුත්තා බොපන,, යනුවෙන් වදාරණ ලද්දේය යනුද ටීකා ක්‍රමයයි එපරිද්දෙන්ම හෙතුගොච්ඡකයෙහිද "හෙතු විප්පයුත්තාබොපන,, යන පදය යෙදෙන්නේ නම් "සහෙතුකාපි,, යනුවෙන්ද සහෙතුක ධර්මයක්ම හෙතුවිප්පයුක්ත නොවියයුතු හෙයින් නොවදළේය යනුද ටීකානයයි.

### ආසව ගොච්ඡක විවරණයයි

සංයෝජන ගොච්ඡක ප්‍රථම පදයෙහි සංයෝජන ධර්මයෝ අවදෙනකැයි කීයේ නමුදු අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි සූත්‍රාන්තනය අභිධර්මනය සංඛ්‍යානනය ද්වය එක්කොට සංයොජනයෝ නවදෙනෙකැයි කීයේයි.

මේ අභිධර්ම මාතෘකාවෙහි අභිධර්මනයට අනුව උද්ධච්චය පහකොට සංයොජනයෝ අවදෙනෙකැයි කියන ලද්දහුය

අවසාන දුකයෙහි හෙතුගොච්ඡකයට කී නයින්ම "නොසඤ්ඤො-ජනා ඛොපන ධම්මා,, යන පදයට කී විස්තර දතයුතුයි·

## සංයොජන ගොච්ඡක විවරණයයි

ගන්ථගොච්ඡකයෙහි දන්තජද්විතීයාක්ෂරය වූ ථකාර සවර්ගාන්ත නකාරය හා සම්බන්ධකොට සමහරු ව්‍යවහාර කරතත් එය නොයෙදෙන්නේ යි.

අර්ථසාලිනී ගැටපදයෙහිද දන්තජ චතුර්ථාක්ෂරය හා සමග යෙදෙන්නේ යයි කියති. ගන්ථ සම්පයුක්ත පදයෙහි විස්තරාර්ථ යට කී නයින් දත යුතුයි.

## ගන්ථගොච්ඡක විවරණයයි

"ඔඝගොච්ඡක යොග ගොච්ඡක දෙදෙන ආසවගොච්ඡකයට සමානයි. දෙශනාවිලාස වෙනෙය්‍යාධ්‍යාසය වශයෙන් ව්‍යඤ්ජන මාත්‍රයකින් වෙනස්කොට දෙශනාකරණ ලද්දේයි.

## ඔඝගොච්ඡක යොගගොච්ඡක විවරණයයි

පරාමාසගොච්ඡකයෙහි එකම මිථ්‍යාදෘෂ්ටිය බහුවචන වශයෙන් දෙශනාකරණ ලද්දේ අතීත අනාගත වර්තමාන ධර්මයන් එක්කොට ගෙණය. එමෙන්ම ස්කන්ධ සංග්‍රහයෙහිද අතීත අනාගත වර්තමාන වූ මිථ්‍යාදෘෂ්ටීන් එක්කොට සංස්කාර ස්කන්ධයයි වදාරණ ලද්දේයි. ඒට සමුද්‍රොපචාරයයි කියත්.

"වෙදනාදී සුපෙක්ඛසම්ං – ඛන්ධ සද්දෙතු රූළ්හියා
සමුද්දෙක දෙසෙතු සමුද්දදී රවොයථා.

යතු සච්ච සංඛෙපයි,, මෙහිද සමුද්‍රොපචාරයයි දතයුතුයි. පෙරපසු ගොච්ඡකයන්හි මෙන් "පරාමාසාචෙව ධම්මා පරාමාස සම්පයුත්තාච,, යනාදී වශයෙන් නොවදාරණ ලද්දේ පරාමාස ධර්මය එකක්වන බැවිනි.

## පරාමාස ගොච්ඡක විවරණයයි

මහන්තර දුකයෙහි චිත්තසංසට්ඨ දුකයාගේ ප්‍රථම පදයෙන් ලැබියයුතුවූ චිත්තජරූපයද සංසට්ඨ වියයුතු හෙයින් ඇතුළත් නොවන්නේද යත්? එක්ව උපන් මාත්‍රයකින් සංසට්ඨ යයි කියත්. එහෙයින් චිත්තජරූපය ඇතුළත් නොවන්නේයි. යෙසං රූපානං චිත්තං සහජාත පච්චයො හොති තෙසං චිත්තස්ස සුවිසොදදය්‍ය නානත්තාන්ති නිරන්තර භාවං නුපගමනං වෙදිතබ්බං,, යනු ටීකා වචනයි. චිත්තසමුට්ඨාන දුකයෙහි ප්‍රථම පදයාගේ අර්ථයවූ සතළොස් චිත්තජ රූපයන් අතුරෙන් විඥප්ති රූපද්වයම එකාන්ත චිත්තජ වන හෙයින් ඔවුන් වර්ජිතකොට අවශෙෂවූ පසළොස් රූපයෝ කර්මජ ආහාරජ උතුජ වශයෙන් ද්විතීය පදයෙන් ලැබිය යුත්තෝයි.

අජ්ඣත්තික දුකයෙහි අජ්ඣත්තයද ගෝචරජ්ඣත්තය නියකජ්ඣත්තය අජ්ඣත්තජ්ඣත්තය විසයජ්ඣත්තය"යි සිව්වැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් ආරම්මණ සාමඤ්ඤ ගෝචර සඞ්ඛ්‍යාතවූ රූපාදි අරමුණු සය ගෝචරජ්ඣත්ත නම් වේ. තමන්ගේ අභ්‍යන්තරයෙහි වූ සියළු නාම ධර්මයෝ නියකජ්ඣත්ත නම් වේ. චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය මනෝ යන ආයතනයෝ සදෙන අජ්ඣත්තජ්ඣත්ත නම් වේ. ඵලසමාපත්තිය විසයජ්ඣත්ත නම් වේ. ඔවුන් අතුරෙන් මේ දුකයෙහි අජ්ඣත්තජ්ඣත්තය කැමති විය යුතු හෙයින් එකුන්අනූ චිත්තය පංචප්‍රසාද රූපය යන මේ ධර්මයෝම ගතයුත්තාහුමය. අජ්ඣත්තත්‍රිකයෙහි වනාහි නියකජ්ඣත්තය සඳහා තම්හාගේ සන්තානයෙහි චිත්ත චෛතසික රූපයෝ අනවශේෂයෙන් ගන්නා ලදී. මෙසේ අජ්ඣත්තත්‍රිකය හා අජ්ඣත්ත දුකයාගේ වෙනස දත යුත්තේය. අටුවාවෙහිද එසේම කියන ලදී

## මහන්තර දුක විවරණයයි

උපාදාන ගොච්ඡක කිලෙස ගොච්ඡකයන්හි කියයුතු විශේෂාර්ථ කෙතෙක් නැත්තේය.

පිට්ඨි දුකයන් අතුරෙන් දස්සන දුකය ආදි සතර දුකයෙහි දස්සන දුකයට ති නයින් අර්ථ ගත යුත්තේය. දිට්ඨිගත විප්ප යුත්ත සතර චිත්තය ද්වේෂමූලික දෙසිතය යන සදෙනා කෙරෙහි අපාය ගමණීය ශක්තිය යනු සතර අපායෙහි ඉපිදවිය හැකිවූ අකුසලකර්මයෝය අපායගමණීය ශක්තිය නැත්තාවූ යනු සතර අපායෙහි ඉපිදවිය හැකි ශක්තියෙන් තොරවූ අකුසලයෝය යන අර්ථයි.

## පිට්ඨිදුක විවරණයයි

සවිතක්කදුකය, සවිචාරදුකය, සප්පීතිකදුකය, පීතිසහගත දුකය, සුඛසහගතදුකය, උපෙක්ඛාසහගතදුකය යන මේ ෂට් දුකයන් කෙරෙහි පළමු වෙනි පදයෙන් වර්ජිත කරන්නාවූ ධර්මයෝ ඕතීය පදයෙහි ඇතුළත් කටයුත්තාහුය. එක එකම ධර්මය අධිකකොට සම්ප්‍රයුක්ත ධර්මයක් නොලැබියයුතු හෙයිනැයි දතයුතුයි. කාමතෘෂ්ණාවගේ හැසිරීමට ස්ථාන වන බැවින් රූප භූමියෙහි භවගන්නා කල්හිද ඇතිතාක් නාමරූපයෝ කාමාවචර දුකයෙහිම ඇතුළත් වෙති. වෘත්තමූලය එකාන්තයෙන් සිඳිනා හෙයින් සතර මාර්ගයම නිය්‍යානිකාර්ථයෙහි ඇතුළත්කොට ගත යුත්තේයි. එපරිද්දෙන් එකාන්තයෙන් ප්‍රතිසන්ධිය නොසිඳිය හැකිවූ ප්‍රතිප්‍රශ්‍රබ්ධිමාත්‍රයක් වන හෙයින් සතරඵලය අනිය්‍යානිකාර්ථයෙහි ඇතුළත් කෙළේයි. මේද අටුවානයයි. නියත

දුකයෙහි විශේෂාර්ථ මිච්ඡත්තත්‍රිකයෙහි කී නයින් දතයුතුයි. සඋත්තර දුකයාගේ සංවර්ණනාව කරන්නාවූ අර්ථකථාචාරීන් වහන්සේ විසින් "අඤ්ඤෙ ධම්මෙ උත්තරන්ති පරිහරන්තීති—උත්තරා—අත්තානං උත්තරිතුං සමත්ථෙහි සහ උත්තරෙහීති—සඋත්තරා—නත්ථි එතෙසං උත්තරොති—අනුත්තරා" යනු කියන ලදී. මෙහි සංවර්ණණීය පදයාගේ අර්ථ දක්වීම ප්‍රමාණ හෙයින් "උත්තරන්තීති උත්තරා—සහ උත්තරෙහීති සඋත්තරා—නත්ථි එතෙසං උත්තරාති—අනුත්තරා" යන අර්ථයකි කියායි. ඔවුන් අතුරෙන් "උත්තරන්ති" යන පදයෙන් සකාර නකාර යන නිපාතයන් හා සමග සමාස පද වශයෙන් මිශ්‍ර නොකොට කෙවල උත්තර ශබ්දයාගේ කර්තෘ අර්ථ භාවය ප්‍රකාශ කෙළේයි. "පජහන්ති" යන පදයෙන් උත්තර පදයාගේ පජහනාර්ථයෙහි පැවැත්ම ප්‍රකාශ කෙළේයි. එහි අර්ථය ලෝකොත්තර ධර්මයෝයි. "උත්තරන්ති" යන පදයෙහි පජහනාර්ථ ඇත්තාවූ "උප්පූර්-තර" ධාතු නොමෙයි සකර්මක ධාතු වන හෙයින් කර්මය අපෙක්ෂා කරන්නේනුයි "අඤ්ඤෙ ධම්මෙ" යන පාඨය කියන ලද්දේයි. මේ වනාහි අනුසන්ධි වචන මාත්‍රයකි. ආයුෂ්මත් අර්ථකථාචාරීන් වහන්සේ "අඤ්ඤෙ ධම්මෙ උත්තරන්ති පජහන්ති" යන පාඨයෙන් අන්‍යවූ ධර්මයන් පහකළ හැකි හෙයින් ලෝකොත්තර ධර්ම තෙමේ උත්තර නම් වන්නේයයි කීහ. ඒ උත්තර නම්වූ ලෝකොත්තර ධර්මය විසින් පජහනය කටයුතුවූ උත්තරිතව්‍යවූ අන්‍ය ධර්මයෝ කවරහුදැයි යන චෝද්‍යයක් ඇති හෙයින් "අත්තානං" යන මේ කාරකය යොදන ලද්දේයි. මෙහි අභිප්‍රාය පජහනය කටයුතුවූ උත්තරිතව්‍ය අන්‍ය ධර්මයෝ වනාහි සඋත්තර ධර්මයන් කෙරෙන් අනික් තැනෙක්හි නොලැබිය යුත්තේයි.

සඋත්තර ධර්මයාගේ අර්ථය වූ ත්‍රෛභූමික ධර්මයෝ මැයි මේ. "අත්තානං" යන පාඨයෙන් ත්‍රෛභූමික ධර්මය උත්තරිතව්‍ය ධර්ම වශයෙන් දක්වූ හෙයින් සහ ශබ්දය සකාරය නකාරය යන නිපාත පදයන් හා සමග සමාසවන්නාවූ උත්තරපදය "උත්තරිතබ්බාති උත්තරා" යනුවෙන් කර්ම සාධනයෙහි කටයුතු බවද, අර්ථාපත්ති න්‍යායාර්ථ වශයෙන් ප්‍රකාශ කෙළේයි. ආයුෂ්මත් අර්ථකථාචාරීන් වහන්සේ උත්තරිතව්‍යවූ අන්‍ය ධර්ම තෙමේ සඋත්තර ධර්මයාගේ අර්ථයවූ ත්‍රෛභූමික ධර්මයෝමයයි ප්‍රකාශ කෙළේයි. "සහ උත්තරෙහීති සඋත්තරා" යන සමාස වාක්‍යාර්ථය ත්‍රෛභූමික ධර්මයන් සමග හටගත්තේය යන අර්ථය නොවන්නේදැයි යන චෝද්‍යය සඳහා "උත්තරිතුං සමත්ථෙහි" යන පාඨය කියනලදී. එහි අභිප්‍රාය මෙසේයි. කර්මසාධන වශයෙන් සිද්ධවූ උත්තරපද තෙමේ කර්ම ප්‍රධාන භාව ප්‍රධාන වශයෙන් දෙවැදෑරුම්වේ. ඔවුන් අතුරෙන් භාව ප්‍රධාන වශයෙන් වන කල්හි ද්‍රව්‍ය වශයෙන් ප්‍රභේද නොවන්නේද සන්දස්සන පදය මෙන් භාවය භාව වචනය යන දෙදෙනාගේ වශයෙන් ප්‍රභේදය සලකා "සහ උත්තරෙහි සඋත්තරා" යන සමාස වාක්‍යය කියයුතුය යන අර්ථය අර්ථකථාචාරීන් විසින් හඟවනලදී. ඒ "උත්තරිතබ්බස්ස අඤ්ඤස්ස නිද්දිට්ඨස්ස අභාවා

නිද්දිසියමානා සඋත්තර ධම්මාච උත්තරි නබ්බාති අත්තානන්ති ආහ" යනු ටීකා පාඨයෙන් අනුමාන වශයෙන් දතයුත්තේයි. මෙහි නොකී සියළු දුකයන්ගේ විශෙෂාර්ථ යටකී තිකදුකයන්ගේ විනිශ්චයානුසාරයෙන් දතයුත්තේයි

අභිධර්ම මාතෘකා විවරණය නිමි.

සිද්ධිරස්තු

## සුත්තන්ත මාතිකා නිබ්බචන

1 සම්පයොග වසෙන විජ්ජං භජන්තීති-විජ්ජාභාගිනො-විජ්ජාභාගෙ විජ්ජා කොට්ඨාසෙ (වත්තන්තී) තිපි-විජ්ජාභාගිනො-සම්පයොගවසෙනෙව අවිජ්ජං භජන්තීති-අවිජ්ජාභාගිනො-අවිජ්ජාභාගෙ අවිජ්ජා කොට්ඨාසෙ (වත්තන්ති) තිපි අවිජ්ජාභාගිනො෴

2 පුන අනජ්ඣොත්ථරණ භාවෙන කිලෙසන්ධකාරං විද්ධංසෙතුං අසමත්ථතාය විජ්ජු උපමා (එතෙසන්ති) විජ්ජූපමා-නිස්සෙසං විද්ධංසන සමත්ථතාය වජිරං උපමා (එතෙසන්ති) වජිරූපමා෴

3 බාලෙසු ඨිතත්තා යථා ඨිතා (තදුපචාරෙන) බාලා-පණ්ඩිතෙසු ඨිතත්තා-පණ්ඩිතා-බාලකරත්තාවා-බාලා-පණ්ඩිතකරත්තාවා-පණ්ඩිතා෴

4 කාසුබ්බං හනතීති - කණ්හා = කණ්හාභිජාතිහෙතුතො= කණ්හාසුක්කාභිජාති හෙතුතො-සුක්කා෴

5 ඉධචෙව සම්පරායෙච තපෙන්තීති-තපනීයා-නතපනීයා අතපනීයා෴

6 සිරිවඩ්ඪකො ධනවඩ්ඪකොති (ආදයොවියයි වචන මත්තමෙව අධිකාරං කත්වා) පවත්තා-අධිවචනානාම-අධිවචනානං පථා අධිවචනපථා෴

7 අභිසඞ්ඛරොන්තීති ඛො භික්ඛවෙ තස්මා සංඛාරාති එවං නිද්ධාරෙත්වා සහෙතුකං කත්වා වුච්චමානා අභිලාපා නිරුත්ති නාම නිරුත්තීනං පථා-නිරුත්තිපථා෴

8 තක්කා විතක්කා සඞ්කප්පාති එවං තෙන තෙනපකාරෙන ඤාපනතො-පඤ්ඤත්තිනාම-පඤ්ඤත්තීනං පථා-පඤ්ඤත්තිපථා෴

9 නාමකරණට්ඨෙන නමනට්ඨෙන නාමනට්ඨෙනච නාමං-රුප්පනට්ඨෙන රූපං෴

10 අවින්දියං වින්දතීති වින්දියං නවින්දතීතිවා-අවිජ්ජා-යොනං-පස්සති තංතංසිතං කරෙතීති-තණ්හා - භවස්ස තණ්හා භවතණ්හා෴

11 භවො වුච්චති සස්සතං සස්සතවසෙන උප්පජ්ජනදිට්ඨි-භවදිට්ඨි විභවො වුච්චති උච්ඡෙදං උච්ඡෙදනවසෙන උප්පජ්ජනදිට්ඨි විභවදිට්ඨි෴

12 සස්සතො අත්තා ච ලොකො චාති පවත්තා දිට්ඨි–සස්සතදිට්ඨි–උච්ඡිජ්ජිස්සතීති පවත්තා දිට්ඨි–උච්ඡෙදදිට්ඨි෴

13 අන්තවාති පවත්තා දිට්ඨි–අන්තවා දිට්ඨි–අනන්තවාති පවත්තා දිට්ඨි–අනන්තවා දිට්ඨි෴

14 පුබ්බන්තං අනුගතා දිට්ඨි–පුබ්බන්තානුදිට්ඨි–අපරන්තං අනුගතා දිට්ඨි–අපරන්තානුදිට්ඨි෴

15 හිරීයනා–හිරි–න හිරිකං අහිරිකං–ඔත්තප්පනා ඔත්තප්පං–න ඔත්තප්පං අනොත්තප්පං෴

16 හිරීයති පාපාති හිරි–ඔත්තප්පති භායති පාපතොති ඔත්තප්පං෴

17 දුක්ඛං වචො එතස්මිං විප්පටිකූලගාහිම්හි විපච්චනීකසාතෙ අනාදරෙ පුග්ගලෙති) දුබ්බචො තස්ස කම්මං දොවචස්සං–තස්ස භාවො දොවචස්සතා – පාපා අස්සද්ධාදයො පුග්ගලා එතස්ස මිත්තාති – පාපමිත්තො – තස්ස භාවො පාපමිත්තතා෴

18 සොවචස්සතා ච කල්‍යාණමිත්තතා ච වුත්තපටිපක්ඛනයෙන වෙදිතබ්බා෴

19 පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තියො සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තියොති එවං වුත්තාසු ආපත්තීසු කුසලභාවො–ආපත්ති කුසලතා– තාහි ආපත්තීහි වුට්ඨානෙ කුසලභාවො–ආපත්තිවුට්ඨානෙ කුසලතා෴

20 සමාපත්තීසු කුසලභාවො—සමාපත්ති කුසලතා—සමාපත්තීහි වුට්ඨානෙ කුසලභාවො—සමාපත්තිවුට්ඨාන කුසලතා෴

21 අට්ඨාරසසු ධාතූසු කුසලභාවො—ධාතුකුසලතා—තාසංයෙව ධාතූනං මනසිකාර කුසලභාවො—මනසිකාර කුසලතා෴

22 චක්ඛායතනාදීසු කුසලභාවො—ආයතන කුසලතා—ද්වාදසඞ්ග පටිච්චසමුප්පාදෙ කුසලභාවො—පටිච්චසමුප්පාද කුසලතා෴

23 තස්මිං තස්මිං ඨානෙ කුසලභාවො—ඨානකුසලතා—අට්ඨානෙ කුසලභාවො—අට්ඨාන කුසලතා෴

24 උජුභාවො—අජ්ජවො—මුදුභාවො—මද්දවො෴

25 අධිවාසන සඞ්ඛාතො ඛමනභාවො—ඛන්ති—සුරතභාවො සොරච්චං෴

26 සම්මොදකමුදුභාව සඞ්ඛාතො සඛිලභාවො—සාඛල්‍යං—ධම්මාමිසෙහි පටිසන්ථරණං—පටිසන්ථාරො෴

27 ඉන්ද්‍රියසංවර භෙදසංඛාතො මනච්ඡට්ඨෙසු ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරභාවො — ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා — පටිග්ගහන පරිභොග වසෙනමත්තං අජානන භාවො — භොජනෙ අමත්තඤ්ඤුතා ෴

28 ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාච, භොජනෙමත්තඤ්ඤුතාච, වුත්ත පටිපක්ඛනයෙන වෙදිතබ්බා ෴

29 සතිවිප්පවාසසඞ්ඛාතො මුට්ඨස්සතිභාවො — මුට්ඨස්සච්චං — අසම්පජානනභාවො — අසම්පජඤ්ඤං ෴

30 සරතීති සති — සම්පජානාතීති — සම්පජඤ්ඤං ෴

31 අප්පටිසඞ්ඛානෙ අකම්පනට්ඨෙන පටිසඞ්ඛාන සඞ්ඛාතං බලං පටිසඞ්ඛානබලං — විරියසීසෙන සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්තස්ස උප්පන්නං බලං — භාවනාබලං ෴

32 පච්චනීකධම්මෙ සමෙතීති සමථො — අනිච්චාදිවසෙන විවිධෙන ආකාරෙන පස්සතීති — විපස්සනා ෴

33 සමථොව තං ආකාරං ගහෙත්වා පුනප්පවත්තෙතබ්බස්ස සමථස්ස නිමිත්තවසෙන — සමථනිමිත්තං — පග්ගහනිමිත්තෙපි එසෙවනයො ෴

34 සම්පයුත්ත ධම්මෙ පග්ගණ්හාතීති — පග්ගහො — න වික්ඛිපතීති අවික්ඛෙපො ෴

35 සීලවිනාසකො අසංවරසඞ්ඛාතො සීලස්ස විපත්ති — සීලවිපත්ති සම්මාදිට්ඨිං විනාසිකා මිච්ඡාදිට්ඨිසඞ්ඛාතා දිට්ඨියා විපත්ති දිට්ඨිවිපත්ති ෴

36 සොරච්චමෙව සීලස්ස සම්පාදනතො සීලපරිපූරණතො සීලස්ස සම්පදා — සීලසම්පදා — දිට්ඨිපාරිපූරිභූතං ඤාණං දිට්ඨියා සම්පදාති දිට්ඨිසම්පදා ෴

37 විසුද්ධිභාවං සම්පත්තා සීලසඞ්ඛාතා සීලස්ස විසුද්ධි — සීලවිසුද්ධි නිබ්බාන සඞ්ඛාතං විසුද්ධිං පාපෙතුං සමත්ථා දස්සන සඞ්ඛාතා දිට්ඨියා විසුද්ධි — දිට්ඨිවිසුද්ධි ෴

38 විජානනතො — විජ්ජා — විමුච්චනතො — විමුත්ති ෴

සුත්තන්ත මාතිකා නික්ඛෙපනානි සමත්තානි.

විස්තර සහිත

# අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය

ධර්මදානය පිණිස යි.